# බිම් මට්ටමේ සාමය සහ
# සංහිඳියා ක්‍රියාකාරිකයන්ගේ හැකියා වර්ධනය කිරීම
# සඳහා වන පුහුණු මොඩියුලය

Institute of Social Development

පුහුණු මොඩියුලය : බිම් මට්ටමේ සාමය සහ සංහිඳියා ක්‍රියාකාරිකයන්ගේ හැකියා වර්ධනය කිරීම
ප්‍රකාශන හිමිකම : සමාජ සංවර්ධන ආයතනය, මහනුවර.
නොවැම්බර් 2021

ප්‍රකාශය :

සමාජ සංවර්ධන ආයතනය - ISD
246/4 රණවන පාර,
කටුගස්තොට 20800, ශ්‍රී ලංකාව

සකස් කළේ :

ආචාර්ය ආර්. රමේෂ්
ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය
දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

මොඩියුල සැලසුම :

එස්. විතුර්ෂාන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ශිෂ්‍යයෙකි.

ඡායාරූප උපුටා ගැනීම :
අන්තර්ජාලයෙනි.

මුද්‍රණය :
www.printsrilanka.com

kandyisd@sltnet.lk
+94 81- 2071288
http://www.isdkandy.org
https://www.facebook.com/ISD91

# පෙරවදනය

2015 වසරේ සිටම සමාජ සංවර්ධන ආයතනය (අයිඑස්ඩී) විසින් අඛණ්ඩ දැනුවත් කිරීමේ අධ්‍යාපනයක් සහ ධාරිතා වර්ධන පුහුණුව තුළින් රට පුරා බිම් මට්ටමේ සාමය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ හැකියාවන් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කර ඇත. දශක තුනක ජනවාර්ගික ගැටුමක් හේතුවෙන් වාර්ගික වශයෙන් ධ්‍රැවීකරණය වූ ප්‍රජාවන් සිටින ශ්‍රී ලංකාව වැනි රටක සංහිඳියාව, සාමය ඇති කිරීම තීරණාත්මක ය. සමාජ සංවර්ධන ආයතනයේ මෙම ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික්ක (25) ක් ආවරණය වන පරිදි සම්පත්දායකයින් ලෙස ක්‍රියාකාරීන්, විද්වතුන්, නීති වෘත්තිකයින්ගේ සහයෝගය ඇතිව ප්‍රාදේශීය ප්‍රජාවන්ගෙන් සමන්විත වන ධාරිතා වර්ධන වැඩමුළු සහ සාකච්ඡා පවත්වනු ලබයි. මෙම වැඩසටහන් මාලාව තුළින් සමාජ සංවර්ධන ආයතනය විසින් පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, බහුත්වවාදය, සංහිඳියාව සහ සහජීවනය, වගවීම සහ ගැටුම් නිරාකරණය වැනි ක්ෂේත්‍රයන්හි උපදෙස් හා දැනුම ලබා දී දැනුවත් කිරීමෙන් ප්‍රාදේශීය සාම ප්‍රවර්ධකයින් ඇති කිරීමට අදහස් කරයි.

ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් සාමය ප්‍රවර්ධනය කරන්නන්ට මෙන්ම සිවිල් සංවිධානයන්ටද භාවිත කළ හැකි ප්‍රායෝගික අදහස් සහිත පුහුණු මොඩියුලයක් සකස් කරන ලෙස අපි අදාළ සම්පත්දායකයින්ගෙන් ඉල්ලා සිටියෙමු. මෙම පුහුණු මොඩියුලය, මූලික දැනුම ලබා දීම සහ වැඩමුළු වලදී සහභාගිවන්නන් සමග සාකච්ඡා කිරීමේ අරමුණින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ ආචාර්ය ආර්. රමේෂ් විසින් සකස් කර ඇත.

ලංකාවේ බහුවිධ ජනවාර්ගික ප්‍රජාවන්ට බියෙන් හා සැකයෙන් තොරව එකට ජීවත් විය හැකි තිරසර සාමය, වඩාත් හොඳ සහ සාමකාමී සමාජයක් ප්‍රවර්ධනය කිරීමට කැමති ඕනෑම පාර්ශවයකට සහ පුද්ගලයින්ට මෙම මාර්ගෝපදේශන මොඩියුලය භාවිත කළ හැකි යැයි මම තරයේ විශ්වාස කරමි. ලංකාවේ පශ්චාත් යුද සන්දර්භය තුළ බහුත්වවාදය, සහජීවනය සහ විවිධත්වයේ ඒකීයභාවය ආරක්ෂා කිරීම සහ පොහොසත් කිරීම සඳහා සමාජ සංවර්ධන ආයතනය කැපවී සිටී.

අවසාන වශයෙන්, සමාජ සංවර්ධන ආයතනයෙහි දේශීය හවුල්කරුවන් සහ සාම ප්‍රවර්ධකයන් වශයෙන් “දේශීය ධාරිතා ව්‍යාපෘතිය ගොඩනැගීම” සඳහා සහභාගී වන ආචාර්ය, ආර්. රමේෂ්, ව්‍යාපෘති කළමනාකරු, එම්. කාර්තිගෙයිනාදන් මහතා සහ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මම ස්තූති කරමි.


**පී. මුතුලිංගම්**
විධායක අධ්‍යක්ෂක
සමාජ සංවර්ධන ආයතනය,
මහනුවර.

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| 1. | යහපාලනය සඳහා වූ පුහුණු මොඩියුලය | 03 |
| 2. | ප්‍රජාතන්ත්‍රවාදය | 17 |
| 3. | වගවීම | 29 |
| 4. | ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පාලනය | 39 |
| 5. | සත්‍ය හා ප්‍රතිසංධානගතවීම | 53 |
| 6. | බහුත්වවාදය හා ගැටුම් නිරාකරණය | 67 |

පළමු මොඩියුලය

# යහපාලනය සඳහා වූ පුහුණු මොඩියුලය



# යහපාලනය

## හැඳින්වීම

යහපාලනය යනු ලඟාකර ගැනීමට අසීරු පරමාදර්ශයක් වන අතර ආසන්න වශයෙන් පරිපූර්ණ වශයෙන් අත් පත් කර ගැනීමට හැකි වී ඇති රටවල්, සමාජයන් හා ආයතන ඇත්තේ ඉතාම ස්වල්පයකි. කෙසේ නමුත් තිරසර මානව සංවර්ධනය, සාමය හා සමාජ ඒකාබද්ධතාතාවය සහතික කිරීමට මෙම පරමාදර්ශය ක්‍රියාත්මකවීමට වැඩ කටයුතු කළ යුතුය. මෙම අත්පොත සකස් කරනු ලබන්නේ ලංකාවේ දිස්ත්‍රික්ක 25 ක සාමය ගොඩනැංවීම, සංහිඳියාව, සමාජ ඒකාබද්ධතාවය හා සහෝදරත්වය ගොඩ නැංවීම සඳහා සම්බන්ධ වී සිටින සත්‍ය හා සංහිඳියා (Truth and Reconciliation) සාමාජිකයන්ට යහපාලනය සඳහා වන පුහුණුව ලබා දීම සඳහා ය.

## මෙම මොඩියුලය පහත ක්ෂේත්‍ර ආවරණය කරනු ලබයි

| | |
|---|---|
| 01 | පාලනය හා යහපාලනය සම්බන්ධව කෙටියෙන් පැහැදිලි කිරීම |
| 02 | යහපාලනය සඳහා පාදක වූ මූලධර්ම පැහැදිලි කිරීම |
| 03 | යහපාලනයෙහි ශක්තියෙන් ආවර්ජනය කිරීම සම්බන්ධ විස්තර කිරීම |
| 04 | යහපාලනය, නායකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීම |
| 05 | විමධ්‍යගතකරණය හා යහපාලනය අතර සම්බන්ධතාවය සාකච්ඡා කිරීම |
| 06 | මානව හිමිකම් හා යහපාලනය අතර සම්බන්ධතාවය සාකච්ඡා කිරීම |

මෙම පුහුණුව අවසානයේ දී පුහුණුව සඳහා සහභාගි වන්නන්ට යහපාලනය යනු කුමක්ද? යහපාලනය වැදගත්වන්නේ ඇයි? සමාජයේ විවිධ අංශයන් සඳහා යහපාලන සංකල්පයක් යෙදවීම සිදු කරන්නේ කෙසේද? හා සාමය හා තිරසාර සංවර්ධනය සඳහා සංහිඳියාව අත්පත් කර ගැනීම සඳහා යහපාලනය අනුග්‍රහය දක්වන්නේ කෙසේද? යන්න මෙන්ම දේශීය වශයෙන් සංවාදයක් ඇති වීම සිදුවේ. එසේම මෙම පුහුණුව සඳහා සහභාගීවන්නට ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා යහපාලනය මානව අයිතිවාසිකම් හා යහපාලනය අතර සම්බන්ධතාවයක් ගොඩනගා ගත හැකිය.

## පාලනය යනු කුමක්ද? එය යහපත් ද? අයහපත් ද?



සාමාන්‍යයෙන් ගත් කල යහපාලනය යනු නව සංකල්පයක් නොවේ. එසේම එය තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ලෙස නිර්වචනය කරනු ලබයි. තවද කුමන තීරණ ක්‍රියාත්මක කරන්නේද? නැද්ද? යන්න තීරණය ගනු ලබන ක්‍රියාවලියක් ලෙස ද මෙය නිර්වචනය කරයි. යහපාලනය තවදුරටත් ආණ්ඩුව සිවිල් සමාජය හා පෞද්ගලික අංශය සමග අන්තර් ක්‍රියාකාරකම් සිදු කිරීම හරහා සමාජයේ සමාජ, දේශපාලනික හා ආර්ථික ප්‍රගතිය කළමනාකරණය කරන වටිනාකම් සමූහයක් සහිත ආයතනයක් ලෙස ද නිර්වචනය කළ හැකිය. පාලනය යනු තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ තීරණ ක්‍රියාත්මක කරන ක්‍රියාවලිය වන බැවින්, පාලන විශ්ලේෂණයක් මගින් තීරණ ගැනීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියැලී සිටින විධිමත් හා අවිධිමත් ක්‍රියාකාරීන්, ගනු ලැබූ තීරණ සහ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර ඇති විධිමත් හා අවිධිමත් ව්‍යුහයන් කෙරෙහි අවධානය යොමු කෙරේ. රජය යනු පාලනයේ එක් ක්‍රියාකාරිකයෙකු පමණි. සිවිල් සමාජය සහ වෙළඳපොළ යනු පාලනයේ තවත් ප්‍රබල අංග දෙකකි.

## යහපාලනය යනු කුමක්ද ?




පාලනය යනු පාලනයේ සියලු ක්‍රියාදාමයන්, පොදු අවධානය යොමු කළ යුතු කරුණු තීරණය කොට නියාමනය කරනු ලබන ආයතන, ක්‍රියාවලි සහ භාවිතයන් ය. යහපාලනය විසින් පාලනය කිරීමේ ක්‍රියාවලියට ප්‍රමිතිගත හෝ ඇගයීමේ ලක්ෂණයක් එක් කරයි. මානව හිමිකම් දෘෂ්ටි කෝණයකින් එය මූලික වශයෙන් සඳහන් කරන්නේ රාජ්‍ය ආයතන පොදු කටයුතු සිදු කිරීම, මහජන සම්පත් කළමනාකරණය කිරීම සහ මානව හිමිකම් සාක්ෂාත් කර ගැනීම සහතික කරන ක්‍රියාවලිය යි.

අන්තර්ජාතික වශයෙන් එකඟ වූ නිර්වචනයක් යහපාලනය සඳහා නොමැති වුවත් එය පහත සඳහන් මාතෘකා ඔස්සේ ද ව්‍යාප්ත වීමක් සිදු වේ. එනම් මනව අයිතිවාසිකම් සඳහා පූර්ණ ලෙස ගරු කිරීම, නීතියේ පාලනය, ඵලදායී

සහභාගිත්වය බහු ක්‍රියාකාරීක සහභාගිත්වය, දේශපාලන අධිකාරිවාදය, අධිපතිවාදය, විනිවිදභාවය හා වගවීමේ ක්‍රියාවලිය, හා වගවීමේ ආයතන, ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය අංශයක් සුජාතභාවය, දැනුම ලබා ගැනීමට ඇති හැකියාව තොරතුරු හා අධ්‍යාපනය ලබා ගැනීමට ඇති හැකියාව, මිනිසුනගේ දේශපාලනික බලසතුකරණය, නිසිතැන, තිරසාරත්වය හා වගවීම සඳහා බලපවත්වන ආකල්ප හා වටිනාකම් සහයෝගීතාවය හා ඉවසීම.

සාරාංශ වශයෙන් යහපාලනය දේශපාලනික හා ආයතන ක්‍රියාවලිය හා සම්බන්ධ වන අතර එහි ප්‍රතිඵලයන් සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දිශාගත වූවක් ලෙස සඳහන් කළ හැකිය. යහපාලනයේ සත්‍ය පරීක්ෂණය යනු මානව හිමිකම් ගිවිසුමක් මත පවත්වන තත්ත්වයක් ලෙස හඳුනාගත හැකිය. එනම් එය සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික හා සමාජ අයිතීන් සියල්ල අයත්වන තත්වයකි. මෙහි දී මතුවන ප්‍රධාන ප්‍රශ්නය නම් පාලනානුශාසනයේ ආයතනයන් ඵලදායී ලෙස සෞඛ්‍යට ඇති අයිතිය, ප්‍රමාණවත් නිවාස, ප්‍රමාණවත් ආහාර, ගුණාත්මක අධ්‍යාපනය, සාධාරණය හා යුක්තිය සහ පුද්ගල ආරක්ෂාව සහතික කරන්නේද යන්නයි.

## යහපාලනයේ ප්‍රධාන මූලධර්ම




මෙය දූෂණය අවම කිරීම සහතික කරන අතර සුළුතරයන්ගේ හා ආන්තීකරණයට ලක් වූවන්ගේ දැක්ම අවධානයට ගනු ලබන අතර සමාජයේ වඩාත් අවදානම් සහගත තත්ත්වයේ සිටින ප්‍රජාවගේ හඬට තීරණ ගැනීමේදී ඇහුම්කන් දෙනු ලබයි. එය වර්තමාන හා අනාගත සමාජයට වග කියයි.

## සහභාගිත්වය



කාන්තාවන්ගේ හා පුරුෂයන්ගේ සහභාගිත්වය පාලනයේදී ප්‍රධාන සාධකයක් බවට පත්වේ. මෙම සහභාගිත්වය ඇතැම්විට සෘජු වන අතර නොඑසේනම් සුජාතමය අන්තර් මාධ්‍ය ආයතනික වශයෙන් හෝ නියෝජිතයන් සිදුවිය හැකිය. සමාජයේ ජීවත්වන වඩාත් අවදානම් සහගත ප්‍රජාව තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී අවධානයට ගත යුතුය යන්න නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය යන්නෙන් අනිවාර්යෙන්ම අර්ථ නොදක්වයි. සහභාගිත්වය සහතික කිරීම හා සංවිධානාත්මක බව සහතික කළ යුතුය යන්න එහි අර්ථය වේ. මෙහි අර්ථය වන්නේ එක්ව කටයුතු කිරීමට ඇති නිදහස හා එක් අතකින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මෙන්ම අනෙක් අතින් සිවිල් සංවිධානයන් ලෙස සංවිධානය වීමට ඇති නිදහසයි. වඩාත් ගැඹුරු අර්ථයෙන් සහභාගිත්වය යන්නෙන් අර්ථ දක්වනු ලබන්නේ නිසි පුද්ගලයින් එනම් ආන්තීකරණයට ලක් වූවන් සුළුතර සමූහයන් හා/හෝ ආයතන තීරණ ගැනීමට සහභාගී වීම මිස මේ වන විටත් ගන්නා ලද තීරණයක් මෙකී පාර්ශවයන්ට දැනුම් දීම පමණක් නොවේ. එසේම සහභාගිත්වය කාර්යයන් සඳහා සම්බන්ධිත පාර්ශවකරුවන් අතර විශ්වාසයක් ගොඩ නංවන අතර එකී විශ්වාසය ගොඩනංවනු ලබන්නේ සමාජ සහජීවනය හා අන්‍යෝන්‍ය තේරුම් ගැනීම මගිනි.

## නීතියේ පාලනය




අපක්ෂපාතිත්වයට බලපෑම් කරනු ලබන සාධාරණ නීතිමය රාමුවක් යහපාලනය සඳහා අවශ්‍ය වේ. එය සම්පූර්ණ ලෙසම මානව අයිතිවාසිකම් ආරක්ෂා කරන ලබන්නක් විය යුතු අතර විශේෂයෙන්ම සුළුතර ප්‍රජාවන් එහිදී ප්‍රධාන වේ. එසේම අපක්ෂපාතීව නීතිය බලාත්මක කිරීමේ නිදහස අධිකරණ පද්ධතියක් සඳහා අත්‍යාවශ්‍ය වේ. එසේ ම අපක්ෂපාතී හා අදූෂිත පොලිස් බලකායක් ද අවශ්‍ය ය. නීතිය ඉදිරියේ සමානාත්මතාවය යන්න යුක්තිය සඳහා සමානාත්මතාවය, සාධාරණත්වය හෝ ඇහුම්කන් දීම, සේවා සඳහා සමාන හිමිකමක් හා ඇතුළත් වීමක් හා යම් රටක ජීවත්වන පුරවැසියන්ට එහි කුමන ස්ථානයක ජීවත් වුවත් අයිතීන් හිමි පුද්ගලයෙකු ලෙස දැනීම ද ප්‍රමුඛ සාධකයක් වේ.

## විනිවිදභාවය




විනිවිදභාවය යනු ගන්නා ලද තීරණයන් හා ඒවායේ බලාත්මකකරණය නීතීන් හා ක්‍රියාපටිපාටීන්ට අනුව ගත යුතු බවයි. එම තීරණයන් බලාත්මක කිරීම්වලදී බලපෑම්වන පුද්ගලයන් සඳහා ඊට අදාල තොරතුරු නිදහසේ හා සෘජුව ලබාගැනීමට හැකිවීම ද අර්ථ ගන්වනු ලබයි. තව ද ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීම හා එසේ ඉදිරිපත් කරන ලද තොරතුරු තේරුම් ගැනීමට හැකිවීම ද මෙමගින් අර්ථවත් වේ. එසේම නීති හා පටිපාටීන්ට අනුව තීරණ ගැනීම හා තීරණ ගැනීමට බල කිරීම ද අදාළ වේ.

## ප්‍රතිචාර දැක්වීම්

යහපාලනය සඳහා දෙන ලද සාධාරණ කාල රාමුවක් තුළ ආයතන හා ක්‍රියාවලිය සියලු පාර්ශ්ව කරුවන්ට සමානව සැලකිය යුතුය. පුරවැසියන්ට තම රජයන් විසින් තමන්ගේ අවශ්‍යතාවයන්ට හා තමන් නගන හඬට ඉතා හොඳ ප්‍රතිචාර දක්වන බව දැනිය යුතුය. මෙම තත්ත්වය විශේෂයෙන්ම සුළුතර ජනවාර්ගික ප්‍රජාවන්ට, ආන්තික හා අවදානම්සහගත ප්‍රජාවන්ට විශේෂයෙන් වැදගත් වේ.

## බහුත්ව මතයට එකඟවීම




යම් දෙන ලද සමාජයක විවිධ වූ ක්‍රියාකාරිකයන් සිටින අතර ඔවුන්ගේ දෘෂ්ටීන් ද විවිධ වේ. බහු මතයට එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා සමාජයේ විවිධ වූ අභිලාශයන්ගේ මැදිහත්කරණය යහපාලනයට අවශ්‍ය වන අතර එහිදී සමස්ත සමාජයට වඩාත් ගැළපෙන අභිලාශයන් මොනවාද? එය ළඟා කර ගත හැක්කේ කෙසේද යන්න සලකා බැලිය යුතුය. එසේම තිරසර මානව සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් මොනවාද හා එවැනි සංවර්ධන ඉලක්කයන් සාධනය කරගත හැක්කේ කෙසේද යන්න පුළුල් හා දිගුකාලීන දැක්මක් අවශ්‍ය වේ. මෙය කළ හැකි වන්නේ දෙන ලද සමාජයේ හෝ ප්‍රජාවගේ ඓතිහාසික සංස්කෘතික හා සමාජ සන්දර්භය තේරුම් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

## නිසි තැන ලබාදීම හා ඇතුළත් කර ගැනීම


යම් සමාජයක යහපැවැත්ම තීරණය වන්නේ එකී සමාජයේ ජීවත්වන සියලු දෙනාට තමන් එකී සමාජයේ කොටස්කරුවන් ලෙස මෙන්ම එම සමාජයෙන් බැහැර නොවන බවට තහවුරු වීම මතය. මෙම තත්ත්වය සියලු කණ්ඩායම් වලට අදාල වන අතර කෙසේ නමුත් විශේෂයෙන්ම වඩාත් අවදානම් සහගතබව සහිත පුද්ගලයන්ට මෙය වැදගත් වේ. මෙමඟින් සියලු කණ්ඩායම් සඳහා ඔවුන්ගේ යහපැවැත්ම වර්ධනය කිරීම සඳහා අවස්ථාවක් සැපයේ. තවද මේ සඳහා රාජ්‍ය වසම තුළ මානව අයිතීන්ට ගරු කරනු ලැබීම, ආරක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙන්ම ඕනෑම මට්ටමක වෙන්කොට සැළකීම් සමඟ සටන් කිරීම ද අයත් වේ. සංස්කෘතික ගතිකත්වයන්ට අනුව සියළුදෙනා එකී සමාජයේ වත්කමක් ලෙස සලකනු ලබයි. එසේම මෙහිදී සියලු දේශීය ප්‍රජාවන් සමස්තයේ පාර්ශවකරුවන් ලෙස සහතික කර ගැනීමටද නොනවතින උත්සාහයක් දරනු ලබයි. ඒ අනුව සියලු දෙනා එකී සමාජයේ කොටසක් ලෙස හඳුනා ගන්නා අතර කිසිවකුට තමන් බැහැර කරන බවක් නොහැඟේ. මෙහිදී සමාජ ඒකාබද්ධතාවය හා අනුකලනය යන අංශයන් ව්‍යාප්ත කිරීම හා ප්‍රචාරණය කිරීම ද කරනු ලබයි.



අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා ඇතුළත් වීම සහතික කිරීම කරයි. විශේෂයෙන්ම මෙහිදී ජනගහනයෙන් වඩාත් අවාසි සහගත තත්වයන් සහිත ප්‍රජාවන් ප්‍රධාන වේ. එසේම විවිධ නීත්‍යානුකූල අවශ්‍යතාවලට මැදිහත් වීමට සහ සමස්ත ප්‍රජාවගේ යහපතට හේතුවන දේ සහ එකී කාරණා සාක්ෂාත් කරගතහැකි ආකාරය පිළිබඳ පුළුල් එකඟතාවකට පැමිණීමට සෑම විටම අවංක උත්සාහයක් ද ඇත. මෙහි දී බොහෝ දෙනාගේ අභිමතය පරිදි තීරණ ගනු ලබන අතර ස්වල්පයනගේ අයිතිවාසිකම් සහ නීත්‍යානුකූල අවශ්‍යතාවන්ට ද ගරු කරනු ලැබේ.

## ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය

ඵලදායීතාවය යනුවෙන් අර්ථ දක්වනු ලබන්නේ පවත්නා සම්පත් උපරිම භාවිතයෙන් සමාජයේ අවශ්‍යතාවයන් ඉටු කරනු ලබන ආයතනික හා ක්‍රියාකාරකම් හි නිෂ්පාදිත ප්‍රතිඵලයකි. යහපාලනය සන්දර්භය තුළ කාර්යක්ෂමතාවය යන්නෙන් ස්වභාවික සම්පත් තිරසර භාවිතය හා පරිසරය සුරැකීම යන්න ද අවධාරණය කරනු ලබයි.




## වගවීම




වගවීමයන්න යහපාලනයේ ප්‍රධාන අවශ්‍යතාවයකි. රාජ්‍ය අංශයේ ආයතන පමණක් නොව පෞද්ගලික අංශයේ ආයතන මෙන්ම සිවිල් සමාජ සංවිධාන ද සිය පාර්ශවකරුවන්ට හා මහජනතාවට වගවිය යුතුය. කවුරුන් විසින් කා සඳහා වගවීම සිදුකළ යුතුද යන්න විවිධ වනුයේ තීරණය හෝ ක්‍රියාව ආයතනයක , සංවිධානයක, බාහිර හෝ අභ්‍යන්තරය මඟින් ගනු ලබන්නේ ද යන්න මත ය. සාමාන්‍ය අර්ථයෙන් ගත් කළ ආයතනයක් හෝ සංවිධානයක් සිය තීරණ මගින් හෝ ක්‍රියාකාරකම් මඟින් බලපෑමට ලක්වන්නන්ට වගවීම සිදුවේ. විනිවිදභාවයකින් තොරව හෝ නීතියේ පාලනය අනුගමනය කිරීමෙන් තොරව වගවීම සහතික කළ නොහැකිය. එසේම වගවීමට බලපෑම් කළ නොහැකිය.

## නිදහස් හා සාධාරණ මැතිවරණයක් හා සහභාගීත්වය

දේශීය මැතිවරණ, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව, දේශීය නීතින්ට අනුකූලව, කිසිදු වංචාවකින් තොරව නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීම අපේක්ෂා කරනු ලබයි. රාජ්‍ය කටයුතුවලදී පුරවැසියන් කේන්ද්‍ර වේ. සෑම කාන්තාවකට හා පුරුෂයෙකුට තීරණ ගැනීමේදී ඔවුන්ගේ හඬක් තිබෙන අතර එය සෘජුව හෝ ඔවුන්ගේ ආශාවන්



නියෝජනය කරනු ලබන සුජාතමය අන්තර් මාධ්‍ය ආයතන ඔස්සේ ද නියෝජනය විය හැකිය. එවැනි පුළුල් සහභාගිත්වයක් ගොඩනංවනුයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, එක්රැස්වීම හා සමාගමට ඇති නිදහස මතය. අවවරප්‍රසාදිත ප්‍රජා කණ්ඩායම්හි හා වඩාත් අවදානම් සහගත ප්‍රජාවන්හි හඬ ඇතුළත් වූ සියලු හඬ තීරණ ගැනීමේදී අවධානයට ගත යුතු අතර එසේ ම සම්පත් බෙදාහැරීමේ දී ද මෙම තත්ත්වය සැලකිල්ලට ගත් යුතුය.

## නායකත්වය හා යහපාලනය



යහපාලනය සඳහා නායකත්වයේ විවිධ ශෛලීන්හි වැදගත් කම හඳුනාගන්නා අතර නායකයෙකුගේ ගුණාංග කිහිපයක් සඳහන් කරයි. නායකත්වය හා යහපාලනය අතර ඉතා සමීප සබඳතාවයක් පවතියි. යහපත් නායකයකු: ගරුකටයුතු විය යුතුය, දැක්මක් සහිත විය යුතුය, ඉවසිලිවන්ත විය යුතුය, විවෘත හා උපකාරාත්මක විය යුතුය, විනිවිද භාවයකින් යුක්ත විය යුතුය, චර්යාව සම්බන්ධ වගකීම් සහගත විය යුතුය, විශේෂඥතාවයක් සහිත විය යුතුය, සහයෝගී වියයුතුය, කැපකිරීම් සිදු කළ හැකි විය යුතුය, සාධාරණ හා අපක්ෂපාතී විය යුතුය, සහනුභූති හා සහකම්පනයකින් යුක්ත විය යුතුය, වැරදි පිළිගැනීමට හැකියාවක් තිබිය යුතුය, නම්‍යශීලී විය යුතුය. මෙවැනි නායකත්ව ගතිලක්ෂණයන් සහිත නායකයන් ප්‍රජාව විසින් අනුමත කරයි. ඔබ විසින් ඉහත කී ලක්ෂණ සහිත නායකයින් ප්‍රජාවෙන් තෝරාපත් කරගතයුතු අතර එසේ වන විට එකී නායකයන්ට ඔබගේ ප්‍රජාවේ කටයුතු වඩාත් ඵලදායීව ඉටු කළ හැකිය. කෙසේ වුවද යථාර්ථවත් ජීවන තත්ත්වයක් තුළ ආවේණික ලක්ෂණයන් සහිත ප්‍රභේද දෙකක නායකත්වයන් දැකිය හැකිය.

**ඒකාධිපති නායකත්වය :**

මෙම නායකයින් ඉතා ඍජුය, සැමට ඉහළින් වැජඹෙනු දැකිය හැකිය, නොයිවසිලිවන්තය, ඉතා ඉක්මණින් කේන්ති ගනු ලබයි, සමීප විය නොහැකිය, අවිනීත හා රළු පුද්ගලයින් වේ.

**ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය :**

පොදු සහභාගිත්වයක් සහිත , විශේෂඥතාවයක් සහිත , සැලකිලිමත්, ළඟාවිය හැකි, ප්‍රතිචාරාත්මක, ගරු කටයුතු , විනීත හා කැපකිරීම් සහිත පුද්ගලයන් මෙම නායකත්ව ගණයට අයත් වේ.

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා යහපාලනය

*රාජ්‍ය නිලධාරිනියක්/නිලධාරියෙක් එක් ගමක ක්ෂේත්‍ර චාරිකාවක නියැලි අතර එහිදී එම ප්‍රජාවේ ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනාගන්නා ලද ප්‍රජා පුස්තකාලයක් ස්ථාපිත කිරීමේ අභිලාශය ඇතිව සියලු ප්‍රජාවන් මුණගැසී සාකච්ඡාවක් පැවැත්වීය. අනතුරුව ඇය/ඔහු සංවර්ධන කමිටුවක් පත් කළ අතර සියලු දෙනාටම යම් කාර්යභාරයක් ලබා දීම සිදු කරනු ලැබීය. එකී කාර්යභාරය අවසාන කිරීමට නියමිත දිනයක්ද තීරණය කර ලබා දුණි. එසේ කිරීමෙන් පසු ඔහු/ඇය පිටව ගොස් නැවත එම ප්‍රජාව වෙත මසකට පසුව ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය හා ක්‍රියාකාරකම්හි සාර්ථකත්වය පිළිබඳ සොයා බැලීමට පැමිණියේය. කිසිදු දෙයක් සිදු වී නොතිබීම නිසාවෙන් ඇය වඩාත් කම්පනයට පත් වූ අතර කලකිරීමට ද පත් විය*

## මෙම කතාන්දරය පිළිබඳව සිතන්න

- සහභාගීත්වය යනු කුමක්ද?
- සහභාගිත්වය වැදගත් වන්නේ ඇයි ?
- යහපාලනයේ දී ජනතාවගේ සහභාගීත්වය වැඩි දියුණු කළ හැක්කේ කෙසේද?
- යහපාලනයේ දී ජනතා සහභාගිත්වයට බාධා කරනු ලබන ප්‍රධාන කාරණා මොනවාද?

සහභාගිත්වය යනු ක්‍රියාකාරීත්වය හා වෙනස්කම් කිරීම පිළිබඳ පොදු එකඟතාවක් ලබාගැනීම සඳහා ඒකාබද්ධ සංවාද, තත්ත්වයන් බෙදාගැනීම හා ඉගෙනීමේ ක්‍රියාවලියකි. සහභාගිත්වය යනු සංවර්ධන ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ප්‍රජාවට බලපෑම් කරනු ලබන ක්‍රියාකාරී ක්‍රියාවලියකි. තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පුද්ගලයින් සම්බන්ධ කර ගැනීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභ හා පිරිවැය බෙදා ගැනීම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඇගයීමට සහභාගි වීම ආදිය ද සහභාගිත්වයට ඇතුළත් වේ.

**ප්‍රජා සහභාගිත්වයට බාධාවන සාධක කිහිපයක් වේ.**

ප්‍රජාවේ සාමාජිකයින් යම් ක්‍රියාකාරකමක දී එම ක්‍රියාකාරකම්හි සෑම අදියරකදීම සම්බන්ධ නොවීම, ප්‍රජාව තුළ සංස්කෘතික ගැටුම්, දුර්වල නායකත්වය, දේශපාලන මැදිහත්වීම්, සාක්ෂරතාවය මත නොසලකා හැරීම්, කැපවීම් නොමැතිකම, කාන්තාවන් තරුණයින් හා ආබාධිත පුද්ගලයින් සමග බැඳී පවත්නා ඒකාකෘතිමය තත්වයන්.

## ඔබගේ ප්‍රජාව සම්බන්ධව මදක් සිතන්න

- ඔබගේ වැඩසටහන් තුළ කාන්තාවන් හා තරුණයින් ශාරීරික වශයෙන් අභියෝගයට ලක්වන්නේ කෙසේ ද?
- ප්‍රාදේශීය වශයෙන් යම් ක්‍රියාකාරකමකට මුල පිරීමේදී හෝ හඳුන්වාදීමේ දී මෙම කණ්ඩායම්වල සහභාගිත්වය කෙතෙක් දුරට සිදු වේද?
- ඔබගේ සංවිධානයේ ක්‍රියාකාරකම් සඳහා මෙම පුද්ගල කණ්ඩායම් සම්බන්ධ කරගනු ලබන්නේ කෙසේද?
- මෙම කණ්ඩායම් එකී ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ කර ගැනීමේ වැදගත්කම කුමක්ද?

යහපාලනය ප්‍රායෝගිකව ක්‍රියාත්මක  කිරීමේදී ප්‍රජාවන් ඊට ඇතුළත් කර ගැනීම ඉතා වැදගත් ය.

## එසේ වැදගත් වන්නේ

- 01 ප්‍රජාතන්ත්‍රවාදය හා දායකත්වය වැඩිකිරීමට
- 02 යහපත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සඳහා දායකත්වයක් ඇති කිරීමට
- 03 වගවීමට හා විනිවිදභාවයට බලපෑම් කිරීමට
- 04 ප්‍රතිලාභීන් බලසතුකරණය හා දායක කරගැනීමට
- 05 නීතිය බලාත්මක කිරීමට
- 06 සියලුම ආකාරයේ කණ්ඩායම් ඒකරාශී කිරීම හා ඔවුන්ගේ සියලු අදහස් වලට ඇහුම්කන් දීමට

## කණ්ඩායම් ඒකරාශී කිරීම හා ඔවුන්ගේ සියලු අදහස් වලට ඇහුම්කන් දීම.

ඔබ ඔබේ ප්‍රජාව/ඉලක්ක කණ්ඩායම් සමඟ සහ ප්‍රාදේශීය පාර්ශවකරුවන් සමඟ සබඳතා වර්ධනය කර ගත යුතුය. වඩා හොඳ සබඳතා ප්‍රජා මට්ටමින් ඔබේ කාර්යයේ කීර්තිය සහ බලපෑම වැඩිදියුණු කරනු ඇත. සිවිල් සමාජ සංවිධාන වලට විශ්වසනීයත්වය තහවුරු කළ හැක්කේ:

- ඔබේ ඉල්ලීම් තබාගැනීම / මධ්‍යස්ථව කතා කිරීම මඟින්
- ඔබේ ප්‍රජාවේ පාර්ශ්වකරුවන්ට පහර දෙනවාට වඩා, විවිධ ගැටුම්කාරී නොවන උපදේශන උපාය මාර්ග භාවිතා කිරීම මඟින්
- ඔවුන්ගේ ප්‍රජාව හරහා සියලුම විවිධ කණ්ඩායම් එකට ගෙන ඒම සහ සියලු අදහස් ඇසීම මඟින්
- සමාජය තුළ එහි කාර්යභාරය අවබෝධ කර ගැනීම මඟින්
- ඔවුන්ගේ කාර්යභාරය ඉටුකිරීම ඔබගේ ප්‍රතිලාභීන් වෙනුවෙන් කැපවීම, මසකට වරක්වත් එකිනෙකා මුණ ගැසීම, වගවීමේ ක්‍රියාවලිය හා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම, රැස්වීම් පිළිබඳ වාර්තා තබා ගැනීම, එය ප්‍රසිද්ධ කිරීම, ප්‍රජාව හා පාර්ශවකරුවන්ට ප්‍රතිපෝෂණ හා තොරතුරු ලබාදීම, මහජනතාවට ඔබගේ මූල්‍යමය වාර්තාවන් විවෘත කිරීම මඟින්

## විමධ්‍යගතකරණය හා යහපාලනය

විමධ්‍යගතකරණය ලෝකය පුරා යහපාලනය සඳහා වූ මෙවලමක් ලෙස සලකනු ලබන අතර එමගින් ජනතාවට පාලන ක්‍රියාවලියට සහභාගී වීමට හැකියාවක් ලැබේ. ඉතා වැදගත් ලෙස එය ප්‍රාදේශීය ප්‍රජාවන්ට, රාජ්‍ය ආයතන සඳහා පහසුවෙන් ඇතුලත් වීමට හා විවිධ සේවාවන් හා ප්‍රතිලාභ සඳහා ඇතුළත් විමට උපකාරී වේ. මධ්‍යගත වූ ක්‍රමයක් යටතේ දිස්ත්‍රික්ක හා පළාත් මට්ටමේ දෙපාර්තමේන්තු

ප්‍රධානීන් මධ්‍යම ආණ්ඩුවේ ම දිගුවක් වේ. ඔවුනට මධ්‍යම රජයේ ආයතන කාර්යාලවල විශේෂඥතාවයෙන් තොරව නිදහසේ ක්‍රියාත්මක වීමටද බලයක් හෝ අධිකාරීමයභාවයක් නොමැත. සාමාන්‍ය පුරවැසියන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඉතා කලාතුරකින් සහභාගී වන අතර එම නිසා ඔවුන් තම ජීවිතයේ මුහුණ දෙනු ලබන ගැටලු සම්බන්ධව ඉතා අඩු උපදේශනයක් පවතී.

## මධ්‍යගත බලය හා සම්බන්ධ ගැටලුන්ට බොහෝ විට අයත් වනුයේ

- දුර්වල සේවා සැපයීම (දූෂණය, වැරදි කළමනාකරණය හා ආන්තීකරණය)
- විනිවිදභාවය අඩුවීම (බදු මුදල්වලට සිදුවන්නේ කුමක්දැයි ප්‍රජාවේ කිසිවෙකු නොදැන සිටීම)
- අඩු වගවීම/නිසි ලෙස වගවීමේ තත්වයක් නොමැති කම (සේවාවන් සපයන විට හෝ සම්පත් නිසි පරිදි භාවිත නොකිරීමෙන් කවුරුන් ඒ සඳහා වග විය යුතුද යන්න නොදැන සිටීම)
- සහභාගිත්වය නොමැතිකම/ අවම කම
- ප්‍රජා සාමාජිකයින් තම ප්‍රජාව සම්බන්ධ සංවර්ධනයේදී තීන්දු තීරණ ගැනීම සඳහා දායක කර නොගැනීම.

## බලය විමධ්‍යගත කිරීමේ වාසි

- සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම
- වගවීම වැඩි කිරීම හා දූෂණය අවම කිරීමට බලපෑම් කිරීමට
- සම්පත් බලමුලු ගැන්වීම තුළින් පිරිවැය අවම කරගැනීමට පහසුකම් සැලසීම
- ප්‍රාදේශීය ප්‍රජාවන් විසින් පාලනය කරනු ලබන සම්පත් කළමනාකරණය කිරීම
- යහපාලනය හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය ප්‍රජා දායකත්වය වැඩි කරගැනීම
- ප්‍රාදේශීය සම්පත් බලමුලු ගැන්වීම ඉහළ නැංවීම
- පුද්ගල හඳුනා ගැනීම් වැඩි කිරීම හා ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධ කර ගැනීම

## මානව හිමිකම් හා යහපාලනය සම්බන්ධ වන්නේ කෙසේද?

යහපාලනය හා මානව හිමිකම් එකිනෙකාට අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් කරනු ලබයි. මානව හිමිකම් ප්‍රමිතීන් සහ මූලධර්මයන් ආණ්ඩුවේ කටයුතු හා අනෙකුත් දේශපාලනික සමාජයීය ක්‍රියාකාරීන්ට සිය කටයුතු කිරීමේදී මඟ පෙන්වනු ලබයි. මානව හිමිකම් මඟින් මෙම ක්‍රියාකාරිකයන්ට වගවීමේ ක්‍රියාවලියට අවශ්‍ය වගවීමේ සාධන ප්‍රමිතින්ද සපයයි. තව ද මානව හිමිකම් මූලධර්මයන් යහපාලන ප්‍රයත්නයන්හි අන්තර්ගතය දෙනු ලබයි. ව්‍යවස්ථාදායක රාමු, ප්‍රතිපත්ති වැඩසටහන්, අයවැය වෙන් කිරීම් හා අනෙකුත් මිනුම් සංවර්ධනයට තොරතුරු සපයා දෙනු ලබයි.

අනෙක් අතට ගත් කළ යහපාලනයක් නොමැතිව මානව හිමිකම් තිරසර අර්ථයෙන් ගරු කිරීමට හෝ සුරැකීමට හැකියාවක් නොමැත. හිතකර හා සක්‍රිය පාරිසරික තත්ත්වයන් මත මානව හිමිකම් ක්‍රියාකාරීත්වය රඳා පවතී. මෙයට සුදුසු නෛතික රාමු සහ ආයතන මෙන්ම ජනතාවගේ අයිවාසිකම් මෙන්ම අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා වගවිය යුතු දේශපාලන, කලමනාකරණ හා පරිපාලන ක්‍රියාවලීන් ද ඇතුළත් වේ.

## යහපාලනය හා මානව හිමිකම් අතර සබඳතාවය ක්ෂේත්‍ර හතරක් ඔස්සේ හඳුනාගත හැකිය.

### 1. ප්‍රජාතන්ත්‍රවාදී ආයතන

ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්හි යහපාලන ප්‍රතිසංස්කරණයන් මානව හිමිකම් වටිනාකම්වලින් මෙහෙයවනු ලබන විට මහජනතාවට විධිමත් ආයතන මඟින් හෝ අවිධිමත් උපදේශනයන් මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට සහභාගිවීමට මාර්ග සකස් කරනු ලබයි. එසේම එමඟින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා විශේෂයෙන්ම ප්‍රාදේශීය වශයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට බහු සමාජ කණ්ඩායම් ඇතුලත් කිරීම සඳහා යාන්ත්‍රණයක් ද සකස් කරනු ලැබේ. අවසාන වශයෙන් එමගින් සිවිල් සමාජය හා ප්‍රාදේශීය ප්‍රජාවන්ට වැදගත් වන කාරණා සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ස්ථාවරව සකස් කිරීමට හා ප්‍රකාශ කිරීමට ඔවුන්ව ධෛර්යමත් කළ හැකිය.

### 2. රාජ්‍ය සේවා සැපයීම

රාජ්‍ය සේවා මහජනයාට ලබා දීමේ ක්ෂේත්‍රය තුළ, මානව හිමිකම් ගණනාවක් ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වන පොදු භාණ්ඩ සේවා වන අධ්‍යාපන, සෞඛ්‍ය සහ ආහාර අයිතිය වැනි සේවා සැපයීමේ වගකීම ඉටු කිරීමේ රජයේ හැකියාව වැඩි දියුණු කරන විට යහපාලන ප්‍රතිසංස්කරණ මගින් මානව හිමිකම් ඉහල නංවනු ලබයි. ප්‍රතිසංස්කරණ මූලාරම්භයන්ට වගවීම සහ විනිවිදභාවය පිළිබඳ යාන්ත්‍රණයන්, සැමට සේවාවන් සදහා ප්‍රවේශ වියහැකි සහ පිළිගත හැකි බව සහතික කිරීම සඳහා සංස්කෘතිකමය වශයෙන් සංවේදී ප්‍රතිපත්ති මෙවලම් සහ තීරණ ගැනීමේදී මහජන සහභාගීත්වය සඳහා මාර්ග ඇතුළත් විය හැකිය.

### 3. නීතියේ ආධිපත්‍යය

නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් ගත් කල, මානව හිමිකම් සංවේදී වූ යහපාලන නීති ප්‍රතිසංස්කරණයන් මූලාරම්භ කරන අතර එම නීතිය වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා දණ්ඩන ක්‍රමයේ සිට උසාවි සහ පාර්ලිමේන්තු යනාදී ආයතනවලට සහාය වේ. මෙවැනි යහපාලන මුල පිරීම්වලට නෛතික ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීම, ජාතික හා ජාත්‍යන්තර නීතිමය රාමුව පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සහ ආයතනවල ධාරිතා වර්ධනය හෝ ප්‍රතිසංස්කරණ ද ඇතුළත් විය හැකිය.

### 4. දූෂණ විරෝධී බව

දූෂණයට එරෙහිව සටන් කිරීම යන්න යහපාලන උත්සාහයන්, වගවීම, විනිවිදභාවය සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සකස් කිරීම සඳහා සහභාගී වීම වැනි මූලධර්ම මත රඳා පවතී. මෙම මූලාරම්භයන්ට දූෂණ විරෝධී කොමිෂන් සභා පිහිටුවීම, තොරතුරු හුවමාරු කර ගැනීමේ යාන්ත්‍රණ නිර්මාණය කිරීම සහ රජයන් මහජන මුදල් පරිහරණය කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ද ඇතුළත් විය හැකිය.

දෙවන මොඩියුලය

# ප්‍රජාතන්ත්‍රවාදය



# ප්‍රජාතන්ත්‍රවාදය

**"අපගේ පොදු ඉලක්කය වන සියලු පුරවැසියන් සඳහා ජාතික, කලාපීය හා දේශීය වශයෙන් ඉහළම ගුණාත්මකභාවයකින් යුතු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි උත්සාහ කරන්නෙමු".**

## හැඳින්වීම

"ප්‍රජාතන්ත්‍රවාදය" යන්න මහජන රජය හෝ බහුතරයේ රජය යන්න සරලව අර්ථ දැක්විය හැකිය. ප්‍රජාතන්ත්‍රවාදය රාජ්‍ය ස්වරූපයක් ලෙස රාජාණ්ඩුව, වංශාධිපතිත්වය සහ ආඥාදායකත්වයෙන් වෙන් කොට දැක්විය යුතුය. ප්‍රජාතන්ත්‍රවාදයේ වඩාත් පොදු අර්ථ දැක්වීම ලෙස ඔබ දැනටමත් අසා ඇති 'ජනතාව වෙනුවෙන් ජනතාව විසින් පත්කරගන්නා ජනතාවගේ පාලනය යන ඒබ්‍රහම් ලින්කන්ගේ අර්ථ දැක්වීම පෙන්වා දිය හැකිය. වෙනත් ආකාරයකින් කිවහොත්, ජනතාවගෙන් පැමිණෙන රජයක් යැයි අපට කිව හැකිය; එය ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනතාව විසින් වන අතර ජනතාවගේ අභිමතාර්ථයන් සඳහා ය. ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරයකගේ නීතිය නොව සුළුතරයේ ආරක්ෂාවයි.

## ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සමහර කියමන්

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය වරප්‍රසාදයක් නොවේ. එය මූලික අයිතිවාසිකමක් හා යුතුකමකි.

විශ්වීය ඡන්ද අයිතිය පිළිබඳ මූලධර්මයෙන් ඉවත්වීම, එසේ තෝරා පත් කර ගත් ව්‍යවස්ථාදායකයේ ප්‍රජාතන්ත්‍රවාදී වලංගුභාවය සහ එය ප්‍රකාශයට පත් කරන ලද නීති අවදානමට පත්කරනු ලබයි.

ප්‍රජාතන්ත්‍රවාදය නැගෙනහිර හෝ බටහිර ලෙස පිළිගැනීම් නැත. ප්‍රජාතන්ත්‍රවාදය යනු හුදෙක් ජනතාවගේ කැමැත්තයි.

ඔබ කුසගින්නෙන් සිටීනම් හෝ නිවාස නොමැති නම්, හෝ සෞඛ්‍යය සේවාවක් නොමැති නම් හෝ ඔබේ දරුවන්ට පාසැල් යා නොහැකි නම් ප්‍රජාතන්ත්‍රවාදය යන්නෙන් වැඩි යමක් අදහස් නොවේ. ඔබට ඡන්දයක් තිබුණත් ප්‍රජාතන්ත්‍රවාදය ඵලදායී නොවේ.

ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් සුදුසු වන්නේ ප්‍රජාතන්ත්‍රීකරණ ක්‍රියාවලියක් ලෙස ය.

## පුරාණ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය

ප්‍රජාතන්ත්‍රවාදය අලුතින් පුනර්ජීවනය වුවද එය පැරණි අදහසකි. මීට වසර 2500කට පෙර ඇතන්ස් සහ ග්‍රීසියේ වෙනත් නගරයන් ජනතාව විසින් පාලනය සිදු කරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදය නොහොත් ජනතාව විසින් පාලනය කිරීම සම්ප්‍රදායික රජයන් වන, එක් පුද්ගල පාලනය සහිත රාජාණ්ඩුව සහ ස්වල්ප දෙනෙකු විසින් පාලනය කළ රදළ ආණ්ඩුව වැනි පාලන ක්‍රමයන් සඳහා විකල්පයක් විය. පළමු ප්‍රජාතන්ත්‍රවාදී අදියරයන්හිදී පුරවැසියන් ඔවුන්ගේ කුඩා ජනරජයන්හි නගරයන් හෝ ප්‍රජාව සඳහා නීති සම්පාදනය කර බලාත්මක කළහ. පුරවැසියන් විසින් සිදුකරන බහුතර පාලනයක් පැවති අතර ඔවුන්ගේ ප්‍රජාවේ ජනතාව පාලක සමිති සදහා ජනතාව සෘජුවම සහභාගී වූ නීති සම්පාදක මණ්ඩලයන් ද පැවතුණි. කෙසේ වෙතත්, පුරවැසියන්ගේ තත්වය ජනගහනයෙන් සුළුතරයක් වන ග්‍රීක සම්භවයක් ඇති නිදහස් පිරිමින්ට පමණක් සීමා විය. කාන්තාවන්ට හා වහලුන්ට පුරවැසියන් විය නොහැකි වූ අතර, ග්‍රීක නොවන පිරිමින්ගෙන් සුළු පිරිසකට පමණක් පුරවැසිභාවය ලබා දී තිබුණි .

පුරාණ ග්‍රීක ප්‍රජාතන්ත්‍රවාදය පුරවැසියන්ට තම ප්‍රජාවේ පොදු යහපත සඳහා සෘජුවම පාලනයට සහභාගී වීමට සමාන අයිතිවාසිකම් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පුද්ගලයා මත ප්‍රජාව කරන හිමිකම්, ප්‍රජාව මත පුද්ගලයා කරන ප්‍රකාශයන්ට වඩා ප්‍රමුඛ හා උසස් විය. යහපත් පුරවැසියෙකු නගර ප්‍රජාවේ ආශයන් වෙනුවෙන් කොන්දේසි විරහිතව සේවය කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී. විශේෂයෙන් එහිදී අපේක්ෂා කරනු ලැබුයේ විදේශීය ආධිපත්‍යයේ තර්ජනයට එරෙහිව එහි නිදහස සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම යි.

පුරාණ ග්‍රීසියේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්වල පුද්ගලයන්ගේ පෞද්ගලික අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් නොතිබුණි. පුරවැසියන්ගේ බහුතර ඡන්දයකින් ගත් තීරණ බොහෝ විට සුළුතරයේ අවශ්‍යතා නොසලකා හැරියේය. ඇතැම්විට පුරවැසි බහුතරය ජනප්‍රිය නොවන මත දරන පුද්ගලයන් අපයෝජනයට හා පීඩාවට පත් කරන කුරිරු පාලනයක් ඇති කළේය.

## ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික මූලධර්ම

ඒබ්‍රහම් ලින්කන්ගේ සුප්‍රසිද්ධ උපුටා දැක්වීමේ (1863) ප්‍රජාතන්ත්‍රවාදය යනු " ජනතාව විසින් ජනතාව වෙනුවෙන් ඇතිකරන ජනතාවගේ රජය යන නිර්වචන තුන පහත පරිදි තේරුම් ගත හැකිය: බලය ලැබෙන්නේ ජනතාවගෙනි - ජනතාව යනු බලය ක්‍රියාත්මක කරන හෝ එසේ කිරීමට ජනවරම ලබා දෙන පරමාධිපත්‍ය බලය යි. එසේම එම ජනතාව විසින් අධිකාරියේ කොටසක් වන ඕනෑම කෙනෙකුට වගකිව යුතුය. "විසින්": බලය ක්‍රියාත්මක වන්නේ තේරී පත් වූ නියෝජිතයන් හරහා හෝ පුරවැසියන් විසින් සෘජුව පාලනය කිරීමෙනි; "සඳහා": බලය ක්‍රියාත්මක වන්නේ ජනතාවගේ අවශ්‍යතා, එනම් පොදු යහපත උදෙසා ය.

සෑම රටකම සෑම පරම්පරාවක්ම මුහුණ දෙන අභියෝගයන්ට මුහුණ දීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් පිළිබඳ මූලික අවබෝධය ස්ථිරවම වර්ධනය කළ යුතුය. සෑම පරම්පරාවක්ම ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් පිළිබඳව දැනුවත් කළ යුතුය.

**දේශපාලන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය : නූතන ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංගවලට ඇතුළත් වන්නේ:**

ව්‍යවස්ථාව ලිඛිත ස්වරූපයකින් පවතී. ඇතැම් රටවල නිදහස් මහාධිකරණයක් මඟින් සහතික කරන ලද ආයතනික රාමුවක් ලෙස ව්‍යවස්ථාව හඳුන්වා දිය හැකිය. සියලුම මානව හිමිකම් සිවිල් අයිතීන් ලෙස සහතික කර නොමැති අතර මානව හිමිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති පරිදි සිවිල් අයිතිවාසිකම් වෙත යොමු කරනු ලැබේ.

- මානව හිමිකම් සම්මුතීන් අත්සන් කර ඇති රජයන් ඔවුන් විසින් අනුමත කර ඇති අයිතිවාසිකම් පරාසය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන් සඳහන් කර තිබේද යන්න නොසලකා ආරක්ෂා කිරීමට බැඳී සිටී. - සියලුම පුරවැසියන්ගේ සමාන නෛතික තත්ත්වය: සියලු පුරවැසියන් වෙනස් කම් කොට සැලකීමේ මූලධර්මයෙන් තොරව නීතියෙන් සමානව ආරක්ෂා කර ඇති අතර නීතියෙන් අර්ථ දක්වා ඇති පරිදි ඔවුන්ගේ යුතුකම් ඉටු කළ යුතුය. - සර්වජන ඡන්ද බලය: මෙමඟින් වැඩිහිටි පුරවැසියන්ට, පුරුෂයින්ට හා කාන්තාවන්ට, පාර්ලිමේන්තු මැතිවරණවලදී පක්ෂ සහ / හෝ අපේක්ෂකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දෙයි.

- ඊට අමතරව, සමහර පද්ධතිවලට ජනමත විචාරණයක් ඇතුළත් වේ, එනම් සෘජු ඡන්දයෙන් යම් කාරණයක් සම්බන්ධයෙන් තීරණ ගැනීමට පුරවැසියන්ට ඇති අයිතියයි; - පුරවැසි සහභාගිත්ව පුළුල් පරාසයකට ප්‍රවේශය ලබා දෙන මානව හිමිකම් භුක්ති විඳිති. වාරණයෙන් තොර ජනමාධ්‍යයට ඇති නිදහස සහ රාජ්‍ය පාලනයට ඇති නිදහස, සිතීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ හා සාමකාමී රැස්වීම සහ සුළුතරයන්ට හා දේශපාලන විරුද්ධවාදීන්ට නිදහසේ කටයුතු කිරීමට ඇති අයිතිය මෙයට ඇතුළත් ය; - බහුත්වවාදය සහ අභිලාෂයන් සහ දේශපාලන අරමුණු වල තරඟකාරිත්වය: තනි පුද්ගල පුරවැසියන් හා කණ්ඩායම්වලට ඔවුන්ගේ අවශ්‍යතා හෝ දේශපාලන අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පක්ෂ හෝ බලපෑම් කණ්ඩායම් රාජ්‍ය නොවන සංවිධාන ආදිය පිහිටුවීමට හෝ සම්බන්ධ වීමට ඉඩ ඇත.

- අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම හා බලය සහ අවස්ථාවන් සමාන ලෙස බෙදා හැරීම සාක්ෂාත් කර ගැනීමේ අවස්ථා තිබේ; - පාර්ලිමේන්තුව: තෝරා පත් කරගන්නා ලද නියෝජිතයින්ගේ මණ්ඩලයට නීති සම්පාදනය කිරීමේ බලය ඇත, එනම් සාමාන්‍යයෙන් බැඳී ඇති නීති සම්මත කිරීම යි.

- පාර්ලිමේන්තුවේ බලය රඳා පවතින්නේ බහුතර ඡන්දදායකයින්ගේ කැමැත්ත මත ය. පාර්ලිමේන්තු ක්‍රමයක බහුතරය එක් මැතිවරණයක සිට තවත් මැතිවරණයකට මාරු වුවහොත් නව රජයක් බලයට පත්වේ. ජනාධිපති ක්‍රමයේදී රජයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා සෘජු ඡන්දයෙන් වෙනමම තෝරා පත් කර ගනු ලැබේ.

- බහුතර රීතිය: බහුතරය තීරණය කරයි, සුළුතරය තීරණය පිළිගත යුතුය. ව්‍යවස්ථාවන් විසින් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කරන බහුතර පාලනයේ සීමාවන් අර්ථ දක්වයි. ප්‍රශ්නය අනුව බහුතරය සඳහා වන ගණපූරණය වෙනස් විය හැකිය. - නිදසුනක් වශයෙන්, ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා තුනෙන් දෙකක බලය ලබා ගැනීම පෙන්වා දිය හැකිය.

- පරීක්ෂාව සහ සමබරකරණය: ප්‍රජාතන්ත්‍රවාදය මෙම මූලධර්ම දෙක ඒකාබද්ධ කරයි: බලය යෙදවීමේ බලය රජය සමඟ රැඳී ඇති අතර එය "පුරවැසියන් නිරායුධ කිරීම" ට සමාන වේ. කෙසේ වෙතත්, බලයේ බලය අත්තනෝමතික හෝ ආඥාදායක පාලනයක් බවට පත්වීම වැළැක්වීම සඳහා, සියලු ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතිවලට පරීක්ෂාව සහ සමබරකරණය ඇතුළත් වේ. සම්භාව්‍ය ආකෘතිය: රාජ්‍ය බලතල, නීති සම්පාදනය, විධායක බලතල සහ අධිකරණ බලය ලෙස බෙදා ඇත.

- තාවකාලික අධිකාරිය: බලය පාලනය කිරීමේ තවත් මාධ්‍යයක් වන්නේ නිශ්චිත කාලයක් සඳහා පමණක් අධිකාරිය ලබා දීමයි. සෑම මැතිවරණයක් සඳහාම මෙහි බලපෑමක් ඇති අතර, ඇතැම් අවස්ථාවල දී, මුළු ධුර කාලය සීමිත විය හැකි අතර, ඔවුන් වසර හතරක්වන ධුර කාලයන් දෙකකට පසු ඉවත් විය යුතුය.

**විවිධ වර්ගයේ ප්‍රජාතන්ත්‍රවාදයන් පහත සඳහන් දෑ ඇතුළුව සමහර ශක්තීන් හා දුර්වලතාවයන් බෙදා ගනී.**

## ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තීන්

- ප්‍රජාතන්ත්‍රවාදය ශිෂ්ඨ සම්පන්න, අවිහිංසාවාදී ගැටුම් නිරාකරණය සඳහා රාමුවක් සහ මාධ්‍යයක් සපයයි; ගැටුම් හා බහුත්වයේ ගතිකතාවයන් ගැටළු විසඳීමට සහාය වේ.
- ප්‍රජාතන්ත්‍රවාදය, සමාජයන්වල සහ ජාත්‍යන්තර දේශපාලනයේ සාමය පවත්වාගෙන යනු ලබන්නන් වේ.
- ආණ්ඩු ක්‍රමය වෙනස් නොකර දේශපාලන නායකත්ව හුවමාරුවකට පහසුකම් සපයන එකම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි.
- ප්‍රජාතන්ත්‍රවාදය යනු මානව වැරදි හඳුනා ගැනීමට ඉඩසළසන ඉගෙනුම් ප්‍රජාවයි. පොදු යහපත අර්ථ දැක්වෙන්නේ ඒකාධිපති අධිකාරියක් විසින් පනවනු නොලබන සාකච්ඡා මගිනි.
- මානව ගෞරවය මත පදනම් වූ දේශපාලන ක්‍රියාදාමයන් සඳහා සම්මත රාමුවක් ලබා දීමෙන් මානව හිමිකම් විසින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරයි. මානව හිමිකම් ගිවිසුම් අනුමත කිරීම තුළින් රජයකට තම පුරවැසියන්ට පුද්ගලික නිදහස සහ වෙනත් අයිතිවාසිකම් පවත්වාගෙන යාමට අවශ්‍ය "පොරොන්දු" ලබා දිය හැකිය.

## ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටළු

- පක්ෂ හා දේශපාලනඥයන් මැතිවරණවල සාර්ථකත්වය සඳහා දිගුකාලීන අරමුණු කැප කිරීමට නැඹුරු වේ.
- ජනතාවක් සඳහා වූ ආණ්ඩුවක් යනු ජාතික රාජ්‍යයක සීමාවන් තුළ පවතින රජයකි. මෙහිදී ජාතික රාජ්‍යයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීමේ බලපෑමේ විෂය පථය සීමා කිරීම හා ආර්ථික හා පාරිසරික වර්ධනයන් වැනි ගෝලීය අන්තර් රඳා පැවැත්ම වැඩි කිරීම සිදු කරනු ලබයි.

## ප්‍රජාතන්ත්‍රවාදය නිර්ප්‍රජාතන්ත්‍රවාදයෙන් වෙන්කර හඳුනා ගන්නේ කෙසේද?

### මැතිවරණ

ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාව ඉක්මවා යාම සඳහා රටක් සපුරාලිය යුතු අවම නිර්ණායක පිළිබඳව අද පුළුල් ජාත්‍යන්තර ගිවිසුමක් තිබේ. අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ, පුරවැසියන් හෝ ජනතාව රජයේ

නියෝජිතයින් තෝරා ගන්නේ ප්‍රායෝගිකව සියලුම වැඩිහිටියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇති මැතිවරණ ක්‍රියාවලියට සියලුදෙනා සහභාගීවන නිදහස් හා සාධාරණ, තරඟකාරී සහ නියමිත මැතිවරණ මගිනි. මැතිවරණ මගින්, අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයක ජීවත්වන සියලු පුද්ගලයින්ට තම රජයේ තීරණවලට බලපෑම් කිරීමට නිදහසේ සහභාගී විය හැකිය. සුළුතර පක්ෂවල සාමාජිකයින්ට පාලක පක්ෂය විවේචනය කිරීමට හා එසේ නැතිනම් මීළඟ මැතිවරණ තරඟයේ දී ජයග්‍රහණය කරා යාමට බාධාවක් නොවන අයුරින් පාලක පක්ෂයට විරුද්ධ වීමට හැකිය.මෙහි ආණ්ඩු පාලනයට වගවන ජනතාවක් පාලනය කරන ජනතා පරමාධිපත්‍යය පවතී.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

කතා කිරීමේ නිදහස, මාධ්‍ය නිදහස, පෙත්සම්, එක්රැස්වීම් සහ සංගමය සඳහා ඇති පුද්ගලයන්ගේ දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීතියේ ආධිපත්‍යය සහතික කරන සීමිත රජයක් සඳහා වූ රාමුවක් වන අපේ කාලයේ අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයක් සදහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ආරක්ෂාව සපයා ඇත. එසේම, පුරවැසියන්ට තම නියෝජිතයන් පාලනයට තෝරා පත් කර ගැනීමටත්, මැතිවරණ අතර කාල සීමාව තුළ ඔවුන්ට වගවීම සඳහාත් නිදහසේ සහභාගී විය හැකිය. රජයේ පාලනයෙන් ස්වාධීනව පවතින පුද්ගලික වසම තුළ ඔවුන්ගේ පෞද්ගලිකත්වය හා සිවිල් සමාජය තුළ පවත්නා විවිධත්වය නිදහසේ ප්‍රදර්ශනය කළ හැකි අතර සහ නිදහසේ ඇසුරු කිරීමට හා ප්‍රකාශනයට ඔවුන්ට අවකාශ පවතී. බහුතර පාලනය නොතකා ප්‍රභූ කණ්ඩායමක කුරිරු පාලනයක් හෝ ජනප්‍රිය නොවන සුළු ජාතීන් මත බහුතරයේ කුරිරු පාලනයක් පැනවීම වැනි රජයක් අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම වැළැක්වීම සඳහා නීත්‍යානුකූල ව්‍යවස්ථාවක් පුද්ගලයන්ගේ එදිනෙදා ජීවිතයේදී ඵලදායී ලෙස ක්‍රියාත්මක වේ.

**අද ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ වන්නේ
එය නිර්ප්‍රජාතන්ත්‍රවාදයෙන් වෙන්කර හඳුනා ගැනීමයි**

- ව්‍යවස්ථාමයවාදය
- රජයේ නියෝජනය
- නිදහස සඳහා පුද්ගලයන්ට ඇති අයිතිය
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සීමිත ආණ්ඩුවක් සහ ව්‍යවස්ථාවක් පදනම් කරගත් නීතියේ ආධිපත්‍ය සපයයි.
- පාලනය සදහා ජනතාවගේ නියෝජනය සිදුවන්නේ ව්‍යවස්ථාවකට අනුකූලව ආරක්ෂා කරනු ලබන සහභාගීත්වයට ඇති නිදහස මත නිදහස්, සාධාරණ, තරඟකාරී සහ කලානුරූපීව පවත්වනු ලබන මැතිවරණ මඟිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායකයේ සහ නියෝජිත ආණ්ඩුවේ මැතිවරණ මඟින් ලැබිය යුතු අවසාන ප්‍රතිඵලය වන්නේ රටක, බහුතරයට සහ සුළුතරයට එකසේ පුද්ගල නිදහස සඳහා වූ අයිතිවාසිකම් සහතික කිරීමයි. මේ අනුව, වක්‍ර හෝ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයක නිදහස රඳා පවතින්නේ ඕනෑම ආකාරයක කුරිරු පාලනයකින් ආරක්ෂා වීම සඳහා ආණ්ඩුවේ බලය සීමා කරන සහ නියාමනය කරන ව්‍යවස්ථාමයවාදය මත ය.
- ප්‍රජාතන්ත්‍රවාදයක ව්‍යවස්ථාමයවාදය විශේෂයෙන් ආරක්ෂා කරන්නේ අතීතයේ සහ වර්තමානයේ ජනප්‍රිය රජයන් පීඩාවට පත් කර ඇති බහුතර පීඩාකාරී පාලනයේ අන්තරායට එරෙහිව ය. අද

වන විට ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ යුක්තිය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසියක් වන්නේ සියලු ජනතාව දේශපාලනයට ඇතුළත් කළ හැකි සුළුතරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා බහුතරය ව්‍යවස්ථානුකූලව සීමා කිරීමයි.

## ප්‍රජාතන්ත්‍රවාදය සඳහාවන තර්ක

- පුද්ගලයාගේ අභිමානය සහ පුද්ගල ගරුත්වය පිළිබඳ හැඟීම වැඩි දියුණු කිරීම
- ප්‍රජාවේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට පුද්ගලයින් දිරිමත් කිරීම
- පුද්ගලයන්ගේ ස්වයං සාක්ශාත්කරණය සඳහා සමාන අවස්ථා ලබා දීම
- තීරණ ගැනීමේදී ජනතාවගේ සාමූහික ඥානය ලබා ගැනීම
- පුද්ගලයන් දේශපාලන හා ප්‍රජා සමානයන් ලෙස සැළකීම
- සියලු පුද්ගලයින්ට ජීවිතය, නිදහස සහ දේපළ සඳහා ඇති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- උරුම වූ තත්වයට වඩා කුසලතා මත පදනම් වූ ප්‍රධානයන් හරහා ආර්ථික ඵලදායීතාවය සහ උසස් ජීවන තත්ත්වයක් ඇති කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදීන් එකිනෙකාට එරෙහිව සටන් කිරීමට නැඹුරු නොවන බැවින් අන්තර්ජාතික සාමය, ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම
- රටක් තුළ ගැටුම් විධිමත් ලෙස විසඳා ගැනීම
- පාලකයින් තමන් පාලනය කරන පුද්ගලයන්ට වගවීම සිදුකිරීම
- මහජන කැමැත්ත මත පදනම්ව රජයේ නීත්‍යානුකූලභාවය සාධාරණීකරණය කිරීම

## ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම්

නිදහසේ වටිනාකම, මානව හිමිකම්වලට ගරු කිරීම සහ කාලානුරූපීව පවත්වනු ලබන නිරවද්‍ය හා සත්‍ය මැතිවරණයන් පැවැත්වීමේ මූලධර්මය ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යාවශ්‍ය අංග වේ. අනෙක් අතට, ප්‍රජාතන්ත්‍රවාදය මඟින් මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය පරිසරය සපයයි.

මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය අතර සම්බන්ධය ගැඹුරු වන අතර එය දෙයාකාරයකින් ගමන් කරයි: සෑම ආකාරයක්ම එක්තරා ආකාරයකින් අනෙකා මත රඳා පවතින අතර එක් ආකාරයක් අනෙකක් නොමැතිව අසම්පූර්ණය. කෙසේ වෙතත්, මානව හිමිකම් කෙරෙහි පූර්ණ ගෞරවයක් නොමැතිව "ප්‍රජාතන්ත්‍රවාදයද අසම්පූර්ණය. මිනිසුන් විසින් අනෙකුත් මූලික අයිතිවාසිකම්වලට ගරු නොකිරීම තුලින් පූර්ණ වශයෙන් නිර්ව්‍යාජ ලෙස පාලනයට සහභාගී විය නොහැකිය.

## මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යාවශ්‍ය අංග පහත දැක්වේ.

1 මානව හිමිකම් සහ මූලික නිදහසට ගරු කිරීම

2 සමාගමට ඇති නිදහස

3 අදහස් සහ මතය ප්‍රකාශ කිරීමේ නිදහස

4 නීතියේ ආධිපත්‍යයට අනුකූලව බලයට ප්‍රවේශ වීම සහ එය ක්‍රියාත්මක කිරීම

5 සර්වජන ඡන්ද බලයෙන් යුක්තව නියමිත අවස්ථාවන්හි නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම හා රහසිගත ඡන්දයකින් ජනතාවගේ කැමැත්ත ප්‍රකාශ කිරීම

6 දේශපාලන පක්ෂ හා සංවිධානවල බහුත්ව පද්ධතිය

7 බලය බෙදීම

8 අධිකරණයේ ස්වාධීනත්වය

9 රාජ්‍ය පරිපාලනයේ විනිවිදභාවය සහ වගවීම

10 නිදහස්, ස්වාධීන හා බහුත්ව මාධ්‍ය

**බොහෝ මිනිසුන්ගේ මූලික දේශපාලන විශ්වාසයන් කුමක් වුවත් සියළු ජනතාවට සුදුසු යැයි සලකන අංග ගණනාවක් ප්‍රජාතන්ත්‍රවාදයේ සුවිශේෂී වේ.**

- කුරිරු ඒකාධිපතියන් විසින් පාලනය කිරීම වැළැක්වීමට ප්‍රජාතන්ත්‍රවාදය උපකාරී වේ;
- නූතන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයන් එකිනෙකා සමඟ යුද්ධ නොකරයි;
- ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආණ්ඩු ඇති රටවලට වඩා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ඇති රටවල් සමෘද්ධිමත් වේ. සහ සෞඛ්‍යය, අධ්‍යාපනය, පුද්ගලික ආදායම සහ වෙනත් දර්ශකයන් මගින් මනිනු ලබන ප්‍රජාතන්ත්‍රවාදය මානව සංවර්ධනයට නැඹුරු වේ.
- ප්‍රජාතන්ත්‍රවාදය මිනිසුන්ට ඔවුන්ගේ මූලික අවශ්‍යයතා ආරක්ෂා කර ගැනීමට උපකාරී වේ.
- ප්‍රජාතන්ත්‍රවාදය තම පුරවැසියන්ට ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවලට ලබා දිය නොහැකි සහ සැපයිය නොහැකි මූලික අයිතිවාසිකම් සහතික කරයි; සහ ප්‍රජාතන්ත්‍රවාදය තම පුරවැසියන්ට වෙනත් ආකාරයේ පාලන ක්‍රමයක නිදහසට වඩා පුළුල් පරාසයක පුද්ගලික නිදහස සහතික කරයි.
- ජනතාවට තමන් කැමති පරිදි නීතිරීති යටතේ ජීවත් වීමට උපරිම අවස්ථාව ලබා දෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පමණි;

- රජයේ ප්‍රතිපත්ති පිළිබඳ තීරණ සහ තීරණ සම්බන්ධයෙන් සදාචාරාත්මක වගකීම භාර ගැනීමට ජනතාවට උපරිම අවස්ථාවක් ලබා දෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පමණි; එසේම සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමේ දේශපාලන සමානාත්මතාවයක් පැවතිය හැක්කේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ පමණි.
- ඵලදායී සහභාගීත්වය: ප්‍රතිපත්තියක් සම්මත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පෙර, දේශපාලන ප්‍රජාවේ සාමාජිකයින්ට ප්‍රතිපත්තිය පිළිබඳ ඔවුන්ගේ අදහස් වෙනත් සාමාජිකයින්ට දැන ගැනීමට අවස්ථාව තිබේ.
- ඡන්දය ප්‍රකාශ කිරීමේ සමානාත්මතාවය: දේශපාලන ප්‍රජාවේ සාමාජිකයින්ට ප්‍රතිපත්තියට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ඇති අතර සියලු ඡන්ද සමාන ලෙස ගණන් ගැනේ.
- මූලික අයිතිවාසිකම්: පරමාදර්ශී ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යාවශ්‍යය අංගයක් වන අයිතියක් නියම කරයි: මේ අනුව රටේ සෑම සාමාජිකයෙකුටම අන් අය සමඟ සන්නිවේදනය කිරීමේ අයිතියක් තොරතුරු රැස්කිරීමේ අයිතිය, අනෙක් අය මෙන්ම ඔහුගේ ඡන්දය ද සමානව ගණන් කිරීමේ අයිතිය ඇත, අනෙක් සාමාජිකයන් සමඟ සමාන පදනමක් මත සහභාගී වීමට සහ න්‍යාය පත්‍රයන් පාලනය කිරීමට අයිතියක් ඇත. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය හුදු දේශපාලන ක්‍රියාදාමයන්ට වඩා වැඩි ක්‍රියාදාමයක් වන අතර එය අනිවාර්‍යයෙන්ම මූලික අයිතිවාසිකම් පද්ධතියකි.
- අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස: බිය හා දඬුවමින් තොරව පුරවැසියන්ට දේශපාලනික වශයෙන් අදාළ විෂයයන් සම්බන්ධව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ හැකිය.
- ස්වාධීන තොරතුරු ප්‍රභවයන්: රජයේ හෝ කිසිදු කණ්ඩායමක පාලනය යටතේ නැති දේශපාලන තොරතුරු ප්‍රභවයන් පවතින අතර තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට හෝ වෙනත් ආකාරයකින් බෙදා හැරීමට ඇති අයිතිය නීතියෙන් ආරක්ෂා වේ. එපමණක් නොව, සියලු පුරවැසියන්ට එවැනි තොරතුරු ප්‍රභවයන් සොයා ගැනීමට සහ භාවිතා කිරීමට අයිතියක් ඇත.
- සමාගමේ නිදහස: පක්ෂ හා බලපෑම් කණ්ඩායම් ඇතුළුව ස්වාධීන දේශපාලන සංවිධාන පිහිටුවීමට හා සහභාගී වීමට පුරවැසියන්ට අයිතියක් ඇත.

## පුරවැසියන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන දැනගත යුත්තේ ඇයි?

ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම බෙහෙවින් රඳා පවතින්නේ ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ වෙනත් විවිධ වර්ගයේ ආණ්ඩු අතර ඇති වෙනස්කම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මත ය. "ජනතාවගේ ආණ්ඩුව, ජනතාව විසින්, ජනතාව වෙනුවෙන්" - ප්‍රජාතන්ත්‍රවාදයේ අරුත ගැන ඒබ්‍රහම් ලින්කන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබද වාක්‍ය ඛණ්ඩය අනුව - එය කුමක්ද, එය කරන්නේ කෙසේද සහ එය හොඳ යැයි පවසන්නේ ඇයි යන්න හෝ එසේ නැතහොත් අවම වශයෙන් එයට ඇති විකල්පයන් පිළිබඳව ජනතාවට අධ්‍යාපනයක් තිබිය යුතුය.

සමහර රටවල, ව්‍යවස්ථාමය ආණ්ඩු නොමැති සහ ඒවායේ ප්‍රායෝගික ආරක්ෂාව නොමැතිව මානව හිමිකම් සහතික කිරීම් විය. ප්‍රජාතන්ත්‍රවාදයේ වාග් මාලාවේ වැරදි භාවිතයන් සහ පැටලිලි සහගත තත්වයන් ප්‍රායෝගික භාවිතයන් තුළින් පෙන්වීම මඟින් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ව්‍යාජ අනුකරණය කරන්නන් හා ප්‍රතිවාදීන්ගෙන් වෙන්කර හඳුනාගත හැකි සංකල්ප පුරවැසියන්ට ඉගැන්වීමේ වැදගත්කම නාට්‍යාකාර ලෙස පෙන්නුම් කරයි.

19 වන සියවසේ ජීවත් වූ ශ්‍රේෂ්ඨ ප්‍රංශ දාර්ශනිකයෙකු වූ ඇලෙක්සිස් ඩි ටොකිවිල් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දෝෂ සහිත අර්ථකථන මගින් මිනිසුන්ගේ අවබෝධය ව්‍යාකූල විය හැකි වන අතර එහි පැවැත්මට තර්ජනයක් වනු ඇති බවට බියක් දැක්වීය. එබැවින්, ඒකාධිපතිවාදයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයින්ට වචන අර්ථ දැක්වීම සහ භාවිතා කිරීම පිළිබඳ ඥානාන්විත අනතුරු ඇඟවීමක් ඔහු ලබා දුන්නේය. සත්‍ය ප්‍රජාතන්ත්‍රවාදයක් හඳුනා ගැනීමට වැඩි වැඩියෙන් මිනිසුන්ට හැකි නම්, අපේ කාලයේ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් විශ්වාසවන්තව ක්‍රියාවට නැංවිය හැකි අතර එහි ආශීර්වාදය වඩාත් පුළුල් ලෙස භුක්ති විඳිය හැකිය.

## ප්‍රජාතන්ත්‍රවාදී බහුත්වවාදය

ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ බහුත්වවාදය සමාජ පිළිවෙලක් / පර්යායක් හා ප්‍රතිපත්තියක් ලෙස සලකනු ලැබේ. මෙය දේශපාලන, ආර්ථික, ආගමික, ජනවාර්ගික හෝ වෙනත් ඕනෑම ආකාරයක විය හැකිය. බහුවිධ සමාජයක් සංලක්ෂිත වන්නේ ගෞරවය, පිළිගැනීම සහ සියලු දෘෂ්ටි කෝණයන් හඳුනා ගැනීමෙනි; ඒවා කොතරම් වෙනස් හෝ අපසරනය විය හැකි වුවත්; ඒවා ව්‍යාප්ත කිරීම මෙන්ම බලාත්මක කිරීමට කිසිදු බාධාවකට මුහුණ නොදිය යුතුය. බහුත්වවාදය පදනම් වී ඇත්තේ මතභේදාත්මක සාකච්ඡා මත වන අතර ඒවායේ ප්‍රතිඵල බොහෝ විට සම්මුතීන් මත ගොඩ නඟා ඇති අතර එය අවසානයේදී ඒ හා සම්බන්ධ සියලු කණ්ඩායම් තෘප්තිමත් කරයි, හෝ අවම වශයෙන් සමස්තයක් ලෙස පිළිගත හැකිය. බහුත්වවාදයේ දී, දෙබස්, අදහස් හුවමාරු කරගැනීම හෝ සංවාද එසේම විවාදයට භාජනය වන අදහස් හා මතවාදයන් මෙන්ම අදහස් ප්‍රකාශ කිරීමේ සමාජ ක්‍රියාවලීන්ගේ රාමුව තුළ වඩාත් ධනාත්මක ලක්ෂණයක් පවතී. එසේම පුරවැසියන්ගේ දේශපාලන අභිමතාර්ථයන් තුළ පවතින පාලන තන්ත්‍රයට විරුද්ධ වීම හෝ විපක්ෂයට වඩා සමීප වීම පවතී.

## ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

පාලනය යනු රාජ්‍යයක, සංවිධානයක හෝ සමාජයක කටයුතු කළමනාකරණය කිරීමේ අරමුණින් බලය හෝ අධිකාරිය ක්‍රියාත්මක කිරීමයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය නොහොත් 'යහපාලනය' පදනම් වී ඇත්තේ බල ව්‍යායාමය මත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සාරධර්ම බලාත්මක කිරීම යි. දෙන ලද තොරතුරු අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ දිශානතිය සැලකිලිමත් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයන් ක්‍රියාවට නැංවීමට උපකාර වන මූලික සාරධර්මයන් යෙදවීම සහ මෙම ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගැනීමට උත්සාහ කිරීමටය. එම මූලික සාරධර්ම අතර අනෙකුත් ඒවා නම්, යුක්තිය, සමානාත්මතාවය, සහයෝගීතාවය, ඉවසීම, බහුත්වවාදය, සුළු ජාතීන් සැලකිල්ලට ගැනීම, අවිහිංසාව, සංවාදය සහ සාකච්ඡා, නිදහස් ප්‍රජා ජීවිතය ආදියයි. අනතුරුව ප්‍රජාතන්ත්‍රවාදය සැළකිල්ලට ගනු ලබන්නේ බහුතර තීන්දු සම්මත කිරීමේ රාමුව තුළ සුළු ජාතීන්ගේ අවශ්‍යතාවන්ට හැකි තාක් දුරට ගරු කිරීමයි. මූලික සාරධර්මවලින් උකහා ගත හැකි යහපාලනයේ වැදගත්ම මූලධර්ම නම්: සහභාගීත්වය, කාර්යක්ෂමතාව, වගකීම සහ වගකීම පිළිබඳ හැඟීම, වාර්තා කිරීමේ ක්‍රියාව, අනුවර්තන ධාරිතාව, විනිවිදභාවය, නීතියේ ආධිපත්‍යය සහ සහභාගීත්වය යි.

## තරුණ ප්‍රජාව සහ ප්‍රජාතන්ත්‍රවාදය

ඇත්ත වශයෙන්ම, බොහෝ යෞවනයන් ඡන්දය ලබා ගැනීමට බොහෝ කලකට පෙර දේශපාලනිකව ඉතා ක්‍රියාශීලී වන අතර, යම් ආකාරයකින් එවැනි ක්‍රියාකාරකම්වල බලපෑම පසුකාලීනව දක්නට

නොලැබෙන අතර එය ඔවුන් ලබන තනි ඡන්දයට වඩා ශක්තිමත් විය හැකිය. එසේම අවුරුදු හතරකට හෝ පහකට වරක් ඡන්දය භාවිතා කිරීමට හෝ නොකිරීමට ඉඩ ඇත. දේශපාලනඥයින් බොහෝ විට තරුණ ඡන්දය ලබා ගැනීම සම්බන්ධයෙන් උනන්දු වන බැවින් ඔවුන් තරුණ තරුණියන්ගේ උත්සුකයන්ට ඇහුම්කන් දීමට වැඩි ඉඩක් ඇත.

සෙවන මොඩියුලය

# වගවීම



# වගවීම

## හැඳින්වීම

වගවීම "නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ලාංඡනය" ලෙස විස්තර කර ඇත. මෙය නව අදහසක් නොවේ. 19 වන සියවසේ බ්‍රිතාන්‍යය දේශපාලනඥයෙකු වන බෙන්ජමින් ඩිස්රෙයිලි මෙසේ ලිවීය" සියලු බලය විශ්වාසයක් වන අතර, එහි අභ්‍යාසකරණයට අප වගකිව යුතු ය ". දේශපාලනය හා පරිපාලනය තුළ වගකීම යනු "රාජ්‍ය අධිකාරියේ සිටින පුද්ගලයන් රාජ්‍ය සේවකයන් ලෙස හැසිරීම හා ක්‍රියාවන්හිදී ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය දැක්වීමට වඩාත් සුදුසු තාක්ෂණික යෙදුමයි" .

වගවීම යනු පුද්ගලයකු හෝ ආයතනයක් විසින් රාජකාරි මාලාවක් සඳහා වගකිව යුතු මූලධර්මයක් වන අතර ප්‍රතිලාභ හෝ දඬුවම් ලබා දිය හැකි අධිකාරියකට ඒවා ඉටු කිරීම පිළිබඳ විස්තරයක් ලබා දිය යුතුය.

"වගවීම" යන වාක්‍ය ඛණ්ඩය මුලින්ම ව්‍යුත්පන්නව ඇත්තේ ලතින් වචනයක්වන "ඇකොම්ප්ටෙයාර්" යන වචනයෙනි. එහි අර්ථය "යමක් ගණන් ගැනීම" යන්නයි. එය බොහෝ විට "පිළිතුරු සැපයීමේ හැකියාව", "බලාත්මක කිරීම", "වගකීම", "දොස් පැවරීම" සහ "වගවීම" වැනි වෙනත් සංකල්ප සමඟ සමපාතව භාවිත කර ඇත. කෙසේ වෙතත්, ද්විත්වභාවය තිබියදීත්, වගවීම පිළිබඳ සංකල්පය හා සම්බන්ධ සියලු යෙදුම් එක් පොදු අර්ථයක් සමඟ සම්බන්ධ වී ඇති අතර එය යමෙකු කර ඇති දේ පිළිබඳ "ගිණුම් ලබා දීමේ අපේක්ෂාව සහ අවනතභාවය " වේ.

**රොබට් බෙන්ට අනුව, පුද්ගලයන් ආකාර කිහිපයකින් වගවීම ක්‍රියාත්මක කරයි :**



- මූල්‍ය කටයුතු සඳහා, රාජ්‍ය නිලධාරීන් මහජන සම්පත් හසුරුවන ආකාරය පිළිබඳ සවිස්තරාත්මක අපේක්ෂාවන් අප විසින් ස්ථාපිත කරන විට;
- සාධාරණත්වය හෝ සාධාරණත්වය සඳහා, රජය සහ එහි සේවකයින් එහි පුරවැසියන්ට සාධාරණ ලෙස සලකන බව සහතික කිරීම සඳහා අපි සාරධර්ම, මූලධර්ම සහ සදාචාරාත්මක ප්‍රමිතීන් නිර්මාණය කරන විට; රාජ්‍ය නිලධාරීන්ගේ අභිමතය සීමා කිරීමට සහ එම නිලධාරීන් ඔවුන්ගේ බලය සහ අභිමතය මූල්‍යමය හෝ සාධාරණත්වයේ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා නීති රීති සම්පාදනය කරන විට;
- අවසාන වශයෙන්, කාර්යය සාධනය සඳහා, රාජ්‍ය සම්පත් සහ ඔවුන්ගේ ආයෝජන බලය උපයෝගී කරගනිමින් රාජ්‍ය නිලධාරීන් අත්කර ගන්නා සැබෑ ප්‍රතිඵල පිළිබඳ අපේක්ෂාවන් අප විසින් අර්ථ දක්වන විට.


# දේශපාලනය හා පරිපාලනය පිළිබඳ වගවීම




සාමාන්‍යයෙන්, රජයේ කාර්යාලවල තනතුරු සඳහා වගවීම අදාළ වේ. මේවා නියෝජිතයින් හෝ වෙනත් ආයතනික භූමිකාවන් ආවරණය කරන පුරවැසියන්ගේ ආශයන්ගේ නාමයෙන් සහ උනන්දුවෙන් පොදු කටයුතු සමඟ කටයුතු කරන දේශපාලන තනතුරු හා රජය මැදිහත්කරණය සිදුකරනු ලබන පුරවැසියන් සමඟ සම්බන්ධතාවය පවත්වන පරිපාලන තනතුරු ද යන දෙකෙන්ම සමන්විත වේ. වගවීමේ දාමය අවස්ථා දෙකෙහිම වෙනස් වන අතර වගවීම ගන්නා ආකාරය ද එසේමය.

දේශපාලන වගවීම: ප්‍රජාතන්ත්‍රවාදී රටවල දේශපාලන වගවීම එක් අතකින් දේශපාලන නියෝජනයේ ස්වරූපය හා යාන්ත්‍රණයන් හා පුරවැසියන් ඔවුන්ගේ ව්‍යවස්ථාව හා සම්බන්ධ කිරීම මත රඳා පවතින අතර , අනෙක් අතට විධායක හා ව්‍යවස්ථාදායක බලතල අතර විධිමත් සම්බන්ධතාවය මත රඳා පවතී.

පරිපාලන වගවීම: පෙනෙන ආකාරයට වඩා සරල ය, මන්ද යත් එය යම් නිශ්චිත ශ්‍රම විභේදනයක් පවතින වඩාත් නිශ්චිත ධුරාවලි ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වන බැවිනි. එසේම පොදු තීරණ ගැනීමේ අන්තර්ගතය සහ ක්‍රියාවලිය යන දෙකම සහ එම නිසා පුද්ගලයන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය වඩාත් විස්තරාත්මකව විමසා බැලිය හැකිය. දේශපාලන හා පරිපාලනමය වගවීම පිළිබඳ තවත් අංශයක් තිබේ, රාජ්‍ය නිලධාරීන් මහජන යහපත සඳහා කොතරම් හොඳින් (හෝ අයහපත් ලෙස) ක්‍රියාත්මක වේද යන්න ගැනත්, ඔවුන්ගේ අධිකාරියේ තත්වය අනිසි ලෙස භාවිතා කරන්නේද යන්න ගැනත් සැලකිලිමත් වේ.




වගවීම යන්නෙන් සැලකිලිමත් වන්නේ බලයේ සිටින පුද්ගලයින් අතින් සිදුවන දූෂණය, අක්‍රමිකතා හෝ නීතිමය නුසුදුසුකම් සඳහා ඇති අවස්ථා අඩු කිරීම සඳහා ය. දේශපාලන හා පරිපාලන ආයතනවල බලය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා යාන්ත්‍රණයක් හා අභ්‍යන්තර උපකරණ මාලාවක් ඇත. නමුත්, අවසාන වශයෙන්, වගවීම වැඩිවශයෙන් රඳා පවතින්නේ වඩාත් සම්ප්‍රදායික නීතිමය උපකරණ සහ නීති පද්ධතියේ ක්‍රියාත්මක වීම සහ උසාවි මත ය.

යම් කිසි පුද්ගලයෙක් ප්‍රතිලෝම දෘෂ්ටිකෝණයකින් වගවීම සම්බන්ධයෙන් මිනිසුන්ගේ හඳුනා ගැනීම සළකාබලන විට (විශේෂයෙන් රාජ්‍ය පරිපාලනයේ දී) රාජ්‍ය නිලධාරීන් වගවීම සිදුවිය යුත්තේ "කාටද" යන ගැටලුව පැන නගී. ඉතා ආසන්න අර්ථයෙන් ගත් කළ රාජ්‍ය සේවකයින් දේශපාලනඥයින්ට හා එවකට පවතින රජයට සෘජුවම වගකිව යුතු බව පෙනේ. එහෙත්, රාජ්‍ය සේවකයින්ගේ දේශපාලන " ස්වාමිවරුන්ට" හෝ නිලබල ධුරාවලිය තුළ සිටින ඔවුන්ගේ ඉහළ නිලධාරීන්ට වගවීම සාධාරණීකරණය කළ හැක්කේ දිගු දාමයක කොටසක් ලෙස පමණි. අවසානයේදී ඔවුන් පුරවැසියන්ට සහ මහජනයාට විශාල වශයෙන් වගකිව යුතුය.

# වගවීමේ වර්ගීකරණය

## සදාචාරාත්මක වගවීම




ඔබේ වැරදිවලට අනුන්ට දොස් පැවරීමෙන් තොරව ඔබේ සහායකයින්ට සහ සේවාදායකයින්ට ගරු කිරීම, සහ ඔබ වැරැද්දක් කළ විට සමාව ඉල්ලීම සදාචාරාත්මක වගවීමේ කොටසකි. සංවිධාන සහ ඔවුන්ගේ සේවකයින් එකිනෙකාට වගකිව යුතුය. නිදසුනක් වශයෙන්, සේවකයෙකු යම් වැරැද්දක් කරන්නේ නම්, ඔවුන් වෙනුවෙන් සංවිධානයට නිල සමාව අයැදීමට සිදුවේ.

## මූල්‍යමය වගවීම



සංවිධානයක, මූල්‍යමය වගවීම සැලකිළිමත් වන්නේ හොඳ අයවැයක් නිර්මාණය කිරීම සහ අවම නාස්තියක් සහතික කිරීම සඳහා ය. සම්පත් කාර්යක්ෂමව වෙන් කිරීම මඟින් අතිරික්ත වියදම් නොමැති බව සහතික කෙරේ. ඔබගේ අයවැය ඉක්මවා යාමට වැඩි ඉඩක් ඇති නව ව්‍යාපෘතියක සැලසුම් අවධියේ සිටින විට මෙය ඉතා වැදගත් වේ. රජයේ ආයතන සහ ප්‍රජා සේවා සංවිධාන (CSO) කෙරෙහි මහජන විශ්වාසය හා විශ්වාසය ගොඩනැගීම සඳහා මෙය ඉතා වැදගත් වේ. මූල්‍ය වගවීම නොමැතිකම යහපාලනය, නීත්‍යානුකූලභාවය, මහජන සහයෝගය සහ විනිවිදභාවය යන මූලික සාරධර්ම විකෘති කිරීමට වැඩි ඉඩක් ඇත. එය රජයේ ආයතන සහ ප්‍රජා සේවා සංවිධාන (CSO) පිළිබඳ වැරදි වැටහීමක් ඇති කරනු ඇත.

## පුද්ගලික වගවීම





පුද්ගලික වගවීම යනු ඔබේ ක්‍රියාවන්ට වගවීම සඳහා ඔබ දැනුවත් තේරීමක් කරන ඕනෑම අවස්ථාවක්ය. මෙයින් අදහස් කරන්නේ ඔබේ තීරණ වලට වගවීම සහ එය ඔබගේ රැකියා ස්ථානයේ සහායකයින්ට බලපාන්නේ කෙසේද යන්නයි. ඔබ යම් වැරැද්දක් කළ විට, දොස් පැවරීම වෙනුවට සමාව ඉල්ලිය හැකිය. රැකියාවේදී එලදායී වීම සහ එය ඔබගේ ක්‍රියාවන්ගෙන් පිළිබිඹු කිරීම ආදිය පුද්ගලික වගවීමේ විෂය පථයට අයත් වේ.


## රාජ්‍ය වගවීම

රාජ්‍ය සම්පත් කෙරෙහි විශ්වාසය තබා ඇති නියෝජිත ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන්හි වගකීම්, මූල්‍ය හා ඒවාට පවරා ඇති සමාජ වගකීම්වලට පිළිතුරු සැපයිය යුතුය. මෙම සමාගම් සහ නියෝජිතායතන

මහජනයාට විශාල වශයෙන් වග කිව යුතු අතර ඔවුන්ගෙන් ඉල්ලා සිටින යුතුකම් වගකීමෙන් යුතුව ඉටු කළ යුතුය. රාජ්‍ය වගවීම යන්න ඕනෑම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක වැදගත් කුළුණකි. මහජන අරමුදල් සහ සම්පත් භාවිතා කරන සහ කළමනාකරණය කරන ඕනෑම මහජන ආයතනයක් පාර්ලිමේන්තුවට සහ මහජනතාවට වගකිව යුතුය. මෙය ප්‍රජා සේවා සංවිධාන (CSO) සඳහා ද අදාළ වේ. රාජ්‍ය වගවීම සහතික කරන ක්‍රියාවලීන් සහ පද්ධතීන් සම්බන්ධව ඔවුන් අවබෝධ කර ගැනීම සහ සහාය දීම වැදගත් ය.




**රාජ්‍ය වගවීම : සටහන - 01**




## සමාජ වගවීම

සමාජ වගවීම යනු ඡන්දය දීමෙන් ඔබ්බට ගිය පුළුල් පරාසයක ක්‍රියාමාර්ග සහ යාන්ත්‍රණයන් ය. එය පුරවැසියන්ට රාජ්‍යට වග උත්තර සැපයීමට තබා ගැනීමට හා ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීමට භාවිත කළ හැකි ය. එසේම මෙම උත්සාහයන් ප්‍රවර්ධනය කරන හෝ පහසුකම් සපයන රජයේ, සිවිල් සමාජයේ, මාධ්‍යයේ සහ වෙනත් සමාජ ක්‍රියාකරුවන්ගේ ක්‍රියාමර්ගද මෙයට අයත් වේ.




සමාජීය වගවීම රජයේ ප්‍රතිපත්ති සංවර්ධනයේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන්හි විනිවිදභාවය සහ ගුණාත්මකභාවය වැඩි කරයි. එය තවදුරටත් පුරවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට බාධාවක් වන පාලන ගැටළු විසඳීමේ ප්‍රධාන මූලධර්මය බවට පත්වේ. එසේ කිරීමෙන් රජයට ඔවුන්ගේ පුරවැසියන්ගෙන් යෝජනා ලැබෙන අතර තීරණාත්මක ගැටලු නිර්වචනය කිරීම, ඒවායේ මූල හේතූන් ගවේෂණය කිරීම සහ ඒවාට අදාළ විසඳුම් ක්‍රියාත්මක කිරීම කළ හැකිය (ලෝක බැංකුව). එසේම ප්‍රජා සේවා සංවිධාන (CSO) සාමය, සංහිඳියාව, තිරසර සංවර්ධන ඉලක්කයන්, සමාජ සහජීවනය,


සංවර්ධනය, දූෂණය සහ ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම වැනි කරුණු සඳහා ප්‍රජා මට්ටමින් සමාජ වගවීම වෙනුවෙන් පෙනී සිටිය යුතුය.

## සමාජ වගවීම පිළිබඳ බහුලව භාවිතා වන වෙනත් අර්ථ දැක්වීම්:

සමාජ වගවීම පැන නගින්නේ පුරවැසියන් සහ සිවිල් සමාජ සංවිධානයන් විසින් රජය සැලකිල්ලට ගැනීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග මෙන්ම රජය සහ අනෙකුත් ක්‍රියාකාරීන් (මාධ්‍යය, පෞද්ගලික අංශය, පරිත්‍යාගශීලීන්) මෙම ක්‍රියාවන්ට සහාය දැක්වීමට දරන උත්සාහයෙනි. එය මහජනතාවගේ ආශයන් පිළිබද අතිරේක සුපරීක්ශනයක් හා සමබරතාවයක් රජය වෙත සපයයි.

සමාජ වගවීම යනු සේවා සැපයීම, ප්‍රජා සුභසාධනය වැඩිදියුණු කිරීම සහ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මහජන සම්පත් භාවිතා කරන විට රාජ්‍ය නිලධාරීන්, දේශපාලනඥයින් සහ සේවා සපයන්නන්ගේ කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා පුරවැසියන් සහ රජය අතර පවත්නා ඵලදායී ලෙස සම්බන්ධ වීමේ ක්‍රියාවලියකි.

**"සමාජ වගවීම" යන සංකල්පය පරිවර්තනය කර පුළුල් ලෙස භාවිතා කර ඇත.**




## සමාජ වගවීමේ භාවිතයේ පොදු අංග




- පාර්ශවකරුවන් ඵලදායී ලෙස සම්බන්ධ වීම, විරුද්ධත්වයකින් තොර සහයෝගීතාවයේ හැඟීම සලකුණු කරයි. සමාජ වගවීමේදී, හොඳ පුරුදු හඳුනා ගැනීම සහ පවත්වා ගැනීම සහ තවදුරටත් දියුණුව සඳහා පවත්නා ගැටළු සහිත ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා සමාන අවධාරණයක් ඇත.
- රජයේ පාර්ශවකරුවන් සහ ඔවුන් නියෝජනය කරන පුද්ගලයින් සහ පුරවැසියන් හෝ ඔවුන්ගේ අවශ්‍යතා නියෝජනය කරන කණ්ඩායම් (උදා. සිවිල් සමාජය) අතර හවුල්කාරිත්වය වේ. පුද්ගලික අංශය, කර්මාන්ත විශේෂඥයන්, රාජ්‍ය සේවා සපයන්නන් සහ මාධ්‍ය වැනි වෙනත් පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් සමාජ වගවීමේ මුලපිරීම්වල බලපෑම වැඩි කරන බවට පුළුල් උපකල්පනයක් තිබේ.
- ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් සඳහා පදනමක් ලෙස සාක්ෂි සහ මෙවලම් භාවිතා කිරීම. සාමාන්‍යයෙන් මෙවලම් සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රමවේදයන් සම්බන්ධව සියලු දෙනා එකඟ

වන අතර, සේවා සැපයීමේ වඩාත් තාක්ෂණික අංශවලට (උදා: සුභසාධනය සඳහා වියදම් අධීක්ෂණය කිරීම) සංජානනය හෝ තෘප්තිමත් දත්ත (උදා., පොදු සේවාවන් පිළිබඳ පුරවැසි ප්‍රතිපෝෂණය) සමඟ කටයුතු කළ හැකිය.

- විශේෂයෙන් ගැටළු විසඳීමේ මෙවලමක් ලෙස භාවිතා කරන විට, ස්වාභාවිකවම සිදුවන ක්‍රියාවලීන් තුළට කාවැද්දීම ඉතා සුදුසුය. මේ සඳහා, නිශ්චිත සේවා සැපයුම් නිකුතුවක ස්වාභාවික ක්‍රියාකරුවන් වන්නේ සේවයෙන් ප්‍රතිලාභ ලබන හෝ ලබා ගන්නා අයයි. පාසල් සම්බන්ධයෙන් ගත් කල, මෙය දෙමාපිය-ගුරු සංගම් සහ සිසුන් විය හැකිය; ප්‍රාදේශීය රෝහල සම්බන්ධයෙන් ගත් කල, එය එක් එක් රෝහල අවට සිටින ආසන්නතම ප්‍රජාව විය හැකිය.

## ප්‍රජාතන්ත්‍රවාදය සහ මහජන වගවීම



වඩාත් ඵලදායී වගවීමක් සඳහා වන ඉල්ලීම් දේශපාලන වගවීම පිළිබඳ මෙවලම් පුළුල් කිරීමට නැඹුරු වී ඇති අතර, දේශපාලන ක්‍රියාපටිපාටීන් හා තීරණ ගැනීමේදී ක්‍රියාත්මක කළ හැකි ක්‍රම සොයමින් සිටී. ඒවා හුදෙක් පශ්චාත් කාලීන කාරණා නොවේ.එවැනි ව්‍යාප්ති ක්‍රියාවලියක දී ප්‍රවණතා තුනක් නිරීක්ෂණය කළ හැකිය.

- පළමුවැන්න පරිපාලන විනිවිදභාවය සහ පුරවැසියන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය යන දෙකටම ලබා දී ඇති වැදගත්කමයි. තීරණ ගැනීමේ ක්‍රියාවලිය මහජන පරීක්ෂාවට ලක් කිරීමෙන් මහජනතාවගේ අභිමතය පරිදි කටයුතු කිරීමට නියෝජිතයින්ට සහ රාජ්‍ය නිලධාරීන්ට බල කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ

- දෙවැන්න නම් පුරවැසියන්ගෙන් වඩාත් සෘජු පාලනයක් හෝ පුරවැසියන් ඒ හා සම්බන්ධ කිරීමට මෙවලමක් හඳුන්වාදීමයි.

- වගවීම පුළුල් කිරීමේදී ගත් තුන්වන මාවත නම්,දූෂණය මැඩපැවැත්වීමේ සහ පොදු කටයුතුවල පෞද්ගලික උනන්දුව නියාමනය කිරීමේ ක්‍රමයක් ලෙස හැසිරීමේ දැඩි ප්‍රමිතීන් හඳුන්වාදීම සහ විවිධ අවශ්‍යතා ලේඛනයන් සංවර්ධනය කිරීමයි.

## වගවීම ඉහළ නැංවීමේදී රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යභාරය

නව වගවීමේ පාලන තන්ත්‍රයන් තුළ රාජ්‍ය නොවන සංවිධාන (NGO) විසින් ඉටු කරන කාර්යභාරයට, අධිකාරි නොවන ආයතන හසු කර ඇති "වගවීමේ කවය" ද අදාළ ය. ඊනියා තුන්වන අංශය, විශේෂයෙන් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ උපදේශන සංවිධාන ස්වරූපයෙන්, පුද්ගලයින්ගේ සහ කණ්ඩායම්වල අයිතිවාසිකම් ගැන සැලකිලිමත් වන හෝ පාරිසරික තිරසාර බව වැනි ජාත්‍යන්තර පොදු දේපල අවධානමට ලක්ව ඇති ක්ෂේත්‍ර ගණනාවකට අදාළව රජයන්හි සහ අන්තර් රාජ්‍ය ආයතන දෙකේම ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීමේ කාර්යය වැඩි වැඩියෙන් භාරගෙන ඇත. වගවීමේ මෙවලමක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යභාරය වඩාත් කැපී පෙනෙන බැවින්, ඔවුන් වගවීම පිළිබඳ නව ඉල්ලීම් වලට භාජනය වී ඇත. ඔවුන් සඳහා මුදල් සපයන්නේ කවුරුන්ද, ඔවුන්ගේ සාමාජිකත්වය, ඔවුන්ව මෙහෙයවන වෘත්තීය සේවකයින් හෝ රාජ්‍ය නොවන සංවිධාන වල ක්‍රියාකාරකම් වල අරමුණු

වන පුද්ගලයින් කෙසේ වෙතත්, "මුදල් නීතී කරුවන්" කවුරුන්ද යන්න හඳුනා ගැනීමේ සංකීර්ණ මෙහෙයුමට සම්බන්ධ වේ.




සංවර්ධනය වෙමින් පවතින රටවල, රාජ්‍ය නිලධාරීන් සඳහා වගවීම පිළිබඳ මූලික අර්ථයක් වන්නේ නීති රීතිවලට අනුකූල වීමයි, නමුත් මෙම නීතිමය බැඳීම ඉදිරි පියවර ගැනීම සඳහා මූලික පදනමක් පමණි.මීළඟ මට්ටම රාජ්‍ය සේවය සිදු කිරීමේදී රාජ්‍ය නිලධාරීන්ට ආචාර ධර්ම ස්වභාවයක් අවධාරණය කිරීම විය හැකිය. මෙම අනුව, වැරදි කිරීම සහ අසමත් වීම සඳහා වන දඬුවම් සාමාන්‍යයෙන් බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල වගවීමේ ක්‍රමයේ ප්‍රතිරූපය පිළිබිඹු කරයි.

සමාජයක් පරිණත හා ප්‍රජාතන්ත්‍රවාදී වූ විට, වඩාත් නවීන මට්ටමේ වගවීමක් අවශ්‍ය වේ. සරලවම රාජ්‍ය නිලධාරීන්ට නීත්‍යානුකූල වීම ප්‍රමාණවත් නොවේ. රාජ්‍ය නිලධාරීන් නීත්‍යානුකූල හා සදාචාරාත්මක වශයෙන් අවශ්‍ය දේට වඩා බොහෝ දේ කළ යුතුය. එපමණක් නොව වගවීම ස්ථාවර සංකල්පයක් නොවේ. රාජ්‍ය නිලධාරීන් ඊට වඩා උසස් මට්ටමේ රාජ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු අතර පිළිතුරු සැපයීම ප්‍රවර්ධනය කිරීම, ප්‍රතිචාර දැක්වීම වැනි මහජන වගවීම සම්බන්ධ ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය. වගවීම ආයතනික සංස්කෘතිය තුළට ඇතුළත් කළ යුතුය.

මහජන වගවීම ප්‍රවර්ධනය කිරීමේදී විශාල බාධාවන් තිබේ. බොහෝ අවස්ථාවන්හිදී, "මහජන වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශය වගකිව යුතු නමුත් එසේ කිරීමේදී එය බොහෝ අභියෝග හා බාධාවන්ට මුහුණ දෙයි. වඩාත්ම බරපතල අභියෝග වන්නේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල පරිවර්තනීය නායකත්වය සහ දේශපාලන අභිමතයක් නොමැති වීමයි.

## වගකීම සහ වගවීම

වගකීම යනු සදාචාරාත්මක සංකල්පයක් වන අතර එයට පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට සදාචාරාත්මකව පදනම් වූ වගකීම් සහ යුතුකම් ආචාරධාර්මික හා සදාචාරාත්මක කේත, ප්‍රමිතීන් හා සම්ප්‍රදායන් අයත්ය. තීරණ ගන්නන් විසින් ගනු ලබන තීරණ කරනු ලබන කාර්යභාරයන් මඟින් එම භූමිකාවන් හා සම්බන්ධ ඇතැම් කාර්යයන් ඉටු කිරීමේ වගකීම ගම්‍ය වේ. වඩාත් නිශ්චිතව කිවහොත්, වගකීම යනු භූමිකාවක මූලික කාර්යයට වඩා වැඩි යමක්ය. එය ක්‍රියාවලි සහ ප්‍රතිඵල යන දෙකම ඇතුළත් වන එම ශ්‍රිතයේ විවිධ පැතිකඩයන් සහ එම බැඳීම් සමූහයේ කොටසක් ලෙස සිදු කරන ලද ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාක ගැන සඳහන් කරයි. වගකිවයුතු ක්‍රියාදරයකු රැකියාව නිම කිරීම සඳහා කලින් තීරණය කළ යුතු බැඳීම් සමූහයක් සමඟ සම්බන්ධ විය හැකි අයෙකු ලෙස දැකිය හැකිය.

වගවීම යනු කෙනෙකුගේ විනිශ්චය, අභිප්‍රායන් සහ ක්‍රියාවන් සඳහා පාර්ශවකරුවන්ට පැහැදිලි කිරීමක් හෝ සාධාරණීකරණයක් දීමට ඇති සූදානම හෝ සූදානමයි. කෙනෙකුගේ ක්‍රියාවන් අන් අය විසින් විනිශ්චය කිරීමට සූදානම් වන අතර සුදුසු අවස්ථාවන්හිදී වැරදි, වැරදි තීන්දු සහ නොසැලකිලිමත්කම සහ නිපුණතාව, හෘද සාක්ෂිය, විශිෂ්ටත්වය සහ ප්‍රඥාව සඳහා වගකීම





පිළිගැනීමට සූදානම් වීමයි. වගකීම භූමිකාවක් හා බැඳුණු බැඳීම් සමූහයක් ලෙස අර්ථ දැක්වුවද, වගකීම පිළිගැනීම යනු පිළිගත් වගකීමක් සමඟ සාමාන්‍යයෙන් සම්බන්ධ වූ ක්‍රියාවක් සඳහා යමෙකුට දොස් පැවරීම හෝ ගෞරවය දීම ලෙස අර්ථ දැක්විය හැකිය. වගකිව යුතු ක්‍රියාකරුවා සුදුසු සදාචාරාත්මක ප්‍රමිති සමඟ අනුකූල වීම, පවත්වා ගැනීම සඳහා ප්‍රතිචාරාත්මක ගැලපීම් බාහිරව අභිප්‍රේරණය කිරීම අරමුණු කරගත් බාහිර අධීක්ෂණය, නියාමනය සහ දඬුවම් කිරීමේ යාන්ත්‍රණයන්ගෙන් රැඳවා තබා ගනී.

හතරවන මොඩියුලය

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පාලනය



## හතරවන මොඩියුලය 04

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පාලනය

## හැඳින්වීම

මෙම මොඩියුලය ඉලක්ක ගතවන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ පාලනය අතර පවතින සබඳතාවය විස්තර කිරීමට වන අතර පුහුණුව අවසානයේ සහභාගීවූවන්ට, ප්‍රජාව ඇතුළු සියලු මට්ටම් හි පාලන ක්‍රියාවලීන් තුළට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ වැදගත්කම අවබෝධ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. විධිමත් හා අවිධිමත් තීරණ ගැනීමේ ව්‍යුහය තුළ කාන්තා හා පුරුෂ සහභාගීත්වය රටවල් අතර බොහෝසෙයින් වෙනස් වන නමුත්, සාමාන්‍යයෙන් එය පුරුෂ හිතවාදී බවක් පෙන්නුම් කරයි. ආයතනික වශයෙන් මෙන්ම සංස්කෘතික, ආර්ථික සහ සාමාජීය කරුණු ඔස්සේ තීරණගැනීම සහ පාලනය තුළට සහභාගීවීමට කාන්තාවන්ට පවතින අවස්ථාවන් සහ හැකියාවන් සීමා කර ඇත.

දේශපාලන නියෝජනය සහ රාජ්‍ය ආයතනයන් තුළ කාන්තාවන්ගේ නියෝජනය අවම මට්ටමක පැවතීම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතා දර්ශකයක් වශයෙන් භාවිත වේ. කාන්තාවන්ගේ මෙම අවම මට්ටමේ නියෝජනය දේශපාලන අවකාශය තුළ පමණක් නොව පෞද්ගලික අංශය, ග්‍රාමීය මට්ටම සහ සිවිල් සමාජය ආශ්‍රිත තීරණගැනීමේ ක්‍රියාවලිය තුළ ද පවතින්නකි. දේශීය මට්ටමේ දී, පුරුෂයන් සාමාන්‍යයෙන් බලවත් තනතුරු එනම්, ආගමික සහ සම්ප්‍රදායික නායකයන්, දේශීය දේශපාලකයන් සහ ග්‍රාමීය වැඩිහිටියන් ආදී වශයෙන් ආධිපත්‍ය දරයි.




කාන්තාවන්ගේ නියෝජනය සහ නායකත්වය, සමාජ සුබසාධනය වැනි සම්ප්‍රදායික 'ස්ත්‍රීවාදී' ක්ෂේත්‍රයන්ට සීමා කිරීමේ ප්‍රවණතාවයක් පවතී. අවිධිමත් තීරණගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ නියෝජනය බොහෝවිට විධිමත් තත්ත්වයන් හා ව්‍යුහයන් හි ඔවුන්ගේ නියෝජනයන්ට වඩා පොදුවන නමුත්, එය සැඟවීමේ ප්‍රවණතාවයක් පැවතීමෙන් ඔවුන්ව ඉහළ අගය කිරීමකට ලක් නොවේ. දේශීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැඹුරින් විමසා බැලීමේ දී, විධිමත් සහ අවිධිමත් තීරණගැනීමේ ව්‍යුහය තුළට විශේෂයෙන්, රාජ්‍ය ආයතනයන් තුළ කාන්තාවන් සහ පුරුෂයන් සමානාත්මතාවයෙන් යුතුව සහභාගී කරවාගැනීම සුරක්ෂිත කිරීම ඉතා වැදගත් වනුයේ ඔවුන්ගේ ජීවිතවල සමස්ත පැතිකඩයන් බලාත්මක කිරීමට ඒ තුළින් හැකිවීම නිසාවෙනි. ජනවාර්ගික කණ්ඩායම්, සමාජ-ආර්ථික තත්ත්වයන්, ආගම, නොහැකියාව සහ ලිංගික දිශානතීන් හා සම්බන්ධ වෙනස්කම්කොට සැළකීම් මඟින් පුරුෂ සහ කාන්තා යන දෙපාර්ශවය සඳහා, තීරණගැනීමේ පටිපාටිය තුළ අසම මට්ටමේ සහභාගීත්වයක් සහ නියෝජනයක් ඇතිවීමට හේතු වී ඇත.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ පාලනය



පාලනය , දේශපාලන සහභාගීත්වය ලෙස පමණක් අර්ථවිග්‍රහ නොවන නමුත්, එය රටේ සබඳතාවයන් හැසිරවීමේ දේශපාලන, ආර්ථික සහ සංවිධානාත්මක අධිකාරීමය පුහුණුවකි. එසේම, පුරවැසියන් සහ කණ්ඩායම් විවිධ යාන්ත්‍රණයන්, ක්‍රියාවලීන් සහ ආයතනයන් හරහා ඔවුන්ගේ ආශාවන් මෙන්ම ඔවුන්ගේ නීත්‍යානුකූල හිමිකම් ලබාගැනීම, ඔවුන්ගේ බැඳීම් සමඟ මුසුවීම සහ ඔවුන්ගේ වෙනස්කම් සඳහා මැදිහත්වීම යනාදියෙන් ද එය සමන්විත වේ" යනුවෙන් නිර්වචනය කළ හැකි ය. මෙම නිර්වචනයෙන් පැහැදිලි වනුයේ, දේශපාලන සහ ආර්ථික ක්‍රියාවලීන් තුළ විධිමත් සහ අවිධිමත් සහභාගීත්වය සහ මැදිහත්වීම ඔස්සේ රජයේ, සිවිල් සමාජයේ, රාජ්‍ය නොවන සංවිධානයන් හි සහ අනෙකුත් ආයතනයන් හි භූමිකාව සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේ අවශ්‍යතාවය යි.



පාලනය, රාජ්‍ය ක්ෂේත්‍රයට පමණක් අයත්වූවක් නොවේ. එය, පුද්ගලික අවකාශය සඳහා ද ප්‍රතිඵලදායක වන අතර එමඟින් පුද්ගලයන්ගේ සෞඛ්‍ය සහ නීත්‍යානුකූල හිමිකම් සුරැකීම හෝ කාන්තාවන් බලාත්මක කිරීමට හිතවාදී සුබසාධන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම; උදා: මෙම පුද්ගලයන්ට පොදු අවකාශය තුළ ද ක්‍රියාකාරී භූමිකාවක් ඉටුකළ හැකි බව සහතික කිරීම, ආදී ප්‍රතිපත්තීන් පවතී. එමනිසා, පාලනය, රාජ්‍ය සහ පුද්ගලික යන අවකාශයන් දෙක හරහාම දිවයයි. මෙහිදී තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ අවධානය යොමු කළහොත්, දේශීය, උප-ජාතික සහ ජාතික මට්ටමේ පටන් පාලනය තුළට කාන්තාව ඇතුළත් කරගැනීම සම්බන්ධයෙන් රජය වැඩි අවධානයක් යොමුකළ යුතු ය. රාජ්‍ය ආයතනයන් තුළ කාන්තාවන් සඳහා සමාන අවකාශයන් නිර්මාණය කිරීමකින් තොරව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය කරා ළඟා විය නොහැක.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතාවය සහ පාලනය




ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය රඳාපවතිනුයේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී පාලනයක් මත වන අතර, සාමාන්‍යයෙන් කාන්තාවන් මහජන අවකාශයෙන් ආන්තීකරණය වී ඇති බවට දැනෙන හැඟීම සහ පරිපාලනය තුළින් ඔවුන්ව බලාත්මක කිරීම සඳහා ක්‍රියා නොකිරීම හෝ පාලනය තුළට ඈඳා නොගැනීම ඉහත තත්ත්වයට බාධා ඇති කරයි. විශේෂයෙන්ම, ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී පාලනයක් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට ඔවුන් පියවර නොගනී. මෙහි ප්‍රතිඵල වශයෙන්, නීති, ප්‍රතිපත්ති සහ රාජ්‍ය ආයතනයන් මඟින් සමස්ත පුරවැසියන්ගේ අවශ්‍යතා වෙත අවධානය යොමු නොකරන අතරම ප්‍රගතියේ වර්ධනයට සහ කාන්තාවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට ඔවුන් උපකාර නොකරයි. එමනිසා, පාලනය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා, සිවිල් සමාජයට උපදේශනය සහ සාමූහික ක්‍රියාදාමයන් ඔස්සේ අති විශාල භූමිකාවක් රඟදැක්වීමට සිදු වී ඇත.


LET US WORK FOR SOCIAL CHANGE ISD

## පාලනය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සුරක්ෂිත කිරීමට සිවිල් සමාජයේ සහභාගීත්වය




සිවිල් සමාජය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මූලික කරගත්තක් බව බොහෝවිට අමතක කර ඇත. එබැවින්, ගෘහස්ථය ඒකකයක් වශයෙන් විශ්ලේෂණය කර ඒකාබද්ධ කිරීමට අසමත් වී ඇති අතරම එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන්ගේ ගෘහීය වගකීම් හේතුවෙන් ඔවුන්ගේ කාලය සහ නිවසින් පිටත කටයුතුවල නියැලීමට යොදවන ශක්තිය උදෙසා වන බලපෑමට අගයක් ලබාදීමට අමතක කර ඇත. සිවිල් සමාජයේ සහභාගීත්වය සම්බන්ධයෙන් අවබෝධ කරගැනීමට, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සරල විශ්ලේෂණයන් ගෙන් ඔබ්බට විමසාබැලීම මෙන්ම අසමානතාවයන් බිඳ දැමීම පිළිබඳ විශ්ලේෂණයක් මඟින් විග්‍රහකර බැලීම සිදුකළ හැකි ය. කාන්තාවන් සහ පුරුෂයන් අතරින් කුමන පාර්ශවයට සහභාගීත්වය ලබාගත හැකි ද යන්න අවබෝධ කරගැනීමේ දී අනාවරණය වනුයේ ඇතැම් පුරුෂ කණ්ඩායම්වලට අනෙකුත් කාන්තා කණ්ඩායම්වලට වඩා සහභාගිවීමේ හැකියාව පවතින බවයි. මෙවැනි ළඟා වීමකට අපහසු කණ්ඩායම්වලට වැඩසටහන්වල මැදිහත්වීම ඔස්සේ උපදේශනයන් සැපයීම වැනි ක්‍රියාවන් සිදුකළ හැකි ය. පාලනය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ වැදගත්කම පිළිබඳව පළමුවෙන්ම සිවිල් සමාජ මට්ටමේ සිට දැනුවත් කර මහජන සහයෝගය ඒකරාශී කරගැනීමට කටයුතු කළ යුතු ය. මෙම අදහස සම්බන්ධයෙන් ගැඹුරට විමසාබැලීමේ දී පැහැදිලිවනුයේ, ප්‍රජා මට්ටමේ සිට ප්‍රතිපත්ති සහ ආයතනික වෙනස්කම් සිදුකිරීම සඳහා උපදේශනය සැපයීමට සහයෝගය ලබාදිය යුතු බව යි.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණය




මෙම මාතෘකාව ලෝකය තුළ දැඩි අවධානයක් ලබාගෙන තිබෙන නමුත්, ලංකාව තුළ මෙම වැදගත් මාතෘකාව සම්බන්ධයෙන් ඉහළ කතිකාවතක් මතු වී නොමැත. එමනිසා, රට තුළ කාන්තාවන් විසින් මුහුණපාන විවිධ ආකාරයේ ගැටළු ආමන්ත්‍රණය කිරීමට අදාළ සහයෝගය ලබාදීමේ දී, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය පිළිබඳ ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රජා සේවා සංවිධානයන් CSO ට විශාල භූමිකාවක් රඟදැක්වීමට සිදු වේ. මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණය සම්බන්ධ අදහස (1990) ගණන්වල වර්ධනය වූ අතර, ඒ හරහා සිවිල් සමාජය තුළ අයවැය කටයුතු පිළිබඳ වැඩි අවධානයක් යොමුවිය. එය පවත්වාගෙන යනුයේ, කාන්තාවන් සහ පුරුෂයන්, පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන් සහ කාන්තා හා පුරුෂ, පිරිමි සහ ගැහැණු ළමුන් හා සම්බන්ධ විවිධ කණ්ඩායම් සඳහා වෙනස් වූ ප්‍රතිඵලයන් පවතින රාජ්‍ය ප්‍රතිපත්ති, වියදම් සහ ආදායම් යන පරිශ්‍රයන් මඟිනි. මෙවැනි කණ්ඩායම්වලට විවිධ අවශ්‍යතා සහ අභිලාෂයන් පවතී. මුල් අවස්ථාවේ දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය මඟින් විවිධ කණ්ඩායම් සඳහා විවිධ ප්‍රතිඵලයන් පිළිබඳ තක්සේරුවක් සපයයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සැළකිලිමත් බව සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීමට වෙන් වූ අයවැයක් පිහිටුවීම මෙහි ඉලක්කය නොවන නමුත්, පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල වඩාත් හදිසි අවශ්‍යතා තෘප්තිමත් කිරීමට සාධාරණ වූ අයවැයක් පිළිබඳ සහතික කිරීමක් රජයේ මෙමඟින් අපේක්ෂා කරයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය හුදෙකලා වූ සංසිද්ධියක් නොවන අතර, එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රධාන ධාරාවේ ඉතා වැදගත් දෘෂ්ටියක් සහ මහජන මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන්

වඩාත් කාර්යක්ෂම වූවක් වේ. එය, අයවැයේ අන්තර්ගතය වෙත පමණක් නොව නොපෙනෙන මට්ටමේ පවතින ප්‍රතිපත්ති ක්‍රියාවලිය විශේෂයෙන් අන්තර්ගතය, විනිවිදභාවය සහ වගවීම සම්බන්ධයෙන් ද අවධානය යොමුකරයි. සහභාගීත්ව අයවැයකරණ මූලපිරීම්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණය මෙන්ම අයවැයකරණ ක්‍රියාවලිය තුළ සිවිල් සමාජයේ සහභාගීත්වය සඳහා ද අදාළ ආධාරක උපකරණයක් බවට පත්ව තිබේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණය සඳහා සිතීමේ සහ භාවිතයේ එනම් අයවැය සැළසුම්කරණ සහ ක්‍රියාත්මක කරන ආකාරයේ වැදගත් වෙනසක් ඇතිකිරීම අවශ්‍ය වේ. මෙම අයවැය ක්‍රියාවලිය පෘථුල පරාසයක විහිදෙන පාර්ශවකාර කණ්ඩායම්වලට විවෘත කිරීම, සමානාත්මතාවයට මූලිකත්වය ලබාදීම සහ ප්‍රජා උපදේශනය ආදිය ඊට ඇතුළත් අපේක්ෂා සහගත මූලපිරීම් වේ.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක ආදායම්



බොහෝ සිද්ධීන් තුළ, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණ වියදම් අංශය (ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සුවිශේෂී ලෙස බලපෑම් සිදුකරන රාජ්‍ය වියදම් තක්සේරුකිරීම) වෙත අවධානය යොමුකරයි. නමුත්, ආදායම් අංශය වෙත ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැයකරණය ආරූඪ කරන ආකාරය පිළිබඳ අවම මට්ටමින් නිර්වචනය කර ඇත. රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ආදායම සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය බලපෑම් සම්බන්ධයෙන් පූර්ණ අවබෝධයක් ලබාගැනීමට මෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අගතීන් අනාවරණයට සහ ආමන්ත්‍රණයට රාජ්‍ය ආදායම, වියදම ඔස්සේ විශ්ලේෂණය කළ යුතු ය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ආදායම් විශ්ලේෂණයේ අරමුණ වන්නේ: 'මූල්‍ය සම්පත් ප්‍රමාණවත් ලෙස ගලායාම හඳුනාගැනීම සහ අධීක්ෂණය ඔස්සේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ආදාන පරම්පරාවට, කාන්තාවන්ට සහ පුරුෂයන්ට මෙන්ම ගැහැණු සහ පිරිමි ළමුන්ට ළඟා කරගත හැකි අයුරින් වැඩසටහන් සහ සේවාවන් මඟින් ද සමානව එහි වාසි බෙදීයාම යි.'

## රාජ්‍ය-නොවන ක්‍රියාකාරීන්ගේ මැදිහත්වීම






ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණය සඳහා රජයේ විධායකයින්ගෙන් පිටත ක්‍රියාකාරකයින්ගේ මැදිහත්වීම, එවැනි කටයුතු සඳහා සහයෝගය ලබාදීමේ දී වැදගත් වන අතර මූල්‍ය ප්‍රතිපත්තිය විපර්වර්තනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන ගම්‍යතාවය තිරසර කිරීම සඳහා ද වැදගත් වේ. පාර්ලිමේන්තුව සහ සිවිල් සමාජය තුළ ගෙනයන ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැය කටයුතු සඳහා රජය මුදල් වෙන්කිරීමේ දී පර්යේෂණ සහ උත්සාහයන් මඟින් බලපෑම් කිරීමට ඇති හැකියාව මීට අයත් වේ.

මෙය විනිවිදභාවය, වගවීම සහ සිවිල් සහභාගීත්වය පිළිබඳ අරමුණු පුළුල් කිරීමට දායක වේ. සිවිල් සමාජය සහ පාර්ලිමේන්තුව අතර පවතින සහයෝගීතාවය, ප්‍රචාරණ සහාය සඳහා සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණ මූලපිරීම් ක්‍රියාත්මක කිරීම් කාර්යක්ෂම කිරීමට උපකාරී වේ. තවදුරටත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිචාරාත්මක අයවැයකරණය රජය විසින් පමණක් නොව රාජ්‍ය නොවන සංවිධාන, පදනම් සහ අනෙකුත් පෞද්ගලික අංශ සංවිධාන සඳහා ද යොදාගත හැකි ය.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය බෙදාහැරීම සඳහා පාලනය ගැටළුවක් බවට පත්වන්නේ ඇයි?

මහජන ජීවිතය තුළ ඉතිරිව පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පරතරය අවසන් කිරීමට, ප්‍රතිපත්ති සැකසීමට සහ මහජන සේවා බෙදාහැරීමට අදාළ විළඹුම් ප්‍රමාණාත්මකව ඉහළ දැමීමට සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවයේ ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණයට රජය කාර්යක්ෂම විළඹුම් යොදාගත යුතු ය. මේ සඳහා, පහත දැක්වෙන කරුණු වැදගත් වේ.

- **ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා යහපාලනය සහ වගවීම;**
- **බලය පවතින සමස්ත ශාඛාවන් හි නායකත්වය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පරතරය අවසන් කිරීම; සහ**
- **රාජ්‍ය සේවය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය.**

වර්ධනය සඳහා හේතුවන මූලය ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සම්බන්ධයෙන් ගෝලීය දැනුවත් බවක් ඇතිවෙමින් පවතී. පුරුෂ සහ කාන්තා දෙපාර්ශවයට මහජන සහ ආර්ථික අවස්ථාවන් සඳහා සමාන ප්‍රවේශයන් සැපයීම, වඩා තිරසාර ආර්ථිකයක් සහ ජාතික සුබසාධනයේ වැඩිදියුණුව සම්පූර්ණ කිරීමට අත්‍යාවශ්‍ය වේ. එසේ කිරීමට අසමත්වීමෙන් අදහස්වන්නේ, දළ වශයෙන් අඩක් පමණ පුරවැසියන්ගේ මානව ප්‍රාග්ධනය සහ වර්ධනය සහ ජාතික සංවර්ධනය සඳහා රටවල් හි පූර්ණ විභවතාවයත් අහිමිවන බව යි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතා ප්‍රතිඵල බෙදාහැරීමේ ප්‍රමුඛයා වනුයේ පාලනය යි. අර්ථාන්විත වෙනසක් ඇතිකිරීම සඳහා සම්බන්ධීකරණයක්, තරඟකාරිත්වයක්



සහ සමස්ත රජයේ ප්‍රබල කැපකිරීමක් අවශ්‍ය වන අතර රාජ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන්, සේවාවන් සහ පුරුෂ සහ කාන්තා දෙපාර්ශවයට වාසි සහගත අයවැයක් ඇති කළ හැකි පරිදි රාජ්‍ය ආයතනයන් තුළ සහ ඒ හරහා පැහැදිලි සහ කාර්යක්ෂම යාන්ත්‍රණයක් ඇතිකිරීම අවශ්‍ය වේ.

සියලු ආයතනයන් සහ ප්‍රතිපත්ති අංශයන්, ඔවුන් සියලුදෙනා කාන්තා සහ පුරුෂයන් වෙත ඔවුන්ගේ විවිධ තත්ත්වයන් නිසා විවිධ මාර්ගයන් ඔස්සේ බලපෑම් කරන්නන් වශයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ගණනය කරනු ලබයි. මේනිසා, රජය හරහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රධාන ධාරාව පිළිබඳ සැළකිලිමත්බව ඇතිකිරීම තුළින්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස්කම්කොට සැළකීම මුලිනුපුටා දැමීමේ අපේක්ෂාව රට තුළ සහ එහි සමාජය තුළ ප්‍රධාන අංගයක් බවට පත් වේ. රටක් සහ ප්‍රජා සේවා සංවිධාන (CSO) වශයෙන් මෙය ළඟා කරගැනීමට මැදිහත්වියහැකි වැදගත් කරුණු පහත දැක් වේ.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා වන පාලනයේ දුරස්ථ ඉලක්කයක් පවතී: ඉතිරිව ඇති අභියෝග මොනවා ද?**

බොහෝ සංවර්ධිත රටවල්, මහජන ජීවිතය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය බෙදීම අවසන් කිරීම සම්බන්ධයෙන් සැළකිය යුතු මට්ටමේ ප්‍රගතියක් අත්කරගෙන ඇත. කෙසේවෙතත්, ප්‍රතිපත්ති සැකසීම සහ මහජන පාලනය මෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සාධාරණ ප්‍රතිපත්ති ප්‍රතිඵල කාර්යක්ෂමව ලබාග ැනීමට පූර්ණ සන්නද්ධ රජයන්වුවද සමානාත්මතාවය ප්‍රමුඛ කරගැනීම අවශ්‍ය වේ. තීරණ ගැනීමේ ප්‍රවේශයන් සහ නායකත්ව අවස්ථාවන් තුළ කාන්තාවන් තවමත් පුරුෂයන්ට පිටුපසින් සිටී. එමනිසා, පුහුණු සැසිය තුළ, පහත දැක්වෙන ප්‍රශ්න විස්තරාත්මකව සාකච්ඡා කිරීමෙන් සහභාගීවූවන්ට පාලනය තුළට ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ගෙනඒමේ දී පවතින මූලික බාධාවන්, අභියෝගයන් සහ ගැටළු මොනවාද යන්න සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලැබේ.

කාන්තාවන්ට සහ පුරුෂයන්ට සමානව තීරණගැනීමට සහභාගී වියහැක්කේ සහ දේශපාලන සහ රජයේ වෘත්තීන්ට ප්‍රවේශ විය හැක්කේ කෙසේ ද?

රජයන්, අර්ථාන්විත සමාජ සුබසාධනය, ආරක්ෂාව සහ අයිතීන් ලබාදීමට වඩාත් හොඳ මෙවලමක් වන්නේ කෙසේ ද?

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වෙනස අනුව රජයේ ප්‍රතිපත්තිමය උත්සාහයන් පුරුෂයන් සහ කාන්තාවන් මත බලපෑම් කිරීම ඔවුන් විසින් මැන දක්වන්නේ කෙසේ ද?

ජාතික සංඛ්‍යාලේඛණ ඔස්සේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රතිසංස්කරණයන් සම්බන්ධයෙන් ක්‍රමානුකූලව දැනුවත් කරන්නේ කෙසේ ද?

පාලනය තුළ පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ගැටළු හඳුනාගැනීමට පුහුණුවන්නන් සමඟ ඉහත තීරණාත්මක ප්‍රශ්න සාකච්ඡා කළ හැකිය.

**පහත දැක්වෙන්නේ ප්‍රජා සේවා සංවිධානයන්ට (CSO) බලපෑමක් කළහැකි, පාලනය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනයට මැදිහත්වීම සඳහා යොදාගත හැකි මාර්ග කිහිපයකි.**

- **ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා නීති රාමුවක් පිහිටුවීම;**
- **ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රතිපත්ති යොදාගැනීම සඳහා ආයතනයන් වඩා ශක්තිමත් කිරීම;**
- **ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සඳහා ප්‍රතිපත්ති මෙවලම් සහ මාර්ගෝපදේශන සංවර්ධනය;**
- **සිවිල් සේවය තුළ සමාන කාන්තා නියෝජනය ප්‍රවර්ධනයට ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම;**
- **රැකියා ජීවිතයේ සමබරතාවය පූර්ණය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම;**
- **දේශපාලනය, අධිකරණය සහ සිවිල් සේවය තුළ නායකත්වයට කාන්තාවන්ගේ ප්‍රවේශවීම වර්ධනය කිරීම.**



## ආයතනික රාමුව සාමාන්‍යයෙන් සමන්විතවන්නේ:

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය සහ ප්‍රධාන ධාරාව සඳහා වන රජයේ දැක්ම සහ උපායමාර්ගික සැළැස්ම කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමට, විවිධ ආයතනයන් ප්‍රවර්ධනය අවශ්‍ය අතර, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ක්‍රියාවට නැංවීමට, අධීක්ෂණයට සහ අගය කිරීමට දැනුම නිෂ්පාදනය කළ යුතු ය.

## ආයතනික රාමුව සාමාන්‍යයෙන් සමන්විතවන්නේ:

ප්‍රධාන ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ ආයතනයන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ක්‍රියාවට නැංවීමට පහසුකරණය සැපයීම සහ සියලුම මට්ටම්වල ප්‍රධාන ධාරවේ වැඩසටහන් සිදුකිරීම කළ යුතු යි.

- ප්‍රධාන රජය (උදා: කැබිනට් මණ්ඩලය සහ මූල්‍ය අමාත්‍යාංශය), රාජ්‍ය ප්‍රතිපත්ති තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රධාන ධාරව ප්‍රවර්ධනය කිරීම සඳහා වගකීම මෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රධාන ධාරවේ අවශ්‍යතාවයන් අමාත්‍යාංශ මඟින් ඉටුකිරීම පිළිබඳ තහවුරු කිරීම සිදුකරයි.
- රේඛීය අමාත්‍යාංශ සහ ඒ සම්බන්ධව පෙනී සිටින්නන්, සියලුම මට්ටම්වල ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පාලනයක් සඳහා නැඹුරු කිරීමේ වගකීම ගත යුතු යි.

- පාලනය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනයට ගෙනයා යුත්තේ කුමන ආකාරයේ ක්‍රියාවන් සහ ක්‍රියාකාරකම් ද?

**ප්‍රජා සේවා සංවිධානයන් (CSO) හි භූමිකාව**

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතා ප්‍රතිපත්ති, රජය හරහා බෙදාහැරීම සහ ඒ සඳහා ඉහළ මට්ටමින් මැදිහත්වීම.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවයට අදාළ කාර්යයන් ක්‍රියාවට නංවන ප්‍රධාන ක්‍රියාකාරීන් දක්වන අවශ්‍යතාවයන්, ප්‍රධාන ධාරාවේ ප්‍රතිපත්ති සහ මෙම පරමාර්ථය සඳහා වෙන්කර ඇති සම්පත් පැහැදිලිව නිර්වචනය කිරීම සහ පුළුල්ව ව්‍යාප්ත කිරීම.

- රජය හරහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රධාන ධාරව ප්‍රවර්ධනය කිරීමට රජයේ කැමැත්ත, කාර්යභාරය සහ සූදානම සහතික කිරීම සහ අනුකූල නොවන අමාත්‍යාංශයන්ට අභියෝගාත්මක කාර්යයක් සැපයීම.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ සුවිශේෂී නීති හෝ කොන්දේසි පරිපාලනයට, දත්ත ඒකරාශී කිරීමට සහ ඒ අංශ සඳහා සුවිශේෂී සැළසුම් වර්ධනයට, පුහුණුව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී කාර්යමණ්ඩල ප්‍රතිපත්ති සැකසීමට රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතන තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සහයෝගී යාන්ත්‍රණයන් පිහිටුවීමට උපදෙස් දීම.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ක්‍රියාවට නැංවීමේ තීරණයන් සහ ප්‍රධාන ධාරවේ උපායමාර්ගයන් සාක්ෂි සහ දත්ත මත පදනම්ව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වශයෙන් වෙන්නොකරන බව තහවුරු කිරීම.

- සම්බන්ධීකරණ උත්සාහයන් සඳහා නායකත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රධාන ධාරාව සඳහා කාර්යක්ෂම සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් පිළිබඳ තහවුරු කිරීම.

- නීති සහ කොන්දේසි පරිපාලනය, දත්ත එකතු කිරීම, ආංශික සැළසුම් සංවර්ධනය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රතිපත්ති පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව ආදිය සිදු කරන්නේ කෙසේද යන තොරතුරු රේඛීය අමාත්‍යාංශ තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය කේන්ද්‍රීය කරුණු හඳුන්වාදීම සහ/හෝ බෙදාහැරීමේ ඒකක ඔස්සේ සැපයිය හැකි ය.

- විවිධ ආයතනයන් තුළ දත්ත ඒකරාශී කිරීමට සහයෝගයදීමෙන්, තීරණගැනීමේ ක්‍රියාවලියේ සහායට පවතින ඉහළ මට්ටමේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වෙන්නොකිරීමේ සාක්ෂි තහවුරු කළ හැකි ය.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රතිපත්ති සමඟ අනුකූල වන ව්‍යුහයන් ධෛර්යමත් කිරීම, සියුම් ඉලක්ක ඌනතා සහ අසමානතාවයන් පිළිබඳ වන්දි ආදී වගවීම් සහ ප්‍රමාද දෝෂයන් සඳහා සටන් කිරීම.

- ඉහත අරමුණු ළඟා කරගැනීමට, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහතික කිරීමට ශක්තිමත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය (හෝ රාජ්‍ය පරිපාලනය ප්‍රතිසංස්කරණය):

සේවය බෙදාහැරීම, කාන්තාවන් සහ රජය අතර මතුපිට පවතින අර්බුදකාරී අංශයක් වන අතර එය බොහෝවිට අසාර්ථකය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මූලාකෘතික භූමිකාවන් පදනම් කරගනිමින් ඔවුන්ගේ අයිතීන් හෝ සේවාවන් ලබාදීමේ දී කාන්තාවන් සමහරවිට සම්පූර්ණයෙන්ම බැහැර කර හෝ ඇතැම්විට සේවාවන් සඳහා අල්ලස් ගැනීමේ ඉල්ලීම් පවා ඉදිරිපත් වේ. මෙම ගැටළු ආමන්ත්‍රණයට පහත දැක්වෙන ප්‍රශ්න ඉතා වැදගත් වේ.

- **කාන්තාවන් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සඳහා මහජන සේවා සපයන්නන් සමඟ සන්නිවේදනය සහ ඉල්ලීම් සිදු කරන්නේ කෙසේ ද?**
- **ඔවුන් තමන්ගේ වගවීම පවත්වාගන්නේ කෙසේ ද?**
- **වගවීම් පද්ධති ඔස්සේ කාන්තා සේවාදායකයන්ට ප්‍රතිචාර ප්‍රවර්ධනය කරන්නේ හෝ ජාතික ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ ඉලක්ක සමඟ අනුකූල නොවූවන්ට දඬුවම් කරන්නේ කෙසේ ද?**

**පහත කරුණු පුහුණුවේ දී ප්‍රයෝගික නිදර්ශනයන් සමඟ සාකච්ඡා කරන්න.**




- වගවීම් සහගත ආයතනයන්, වඩාත් කාර්යක්ෂමව කාන්තාවන්ට පිළිතුරු ලබාදීම සඳහා රාජ්‍ය අධිකාරිත්වයට බලය ලබා දී තිබේ ද?
- මෙම පරමාර්ථය සඳහා, සමාන අවස්ථා ලබාදෙන මණ්ඩල, මානව හිමිකම් කොමිසම්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ කොමිසම්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අයවැය ආදී ආයතනයන් නොපමාව ප්‍රවර්ධනය කළ යුතු ය.
- එසේම, කාන්තාවන් හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමානාත්මතා සැළකිලිමත්වීම් ඇතුළත මෙම මිනුම් කාර්යක්ෂමව පවතී ද?
- දූෂණ වැළක්වීමේ මැදිහත්වීම් තුළ දූෂණය හා සම්බන්ධ කාන්තාවන්ගේ අත්දැකීම් කතාබහට ලක්වේ ද?
- දූෂණය සම්බන්ධයෙන් කාන්තාවන්, පුරුෂයන්ට වඩා වෙනස් ආකාරයේ අත්දැකීම් ලබා තිබේ ද?
- ඇතැම් ව්‍යුහයන් තුළ 'සිල්ලර දූෂණයන්' ඉතා ඉහළ මට්ටමින් එනම් මූලික සේවාවන් සඳහා සුළු අල්ලසක් දීමට සිදුවීම ආදී විවිධ අත්දැකීම්වලට කාන්තාවන් මුහුණ දී ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව දූෂණය - මුදල් නොව, ලිංගික හිතවාදීකම් කාන්තාවන් ගෙන් අපේක්ෂා කරයි. දූෂණ වැළක්වීමේ ධාවකයන් ඔස්සේ මෙම ප්‍රශ්නය කතාබහ කෙරෙනවා ද?

## නීතියේ ආධිපත්‍ය:

පාලන ප්‍රතිසංස්කරණයන් හි මෙම අර්බුදකාරී අංශය, කාන්තාවන් සඳහා භයානක තත්ත්වයක් ඉස්මතු කර ඇත. මෙය මට්ටම් ගණනාවකින් යුක්තය: යුද්ධයෙන් පසුව නැවත ගොඩනැගූ මූලික නීති පද්ධතීන් හි, කාන්තාවන්ගේ අයිතීන් අයුතු ලෙස යොදාගැනීම කතාබහ වූයේ ද යන්න තහවුරු කරගැනීම සහ අයුතු ප්‍රයෝජන ගැනීම්වලට ලක් වූ කාන්තාවන්ගේ අත්දැකීම් ආදී අපරාධයන්ට නීති ප්‍රතිසංස්කරණය සහ මෙම අපරාධයන්ට නඩු පැවරීම වඩා කාර්යක්ෂම කිරීම සඳහා නීති කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ආදිය අධිකරණ ප්‍රතිසංස්කරණය තුළට ඇතුළත් ය.

## විමධ්‍යගතකරණය:



දේශීය තීරණගැනීමේ ක්‍රියාවලිය තුළ කාන්තාවන්ගේ හඬ ආමන්ත්‍රණයට සහ අයවැය විශ්ලේෂණය, ප්‍රවේශයන් ආදිය සඳහා ඔවුන්ගේ කුසලතා වර්ධනයට සහායවීමට, ආයෝජනය සහ වැඩසටහන්කරණය ප්‍රමුඛ කරගත් මෙම අංශය සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු ය. ප්‍රාදේශීය මට්ටමේ පාලනයේ කාර්යක්ෂමතාවය ප්‍රතිසංස්කරණය ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය දෘෂ්ටියක් ඔස්සේ සිදුවිය හැකි බව එනම්, පූර්ව ප්‍රසව රැකවරණය, ජලය සහ සනීපාරක්ෂාව, වීදි ආලෝකකරණය වැනි කාන්තා අවශ්‍යතාවයන්ට අදාළ සේවාවන් සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් ගලා එන්නේ ද? පිළිබඳ දේශීය වියදම් ලුහුබැඳීමෙන් පරීක්ෂා කළ හැකි ය.

## ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ පාලනය



කාන්තාවන් දේශපාලන කාර්යාලයට ඈඳාගැනීම යන අදහසින් සංකේතවත් කරනුයේ, ඔවුන් දේශපාලන කාර්යාලය තුළට ඇතුළත් කරගැනීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම පමණක් නොව ඔවුන් නීත්‍යානුකූල දේශපාලන ක්‍රියාකාරීන් වශයෙන් ස්ථාපිත කිරීම බව (දේශපාලන සහ මහජන අවකාශය තුළ ස්ථානයක් නොමැති පුද්ගලික මිනිසුන්ට විරුද්ධවීම) අප සොයාගෙන ඇත. පාලන ආයතන උත්පාදනය යනු පුරවැසියන් වශයෙන් කාන්තාවන්ට පාලන ආයතන තුළ වගවීම ගොඩනැගීම, නීති වෙනස්කිරීම, කාන්තාවන්ගේ දුර්වල සහභාගීත්වය බැහැර කිරීමේ සහ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ඔවුන්ගේ අභිලාශයන් ස්ථාපිත කිරීමේ පටිපාටිය සහ ප්‍රමුඛත්වය ඇතිකිරීම මෙන්ම සිවිල් සමාජය තුළ කාන්තාවන්ගේ හඬ ඒකරාශිකිරීම සහ සංවිධානය කිරීම යි.

අසරණ කාන්තාවන් සඳහා පුරවැසිභාවය යන්නේ හි අර්ථය කුමක් ද? පළමුවෙන්ම, එහි අදහසවන්නේ සහභාගීත්වයට ඇති අයිතිය සහ නියෝජිතයෙක් වීමේ හැකියාව යි. සමාජයේ ආන්තික වූ මෙවැනි කණ්ඩායම් සඳහා පුරවැසිභාවය යනුවෙන් අර්ථවත් වනුයේ, කේන්ද්‍රීය වශයෙන් හිමිකම් අවම බව

නිසා ඇතිවන ගැටළු නිර්වචනයට බලය අත්පත් කරගැනීම සහ මෙම තත්ත්වය සමනය කිරීම සඳහා විසඳුම් ලබාදීම යි. දෙවැන්න, අසමානාත්මතාවයට විරුද්ධ වශයෙන් සමානාත්මතාවයේ සාර්ථක බව අවබෝධ කරගැනීමයි.ග

## යහපාලනයේ ප්‍රයෝගික භාවිතය



කාන්තාවන්ගේ හඬ සහ කාන්තාවන්ගේ සංවිධානයන් සිවිල් සමාජය තුළ දේශපාලන ඡන්ද කොට්ඨාසයක් වශයෙන් ගොඩනැගීම, පාලන ආයතනයන් හි සහ පුරවැසිභාවයට ඇති ඔවුන්ගේ හිමිකම මෙන්ම දේශපාලනය තුළ ඔවුන්ගේ සහභාගීත්වය සීමාකිරීම වැනි බාධක බිඳදැමීම තීරණාත්මක වේ. කාන්තාවන්ගේ ඉල්ලීමට 'හඬක්' ලබාග ැනීමට අතිමහත් කාර්ය ප්‍රමාණයක් කිරීමට සිදුවන අතර ඒ සඳහා ඡන්ද කොට්ඨාස මට්ටමින් ඔවුන් සංවිධානයට සහ බලමුළු ගැන්වීමට මෙන්ම හිමිකම් සඳහා ඇති අයිතිය පිළිබඳ සහ ඔවුන්ගේ ජීවිතවලට බලපාන තීරණයන් වෙත සහභාගිවීමේ අයිතිය පිළිබඳ දැනුවත් කිරීම සිදුකළ හැකි ය.

සාක්ෂි මඟින් පෙන්නුම් කරනුයේ, පුරවැසි හඬේ ඇති වැදගත්කම සහ කාන්තාවන් දේශපාලන බලකායක් වශයෙන් පිහිටුවීමෙන් ආයතනික න්‍යාය පත්‍රයන්, නීති සහ භාවිතාවන් මාරුකිරීම සහ නැවත සකස්කිරීමේ හැකියාව පවතින බව යි. මෙම කාර්ය දෙයාකාර වේ: එක් අතකින් කාන්තාවන්ට ඔවුන්ගේ හිමිකම් පිළිබඳ වඩා ඉහළ දැනුවත්කිරීමක් ලබාදීම මෙන්ම ආයතනයන් රඳවාගෙන සිටින්නේ කෙසේ ද යන්න පිළිබඳව මනා දැනුවත්කිරීමක් සිදුකිරීම, අනෙක් අතින් සංවිධානාත්මක ක්‍රියාවලිය තුළ සංවිධාන කාර්යයන් නැවත සකස්කරන්නේ කෙසේ ද යන්න දැනුවත්වීම සඳහා මැදිහත්වීම යි. දරිද්‍රතාව යන දෘෂ්ටියෙන් ආයතනයන් දෙස බැලුවහොත් ආන්තීකරණය වූ කාන්තාවන් ආයතනික වගවීම් හා සම්බන්ධ පුළුල් ගැටළු ඉස්මතු කරන අතර එම ආයතන දුප්පත් පුරුෂයන්ට ද වගවීම් සහගත නොවේ. එනිසා, බොහෝවිට එම ආයතන තුළ විනිවිදභාවය අවම වේ. දුප්පත් කාන්තාවන්ගේ කෝණයෙන් මෙම අසමබරතාවයට සහනයක් සැලසීමේ ප්‍රතිඵල ලෙස සියලුදෙනාට වඩාත් හොඳ ආයතනික වගවීමක් ලබාගත හැකි ය.

පස්වන මොඩියුලය

# සත්‍යය සහ සංහිඳියාව



# සත්‍යය සහ සංහිඳියාව

**"සාමය සහ සංහිඳියාව යනු සැතපුම් දහස් ගණනක ගමනක් වන අතර එය වරකට එක් පියවරක් බැගින් යා යුතුය.**

## හැඳින්වීම




මෙම මොඩියුලයේ අරමුණ වන්නේ සාමය, සත්‍යය සහ සංහිඳියාව ඇති කිරීම සඳහා ප්‍රජා මට්ටමින් සත්‍ය හා සංහිඳියා සංසදයේ (Truth and Reconciliation Forum - TRF) සාමාජිකයින්ට වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීම සඳහා සත්‍යය සහ සංහිඳියාව පිළිබඳ මූලික දැනුමක් සහ අවබෝධයක් ලබා දීමයි. මෙම මොඩියුලය දැනට ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක (25) ක ක්‍රියාත්මක කෙරෙමින් පවතින සමාජ සංවර්ධන ආයතනයේ සත්‍යය, යුක්තිය සහ ප්‍රතිසන්ධාන ව්‍යාපෘතියේ කොටසක් ලෙස සකස් කර ඇත.

සංහිඳියාවේ තේමාවට වැඩි වැඩියෙන් ජාතික හා ජාත්‍යන්තර අවධානය ලැබෙමින් පවතින්නේ ප්‍රචණ්ඩ ගැටුම් වලින් පසු සංක්‍රාන්ති ක්‍රියාවලියේදී එය ප්‍රධාන අරමුණක් ලෙස සැලකෙන බැවිනි. ලංකාව ඇතුළු බොහෝ රටවල් ප්‍රචණ්ඩකාරී අතීතයෙන් ගොඩ ඒම සඳහා මේ වන විට සිය සංහිඳියා ක්‍රියාවලිය නිර්වචනය කිරීමට උත්සාහ කරමින් සිටී. මෙය සංකීර්ණ ක්‍රියාවලියකි, මන්ද සංහිඳියාව යනු පුළුල් ව්‍යාකූල හා තරඟකාරී ප්‍රවේශයන් සහිත සංකල්පයක් වන අතර, එය විශේෂයෙන් ගැටුම් සහ පශ්චාත් ගැටුම් ගතිකතාවයන් සහිත රටවල් සඳහා දෙන ලද සන්දර්භයකට අදාළව සැමවිටම ප්‍රවේශමෙන් සකස් කළ යුතුය.

## සංහිඳියාව පිළිබඳ සංකල්පය




"සංහිඳියාව" යන යෙදුම පිළිබඳ සරල විශ්වීය අර්ථ දැක්වීමක් නොමැත. එය සන්දර්භය, ගැටුමේ ස්වභාවය සහ සංක්‍රාන්තියේ ස්වභාවය අනුව වෙනස් වන මතභේදාත්මක සංකල්පයකි. මෙම යෙදුම පිළිබඳ එක් අර්ථ දැක්වීමක් ඇතැම් සැකසුම් වලදී ඉතා ප්‍රයෝජනවත් විය හැකි අතර අනෙක් සන්දර්භය තුළ එය බෙහෙවින් විවාදාත්මක විය හැකිය. එම නිසා සංහිඳියාවේ අරමුණ සහ සංහිඳියා ක්‍රියාවලියක් තුළින් අපි නැවත ගොඩනැඟීමට උත්සාහ කරන දේ පිළිබඳව අවධානය යොමු කිරීම වඩා වැදගත් ය.

සංහිඳියාව යනු සමාජයේ මිනිසුන් හා කණ්ඩායම් අතර පමණක් නොව මිනිසුන්/පුරවැසියන් සහ රාජ්‍යය අතර ද ප්‍රචණ්ඩත්වය සහ බලහත්කාරයෙන් හානි වූ සබඳතා ගොඩ නැගීම හෝ නැවත ගොඩනැංවීම

බව ඉතා පොදු නිර්වචනයකින් යෝජනා කෙරේ. ශක්තිමත් හෝ සංවිධිත හඬක් නොමැතිව සංහිඳියාව සහ සාමය ගොඩනැගීම කෙරෙහි මහත් උනන්දුවක් දක්වන සමාජීය පාර්ශවකරුවන්වන වින්දිතයින්, තරුණයන්, පූර්ව සටන්කරුවන්, අවතැන්වූවන්, ඩයස්පෝරාවන්, කාන්තාවන් යන කණ්ඩායම් කෙරෙහි නිශ්චිත සැලකිල්ලක් දැක්වීම ද වැදගත් ය.

### "සංහිඳියාව" යන යෙදුම පිළිබඳව කෙනෙකුට විශාල අර්ථකථන ගණනාවක් ඉදිරිපත් කළ හැකිය, ඒවාට ඇතුළත් වන්නේ:

1. විශ්වාසය ගොඩනැගීම සහ සංවාද උත්පාදනය;
2. සත්‍යය පැවසීම සහ අපරාධ සඳහා වගකීම භාර ගැනීම;
3. වින්දිතයින්ට වන්දි ලබා දීම;
4. සමාව;
5. සංක්‍රාන්ති යුක්තිය (ප්‍රතිස්ථාපන, විපාකදායි, බෙදාහැරීමේ, ආර්ථික සහ/හෝ සමාජීය);
6. සමාජයේ සෑම තරාතිරමකම (පුද්ගලික, ප්‍රජා පාදක සහ ජාතික) කම්පන සුව කිරීම;
7. රටේ ප්‍රභූ පැලැන්තියේ දේශපාලන මෙවලමක් ලෙස ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීම ඉවත් කිරීම;
8. වාර්ගික, සමාජීය සහ අනන්‍යතා මත පදනම් වූ බෙදීම් සහ ධ්‍රැවීකරණය ආමන්ත්‍රණය කිරීම;
9. දේශපාලන බැහැර කිරීම් වැනි අසමතුලිතතා ආමන්ත්‍රණය කිරීම
10. ඉහළම මට්ටමින් විශ්වාසය ගොඩනැගීම ආරම්භ කිරීමේ මාර්ගයක් ලෙස බලය බෙදාගැනීම.

### සංහිඳියාව සහ රාජ්‍ය ගොඩනැගීම




සංහිඳියාව, රාජ්‍ය ගොඩනැගීමේ වැදගත් අංගයක් ලෙස ද විශේෂයෙන් රජයේ කාර්යභාරය ලෙස ද සැලකිය හැකිය. රජයන් තම සමාජයන්වලට වගවීම සහ මහජනතාව අතර විශ්වාසය ගොඩනැගීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සංහිඳියා ක්‍රියාවලීන් පහසු කිරීම බොහෝ විට අවශ්‍ය වේ. රජය විසින් මෙහෙයවනු ලබන වැදගත් පියවරක එක් උදාහරණයක් නම් සහභාගීත්ව හා සියල්ල ඇතුළත් නව ව්‍යවස්ථාමය විධිවිධාන යෙදවීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය දේශපාලන මට්ටමින් සංහිඳියාව සඳහා ගොඩනංවන බාධකයක් ලෙස සැලකිය හැකිය.

අවසාන කරුණ නම්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සංහිඳියාව ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථයට පමණක් නොව, සංහිඳියාව ගොඩනැගීමේ වැදගත් වේදිකාවන් ද විය හැකි බවයි. නිදසුනක් වශයෙන්, වගකිව යුතු සහ කලින් සටන් කළ කණ්ඩායම් ඇතුළත් ප්‍රජාවක් ස්ථාපිත කිරීම සංහිඳියාව සඳහා සිත්ග න්නා අවකාශයක් බවට පත්විය හැකිය. සංහිඳියාව සඳහා වේදිකා කරගත හැකි වෙනත් ආයතනික අවකාශයන් නම් පොලිසිය, අධිකරණ පද්ධතිය, වන්දි ගෙවීමේදී සුබසාධන ක්‍රමය, අධ්‍යාපන ක්‍රමය, පෞද්ගලික අංශය, ආගමික ආයතන යනාදියයි.

## සංහිඳියාවේ තේමාත්මක අංශ

## කම්පන සුව කිරීම

කම්පන සහ සුව කිරීම් සඳහා පරිපූර්ණ ලෙස ප්‍රවේශ විය යුතුය. කම්පනය හුදෙක් සිදුවීමක මනෝවිද්‍යාත්මක ප්‍රතිඵලය ලෙස නොව, ගැටුමට පෙර, අතරතුර සහ පසුව වෙනස් විය හැකි ක්‍රියාවලියක් ලෙස තේරුම් ගත යුතුය.එම නිසා සුව කිරීම ගැටුම් චක්‍රයේ පුළුල් සමාජ හා දේශපාලන සන්දර්භය තුළ අනුක්‍රමිකව සිදුවන ක්‍රියාවලියක් ලෙස සැලකිය යුතුය. සත්‍යය, යුක්තිය සහ වන්දි ගෙවීම යන සියල්ල සුව කිරීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංග වේ. කෙසේ වෙතත්, සංහිඳියාව යන්න අවශ්‍ය වන්නේ කම්පන යථා තත්ත්වයට පත් කිරීමට පමණක් නොව මානසික ආතතිය වැනි සමාජීය හා දේශපාලන ප්‍රශ්නයක් වන ක්ෂතිය හා අඛණ්ඩ වේදනාවන් තුළින් යහපත් ජීවිතයක් ගත කිරීමට ඉගෙන ගැනීමක් සඳහා ය.

## සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව අතර සම්බන්ධය







සංහිඳියාව කරා යන ගමන පහසු නොවන අතර එය ඉලක්කයක් හා ක්‍රියාවලියක් ලෙස සැලකිය යුතුය. අතීතය හා සංක්‍රාන්ති යුක්තිය සමඟ කටයුතු කිරීම ජාතික සංවාදයකට දායක විය යුතුය. කෙසේ වෙතත්, මෙය සංකීර්ණ හා දිගු කාලීන ක්‍රියාවලියක් වන සංහිඳියාවක් ඇති කරනු ඇතැයි බලාපොරොත්තු විය යුතු නොවේ. සාර්ථක සංහිඳියා ක්‍රියාවලියක් සඳහා අමුද්‍රව්‍ය හතරක් අවශ්‍ය වේ:

**සියල්ල ඇතුළත් ජාතික සංවාදයක්,**

**බල ප්‍රභූන්ගේ දේශපාලන කැමැත්ත සහ කැපවීම,**

**ආරක්ෂාව සහ කථා කිරීමේ හා චලනය වීමේ නිදහස**

**අනාගතයේදී රට කෙබඳු වනු ඇත්ද? පුරවැසියන් කුමක් බලාපොරොත්තු වන්නේද යන්න අනුව අර්ථ දැක්වූ ජාතික දැක්මක් හෝ ඉලක්ක මාලාවක්**

## සත්‍යය



සත්‍යය, සංහිඳියාවේ තවත් වැදගත් අංගයකි. (2006) දී සත්‍යය පිළිබඳ අයිතිය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් පොදුවේ පිළිගත් සම්මතයක් ලෙස පිළිගත් අතර අතීත සිදුවීම් පිළිබඳ සත්‍ය පැහැදිලි කිරීම සහ උල්ලංඝනය කිරීම් පිළිබඳ ඉතිහාසය නැවත සිදු නොවීමට වග බලා ගැනීම සඳහා රජයේ යුතුකම අවධාරණය කරයි.

අතීතයේ උල්ලංඝනය කිරීම් පිළිබඳ වගකීම ජනවාර්ගික හා ආගමික විරුද්ධවාදීන් සමඟ සම්බන්ධ කරන ඓතිහාසික කරුණු භාවිත කිරීම වැළැක්වීම සඳහා සත්‍යය වැදගත් වේ. මහා අපරාධ වලින් පසුව බෙදී ඇති සමාජ වල කණ්ඩායම් "අනෙක් පාර්ශවය" පිළිබඳ අත්දැකීම ප්‍රතික්ෂේප කරති. කෙසේ වෙතත්, වින්දිතයින්ට සහ අපරාධකරුවන්ට බහුවිධ භූමිකාවන් ඇති අතර වින්දිතයින් සඳහා වන හිමිකම් පෑම කලාතුරකින් සුවිශේෂී වේ. ගැටුමේ විවිධ මිථ්‍යාවන් සමඟ කටයුතු කිරීමට මිනිසුන්ට සත්‍යය සහ සත්‍ය සෙවීම අවශ්‍ය වන අතර ඒවා තමන් තුළම අවසන් නොවී අවසානයකට සහ ක්‍රියාවලියකට දායක වීමේ මාධ්‍යයක් ලෙෂ සැළකිය යුතු ය. සත්‍ය සෙවීම සහ ලේඛනගත කිරීම සඳහා ආයතනික යාන්ත්‍රණ බොහෝමයක් භාවිතා කළ හැකි අතර එවා උල්ලංඝනය කිරීම් විමර්ශන කොමිෂන් සභා සහ සත්‍ය කොමිසම් සිතියම් ගත කිරීමේ ව්‍යාපෘති තුළින් කළ හැකිය. මෙම යාන්ත්‍රණයන් අතුරුදහන්වීම් සම්බන්ධයෙන් කටයුතු කරන අතර විමර්ශන ආයතන, අනුස්මරණය, වන්දි ගෙවීමේ ව්‍යාපෘති, තොරතුරු හා ලේඛනාගාර වෙත ප්‍රවේශ වීම යනාදිය සමඟ සම්බන්ධ වේ.

සංහිඳියාව ඇති කිරීම සඳහා සංක්‍රාන්ති යුක්තිය අවශ්‍ය නමුත් එයම ප්‍රමාණවත් නොවේ. නිදසුනක් වශයෙන්, සියලු දෙනා ඇතුළත් ජාතික සංවාදයක් මත පදනම් නොවන සත්‍ය කොමිෂන් සභා කරුණු හෙළිදරව් කිරීම සහ යම් සාපරාධී වගවීමක් සිදු කිරීම හැර ඔවුන්ගේ අරමුණ ඉටු කරන්නේ කලාතුරකිනි. සාකච්ඡා කළ යුතු හා අවධානය යොමු කළ යුතු වන්නේ පරිවර්තනීය සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ න්‍යාය පත්‍රයකටය. කෙසේ වෙතත්, විශේෂයෙන් ඓතිහාසික කරුණු ඒකපාර්ශවිකව ඉදිරිපත් කිරීමට හෝ ආගමික හෝ වාර්ගික විරුද්ධවාදීන් සමඟ සම්බන්ධ වීම වැළැක්වීම සඳහා සත්‍යය වැදගත් ය.




ගැටුම් වලදී ගොදුරු වූවන් ලෙස පමණක් නොව සංහිඳියාව සාක්ෂාත් කර ගැනීම සඳහා කාන්තාවන් වැදගත් සම්පතක් ලෙස සැලකිය යුතුය. ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ගැටුම් වලදී මිනිසුන්ගේ අවමානුෂිකකරණයට පිළියම් යෙදිය යුතුය. සංහිඳියාව සම්බන්ධ ස්ත්‍රී පුරුෂසමාජභාවීය ආමන්ත්‍රණය කිරීමේ අභියෝගයක් නම් ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ සැබෑ දේශපාලන කැපවීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් අතර ඇති පුළුල් පරතරයයි.

## සංහිඳියා වැඩ මට්ටම

සංහිඳියා ප්‍රයත්නයන් ප්‍රාදේශීය හා දේශපාලන මට්ටම්වල ගැටලු විසඳන අතර විවිධ මට්ටම් අතර සහජීවනය ඇති වන පරිදි මෙම උත්සාහයන් එකිනෙකට සමගාමීව ක්‍රියාත්මක විය යුතුය.

## ජාතික සංහිඳියා ක්‍රියාවලිය




දේශපාලන සංහිඳියා ක්‍රියාවලීන්හිදී ජාතික ව්‍යවස්ථා සමාලෝචනය කිරීමෙන් ගැටුම නැවත ඇතිවීම වැළැක්වීම සඳහා විසඳිය යුතු දුර්වලතා හෙළිදරව් කළ හැකිය. මෙම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට දේශීය හා සාම්ප්‍රදායික ව්‍යුහයන් ඇතුළත් විය යුතුය. දේශපාලන මට්ටමින් ඇති තවත් වැදගත් කරුණක් නම්, බලය සමාන ලෙස බෙදා හැරීම සහ සුපරීක්ෂණයක් ඇතුළත් පද්ධතියක් ඇති කිරීමය. ඉතිහාසය නිවැරදි ලෙස ලේඛනගත කිරීමේදී රාජ්‍යය ද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ යුතුය.

## ප්‍රාදේශීය මට්ටමේ සංහිඳියාව

රටේ සත්‍යය, යුක්තිය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් පද්ධතියක් සකස් කළ යුතුය. මෙය ආරම්භ කළ හැක්කේ පවුල් හා ප්‍රජා මට්ටමේ ආරවුල් විසඳා ගැනීමෙන් පසුව ජනවාර්ගික, ආගම, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය යනාදිය මත සිදු වන වෙනත් ගැටුම් වලට ආමන්ත්‍රණය කිරීමෙනි.

## සංහිඳියාව ඇති කිරීම සඳහා සිවිල් සමාජයේ කාර්යභාරය



සිවිල් සමාජයේ භූමිකාව රාජ්‍ය නොවන සංවිධාන ලෙස පමණක් නොව පල්ලි, ව්‍යාපාරික සංගම්, සාම්ප්‍රදායික නායකයින්, කාන්තා හා තරුණ සංගම්, ඩයස්පෝරාවන් යනාදී වශයෙන් ද සංහිඳියාව ඇති කිරීමේ යාන්ත්‍රණයන් පවතින බව සමාජය තේරුම් ගත යුතුය. මේ සියල්ලන්ම සමාජ සම්පතක් ලෙස මූලික හා උත්ප්‍රේරක භූමිකාවක් ඉටු කළ හැකි ක්‍රියාකරුවන් වන අතර එම ක්‍රියාවලිය තුළ ධනාත්මකව සම්බන්ධ විය යුතුය. මෙම පදය පිළිබඳ පුළුල් අවබෝධය මඟින් සංහිඳියාව සඳහා වූ

වැඩ සඳහා මෙම සංවිධානවල ධාරිතාවය වඩාත් හොඳින් ඇගයීමට ඉඩ සලසයි.

සිවිල් සමාජය, ජාතික හා ප්‍රජා මට්ටම් අතර අතරමැදි භූමිකාවක් සපයන අතර ජනතාව නියෝජනය කරන සදාචාරාත්මක හා චාරාත්මක ස්ථාවරයන් වෙනුවෙන් පෙනී සිටීමේ ප්‍රධාන ක්‍රියාකරුවෙකි. සංහිඳියා න්‍යාය පත්‍රයක් සඳහා සුදුසු සහ ඇතුළත් ප්‍රතිපත්ති රාමුව නිර්වචනය කිරීමේදී සිවිල් සමාජය වැදගත් ය. ක්‍රියාත්මක කිරීමේ අදියරේදී වින්දිතයින් සාක්ෂි දෙන විට සහ වන්දි ගෙවීම වෙනුවෙන් පෙනී සිටින විට ඔවුන්ට ආධාර සැපයීම, මහජන සම්බන්ධතා පැවැත්වීමේදී සිවිල් සමාජය විශේෂයෙන් වැදගත් විය හැකිය.

නිල ක්‍රියාවලියෙන් පසු, වැදගත් කාර්යභාරයක් වනුයේ සංහිඳියා න්‍යාය පත්‍රය තිරසාරව පවත්වා ගැනීම සහතික කිරීම යි. සමස්ත ක්‍රියාවලිය තුළම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ලක්ෂණයන් මැනවින් ප්‍රවාහනය කෙරෙන බවට සහතික වීම සඳහා සිවිල් සමාජයට ද දායක විය හැකිය. එපමණක් නොව, යුද අපරාධ ලේඛනගත කිරීම වැනි සංහිඳියා ක්‍රියාවලියේ කොටස් පිළිබඳ වගකීම රජය භාර නොග න්නේ නම්, මෙය සිදු කිරීමට හා සිදු වන බවට සිවිල් සමාජය වගබලා ගත යුතුය.

## සංහිඳියාව සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරීන් සහ කණ්ඩායම් සඳහා මූලික මූලධර්ම

- සාමය ගොඩනැගීමේ "එක හා සමාන" ක්‍රමයක් නොමැත.
- සෑම ගැටුම් තත්වයක්ම අද්විතීය වන බැවින් එය තනි තනිව විශ්ලේෂණය කළ යුතු අතර ධනාත්මක වෙනසක් සිදු කරන්නේ කුමක් ද යන්න පිළිබඳ දැක්මක් ඇති කළ යුතුය; ගත් සියලු ක්‍රියාමාර්ග මෙයින් දැනුම් දිය යුතුය.
- වඩාත් සුදුසු මැදිහත් වීම තීරණය කිරීමට ප්‍රාදේශීය ක්‍රියාකාරීන් වඩාත් සුදුසු ය; බාහිර ක්‍රියාකාරීන්ට තීක්ෂණ බුද්ධිය සහ අත්දැකීම් හුවමාරු කර ගත හැකි නමුත් සාමය ගොඩනඟන්නේ කෙසේදැයි ඔවුන්ට කිසි විටෙකත් දේශීය ජනතාවට කිව නොහැක.
- සාමය ගොඩනැගීමේ කටයුතු සඳහා සැමවිටම හොඳින් සූදානම්ව සිටින්න.
- හානියක් නොකරන්න. ඔබේ ආරක්ෂාව සහ අනෙක් අයගේ ආරක්ෂාව සැමවිටම අංක එකේ ප්‍රමුඛතාවයයි.

## සත්‍යය සහ සංහිඳියාවේ ක්‍රියාකාරීන් පහත සඳහන් මූලධර්ම පිළිපැදිය යුතුය.

### ඇතුළත් කිරීම



සාමය සහ සංහිඳියා ක්‍රියාකාරීන් සියලු හඬට සවන් දීම සහතික කිරීම සඳහා තමන්, තම ප්‍රජාවන් සහ ඔවුන්ගේ රටවල් බහුමානීය ලෙස සිතා බැලිය යුතුය. අසාර්ථක සාම උත්සාහයන්හි ප්‍රධාන ක්‍රියාකරුවන් සහ විවිධ හඬවල් බැහැර කිරීම නිරන්තරයෙන්ම තීරණාත්මක සාධකයකි. මෙයින් අදහස් කරන්නේ කාන්තාවන්, සුළු ජාතීන්, තරුණයින් සහ සමාජයේ අඩු නියෝජනය කරන ප්‍රජාවන් බැහැර කිරීම ය. සියල්ල ඇතුළත් ප්‍රවේශයක් අනුගමනය කිරීම යන්නෙන් අදහස් කරන්නේ පුළුල් ලෙස සියල්ලන් ඇතුළත් කිරීම සහ නියෝජනය සඳහා මාර්ග හඳුනා ගැනීමට උත්සාහ කරන බැවින් සමාජ සාධාරණත්වය සහ සාමය ගොඩනැගීම කෙරෙහි පැහැදිලිව නැඹුරු වීමයි.

## බලසතුකරණය

තුළින් නිරනතරයෙන් බැහැර කරනු ලැබේ. සාමය ගොඩනැගීමේදී කාන්තා භූමිකාව ඉහළ නැංවීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් තිබේ. ප්‍රධාන පණිවිඩය සරල ය: සංහිඳියාව සහ සාමය ගොඩනැගීම සඳහා කාන්තාවන් සම්බන්ධ නොවන්නේ නම් ඔබට සාමයක් නැත. එය හුදෙක් උපායමාර්ගික අවශ්‍යතාවයකි.

## සූදානම් වීම

සූදානම් වීමට අසමත් අය අසාර්ථක වීමට සූදානම් වෙති. ඔබම, ඔබේම ප්‍රජාව සම්මුතියකට සූදානම් කිරීම හෝ "සංහිඳියාව සහ සාමය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව එකඟතාවක් ගොඩනැගීම වේවා, සූදානම් වීම සාර්ථකත්වයේ එක් ප්‍රධාන කරුණකි. දෘශ්‍ය ක්‍රියාවලීන් සකස් කිරීම, භාෂාව, සාකච්ඡා කිරීම සහ සංහිඳියා මැදිහත් වීම සඳහා සූදානම් වීම පිළිබඳ ස්වයං ඇගයීම් සහ උපදෙස් එයට ඇතුළත් ය.




## සහකම්පනය

සාර්ථක සංහිඳියා ක්‍රියාකාරීන් සෙසු ප්‍රජාවන්ට වැදගත් වන දේ තේරුම් ගනී. ඔවුන්ගේ රුචිකත්වයන් සහ ප්‍රමුඛතා මොනවාද? ඔවුන්ට අවශ්‍ය කුමක්ද සහ ඔවුන්ට එය අවශ්‍ය ඇයි? ඔබේ ප්‍රජාවෙන් පිටත සිටින අනෙක් අය පිළිබඳ අවබෝධයක් මෙතරම් තීරණාත්මක වන්නේ ඇයි දැයි ඔවුන් දැනගත යුතුයි. සංහිඳියාව මැදිහත් වීමක ප්‍රතිඵලයක් ලෙස සියලු සාමාජිකයින්ට යහපත් වෙනසක් දැනෙන බැවින් තිරසර සාමයක් යනු අන් අයගේ අවශ්‍යතාවන්ට සවන් දීම, තේරුම් ගැනීම හා ගරු කිරීමයි.



## හානියක් නොකිරීම (DO NO HARM)

සංහිඳියාවකට සහ සාම ක්‍රියාකාරීන්ට මඟ පෙන්වන වැදගත්ම මූලධර්මයක් නම් හානියක් නොකිරීමයි. ඔවුන්ගේ මැදිහත්වීම හේතුවෙන් නොදැනුවත්වම තම ප්‍රජාවන්ට හෝ තමන්ට හානියක් නොවන බවට වග බලා ගත යුතුය. හානියක් නොවන ලෙස යොදා ගැනීම සඳහා ඔබ වැඩ කරන සන්දර්භය පිළිබඳ මනා අවබෝධයක් අවශ්‍ය වන අතර එමඟින් ඔබේ කාර්යයේ ප්‍රතිඵල ධනාත්මක හා කල් පවත්නා වෙනසක් සඳහා දායක වේ.

## සත්‍යය සහ සංහිඳියාව පිළිබඳ වැඩකරුවන්ගේ මනස හා චරිතය

සංහිඳියාව සහ සාමය ගොඩනැඟීම සඳහා වැඩ කිරීම සඳහා විශේෂ මානසිකත්වයක් හා චරිතයක් අවශ්‍ය වේ. දිගුකාලීන ධනාත්මක වෙනසක් සහ තිරසර සාමයක් සාක්ෂාත් කර ගැනීම සඳහා එයට නොපසුබට උත්සාහය සහ කැපවීම අවශ්‍ය වේ. සාමය ඇති කරන්නෙකු තුළ ඇති ප්‍රධාන ගුණාංග සහ පොදු ගති ලක්ෂණවලට බොහෝ විට පහත ගුණාංග ඇතුළත් වේ.




සහකම්පනය යනු අන් අයගේ හැඟීම් සහ අත්දැකීම් තමන්ට වූ දෙයක් ලෙස සළකා ලෙසින්ම තේරුම් ගැනීම හා ප්‍රතිචාර දැක්වීමයි. සහකම්පනය යන්නෙන් අදහස් කරන්නේ වෙනත් කෙනෙකුගේ දෘෂ්ටිකෝණයන් අගය කිරීම හා ඒවා අගය කිරීම සඳහා අනෙකාගේ සපත්තුවට ඇතුළත් වීමට ඔබට හැකි වීමයි. මෙම මූලධර්මය අනුගමනය කිරීමෙන් ඔබ සවන් දිය යුත්තේ කෙසේද සහ කවදාද යන්න දැනගෙන නිහඬව සිටිය යුතුය.

අනුවර්තනය වීමේ හැකියාව යන්නෙන් අදහස් කරන්නේ ඔබ නම්‍යශීලී වන අතර ඔබේ සංහිඳියා සැලැස්මේ වෙනස්කම් කිරීමට හැකියාව ඇති බවයි. ගැටුම්කාරී අවස්ථා අදියර හා පරිණාමය වෙනස්වන අතර ඔබේ ක්‍රියාකාරීත්වය අදාළ හා ඵලදායීව පැවතීම සඳහා වෙනස් වන පරිසරයන්ට අනුවර්තනය වීමට ඔබට හැකියාව තිබිය යුතුය.

සියලු පාර්ශව අතර විශ්වාසය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන බැවින් ඵලදායි සංහිඳියා ක්‍රියාකාරිකයෙකු වීම සඳහා අපක්ෂපාතී හා මධ්‍යස්ථව සිටීම වැදගත් ය. ඔබේ ක්‍රියාකාරකම් වලදී ඔබ විවිධ දෘෂ්ටි කෝණයන් පිළිගෙන අන් අයට කථා කිරීමට ඉඩ ලබා දිය යුතු අතර, මධ්‍යස්ථව සිටීමෙන් සහ ඔබේ පෞද්ගලික න්‍යාය පත්‍රය මේසය මත තබා ගැනීම සඳහා ඔබේ භූමිකාව භාවිතා නොකිරීමෙන් දෙපාර්ශවයටම පිළිගත හැකි එකඟතාවයකට පැමිණීමට ඔබට හැකි වේ.

සාමය ගොඩනැගීම සහ සංහිඳියාව සඳහා අභිප්‍රේරණය අත්‍යවශ්‍යයි. ඵලදායී සංහිඳියා ක්‍රියාකාරිකයෙකුට අන් අය සහභාගී කරවීමට හා ඔවුන්ගේ මඟ පෙන්වීම අනුගමනය කිරීමට උනන්දුවක් දක්වන බව පෙන්නුම් කිරීමට හැකි වේ. කෙසේ වෙතත්, මෙම කාර්යයේ නියැලීම අභියෝගාත්මක වන අතර ඉතාමත් පළපුරුද්දක් ඇති සාම ක්‍රියාකාරිකයෙකුට වුවද පුද්ගලයෙකුට හානි කළ හැකිය. සංහිඳියාවේ නියැලීමට අවශ්‍ය ඉහළ මට්ටමේ කැපවීමක් හා ශක්තියක් පවත්වා ගැනීම සඳහා ස්වයං රැකවරණය සහ ස්වයං ප්‍රතිබිම්බනය සඳහා කැප වූ කාලයක් අවශ්‍ය වේ.




සාමය සඳහා වූ දැක්මක් ඇති කිරීමට සහ සහයෝගය දිරිමත් කිරීමට හා දිරි ගැන්වීම සඳහා එම දැක්ම අන් අයට පැහැදිලිව සන්නිවේදනය කිරීමට ඵලදායි සාම ක්‍රියාකාරිකයෙකුට හැකියාව තිබිය යුතුය. ඊටත් වඩා කාර්යක්ෂම ක්‍රියාකාරිකයෙකුට දැක්ම පවත්වා ගැනීමටත්, දුෂ්කර අවස්ථාවන්හිදී පවා අන් අයට මඟ පෙන්වීමටත් හැකි වේ.

සාමය, සත්‍යය සහ සංහිඳියාව සඳහා වූ ඔබේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නව හා නවෝත්පාදන මාර්ග සෙවීම සඳහා නිර්මාණාත්මකභාවය සහ විවේචනාත්මක චින්තනය වැදගත් වේ. ගැටළු විසඳීම සඳහා නිර්මාණාත්මක චින්තනය ද භාවිත කළ හැකිය. සාමය හා සංහිඳියා ක්‍රියාකාරිකයෙකු වශයෙන් ඔබ ඔබේ සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් වල සැපයුම් වල සිට සාමය වලක්වන සන්දර්භමය බාධාවන් දක්වා වූ ගැටලු වලට විසඳුම් සෙවිය යුතුය. මෙම අභියෝග ජය ගන්නේ කෙසේද යන්න ගැන නිර්මාණාත්මකව හා විවේචනාත්මකව සිතීම ඵලදායි සාම ක්‍රියාකාරිකයෙකුගේ මූලික කුසලතාවකි.

## සත්‍යය, යුක්තිය සහ සංහිඳියාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මානයන්




කාන්තාවන්ගේ ජීවිතයේ දේශපාලන, සමාජ, ආර්ථික හා නෛතික අංශයන් වැනි වෙනත් මානයන් නොසලකා හරිමින් කාන්තාව ලිංගික හිංසනයට ලක් කරන වස්තූන් ලෙස පමණක් නිරූපණය කිරීමේ ප්‍රවනතාවක් ජාත්‍යන්තර ප්‍රජාව තුළ දක්නට ඇත. කාන්තාවන්ට දේපළ හිමි කර ගැනීමට සහ උරුම කර ගැනීමට වැඩි දියුණු කළ අයිතිවාසිකම් පිළිබඳ ධනාත්මක අවස්ථා

සියෙරා ලියෝන්, පේරු සහ දකුණු අප්‍රිකාවේදී සොයා ගත හැක. කාන්තාවන් වින්දිතයින් ලෙස පමණක් නොව, සංහිඳියාව සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් වත්කමක් ලෙස ද සැලකිය යුතුය.

සංහිඳියාවේ ස්ත්‍රී පුරුෂභාවය ආමන්ත්‍රණය කිරීමේ අභියෝගයක් නම් කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ මෙම අභිලාෂකාමී ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන හා ප්‍රාග්ධන සම්පත් වල සැබෑ කැපවීමක් නොතිබීමයි. තවද, සංහිඳියාවේ ස්ත්‍රී පුරුෂභාවය ආමන්ත්‍රණය කිරීමේදී පිරිමින් ඇතුළත් කිරීම වැදගත් බව කිසිවෙකු අමතක නොකළ යුතුය. ගැටුම් වලදී පිරිමින් අවමානුෂිකකරණය කිරීම නැවත ගැටුමට තුඩු දිය හැකි අතර එම පුද්ගලයින් නව අපරාධකරුවන් බවට පත්වේ.  දේශපාලන නොසන්සුන්තාවයෙන් සාපරාධී හැසිරීම් දක්වා ප්‍රචණ්ඩත්වය විකෘති වීම වැළැක්වීම සඳහා මිනිසුන්ගේ අමානුෂිකකරණයට ආමන්ත්‍රණය කිරීම ද ඉතා වැදගත් විය හැකිය.

## සත්‍ය හා සංහිඳියාව සම්බන්ධව ප්‍රජා සේවා සංවිධානයන්හි (CSO) කාර්යභාරය

සංහිඳියා ක්‍රියාවලියක අදියර තුනක් පවතින අතර, ඒ සෑම අදියරකදීම ප්‍රජා සේවා සංවිධානයන්වලට වඩා වෙනස් භූමිකාවක් හිමි වේ.

1) **සංහිඳියා න්‍යාය පත්‍රයක් සඳහා සුදුසු ප්‍රතිපත්ති රාමු නිර්වචනය කිරීම:** මෙම අවධියේදී සිවිල් සමාජය මූලික කාර්යභාරයක් ඉටු කරයි, මන්ද බොහෝ විට ප්‍රභූවරුන් හෝ විරුද්ධ දේශපාලන පක්ෂ අතර සංහිඳියාව සඳහා රජය වැඩි උනන්දුවක් දක්වන බැවිනි. සිවිල් සමාජයේ අවධානය වෙනස් විය යුතුය: සංහිඳියා ක්‍රියාවලියට විවිධ කණ්ඩායම් ඇතුළත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන පුළුල් ප්‍රවේශයක වැදගත්කම පැහැදිලි කිරීම සඳහා දේශපාලන අධිකාරීන් සමඟ සම්බන්ධ වීමට සිදු වේ.

2) **නිල සංහිඳියා ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම:** මෙම අවස්ථාවෙහිදී, කොමිෂන් සභාවල කාර්යභාරය පිළිබඳව සිවිල් සමාජයට මහජනතාව දැනුවත් කිරීමේ හෝ පොදු අධ්‍යාපනයේ කාර්යභාරයක් ඉටු කළ හැකිය (සහ අනුමාන වශයෙන් සාධාරණ කොමිෂන් සභාවලින් ඔබ්බට). මෙම අවධියේ තවත් විභව කාර්යභාරයක් විය හැක්කේ වින්දිතයින්ට නිල ආයතන ඉදිරියේ සාක්ෂි ලබා දීම, වන්දි ගෙවීම වෙනුවෙන් පෙනී සිටීම යනාදියයි.




3). **නිල සංහිඳියා ක්‍රියාවලියෙන් පසු:** මෙම අවස්ථාවෙහිදී, සංහිඳියා න්‍යාය පත්‍රය පවත්වා ගැනීම, විවිධ කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම යනාදිය ඉතා වැදගත් ය. රාජ්‍යය මත තබා ඇති බොහෝ තරඟකාරී ඉල්ලීම් අතර න්‍යාය පත්‍රය නොසළකා නොහරින බවට සිවිල් සමාජය වග බලා ගත යුතුය. කරුණු ලේඛනගත කිරීමෙන්, තොරතුරු බෙදා හැරීමෙන් සහ එය නැවත කිසි දිනෙක සිදු නොවන බවට වග බලා ගැනීමට උදව් කිරීමෙන් සිවිල් සමාජයට මෙම අදියර සම්බන්ධ කර ගත හැකිය. අවශ්‍ය නම් නිල යාන්ත්‍රණයන් මඟින් නිෂ්පාදනය කරන ලද ලේඛනාගාරය ආරක්ෂා කිරීම තවත් විභව කාර්යයකි.

සංහිඳියා ක්‍රියාවලියේ සෑම අදියරකදීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික ධාරා ගත කිරීම සහ ගැටුම් සහ සංහිඳියාව පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අත්දැකීම් පිළිගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සිවිල් සමාජයට යුතුකමක් වේ.

## සංහිඳියා වැඩසටහන්හි තේමාවන්

කණ්ඩායමේ සන්දර්භය සහ සූදානම මත පදනම්ව ඔබේ සිදුවීම පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළ හැකිය:




- අභිප්‍රාය ප්‍රකාශ කිරීම සහ සාකච්ඡා කිරීම, ගෞරවනීය සංවාදය, ආරක්ෂිත අවකාශයක් ඇති කිරීම, සබඳතා ගවේෂණය කිරීම සහ වෙනස් ලෙස කළ හැකි දේ
- කතන්දර බෙදා ගැනීම
- ප්‍රජා ගැටලු පිළිබඳව වඩා හොඳින් අවබෝධ කර ගැනීම සහ මෙම ගැටලු විසඳීම සඳහා අපි එකට වැඩ කරන්නේ කෙසේද?
- ව්‍යාපෘති ප්‍රදේශයන්හි ස්වදේශික හා ස්වදේශීය නොවන පුද්ගලයින් අතර සම්බන්ධතා වර්ධනය කිරීම, සේවා සැපයීම සහ සුව කිරීම වැඩි දියුණු කිරීම
- සාමූහික උපදේශනය සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටීම සඳහා සමාජ සේවකයින්ට කළ හැකි කාර්යභාරය පිළිබඳව සාකච්ඡා කිරීම
- ස්වදේශික ප්‍රජාවන්ගේ අත්දැකීම් වලට අදාළ වැඩසටහන් සංවර්ධනය කිරීම
- පවුල් හා ප්‍රජාවන් එක්සත් කිරීම හා සුව කිරීම සඳහා ස්වදේශික ප්‍රජාවන් සහ නියෝජිතායතන වල වැඩ කටයුතු ගොඩනැගීම

## සංහිඳියාවේ සහ සාම ක්‍රියාකාරීන්ගේ වැදගත් ගුණාංග සහ ගති ලක්ෂණ;

- අවංකය
- ආශ්වාදජනකය
- නැණවත්ය
- කැපවීම
- ඉවසීම
- වැරදි පිළිගනී
- මහන්සියෙන් වැඩකරයි
- විනයගරුකය
- අවංකය
- දැඩි උද්යෝගිමත්ය
- නිර්මාණාත්මකය
- අසන්නකුය
- සමබරය
- සංවේදීය
- සන්නිවේදකයකුය
- කාලෝචිතය
- නිහතමානීය
- අවිහිංසාවාදීය
- විචක්ෂණශීලීය
- නිර්භීතය
- බලාපොරොත්තු සහගතය
- අභියෝගය භාර ගනී
- දේශීය සංස්කෘතීන් ගැන දැනුවත් වීම
- ව්‍යවස්ථාපිතය
- දැනුවත්ය
- විශ්වාසය
- ජීවිතාන්තය දක්වා ඉගෙන ගනී

හය වන මොඩියුලය

# බහුත්වවාදය හා ගැටුම්



# බහුත්වවාදය සහ ගැටුම් නිරාකරණය

*"IF DIVERSITY IS SEEN AS A SOURCE OF STRENGTH, SOCIETIES CAN BECOME HEALTHIER, MORE STABLE AND PROSPEROUS." KOFI ANNAN*

## හැඳින්වීම



මෙම මොඩියුලය, බහුත්වවාදය සහ ගැටුම් නිරාකරණය පිළිබඳව මූලික අවබෝධයක් ලබාදෙයි. එමඟින්, බහුත්වවාදය, බහුත්වවාදයේ වර්ගයන්, විවිධත්වය සහ සාමකාමී සමාජයන් ගොඩනැගීමට මඟපාදන ගැටුම් නිරාකරණය වැනි අදහස් මඟින් බහුත්වවාදය සමඟ සම්බන්ධවීමට අදාළ සන්දර්භය සැපයීම ආදිය පිළිබඳව හඳුන්වාදෙයි.

**මොඩියුලයේ අරමුණු**

- 'බහුත්වවාදය' සංකල්පය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට සහ ඒ පිළිබඳ සමීප බවක් ඇති කරගැනීම.
- සාමය ගොඩනැගීමේ දී එය මෙවලමක් බවට පත්වන්නේ කෙසේද යන්න හඳුනාගැනීම.
- ධනාත්මක පැතිකඩයන් පිළිබඳව මෙන්ම ගැටුම් හි අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව දැනුවත් බවක් ලබාගැනීම.
- ගැටුම් නිරාකරණය සමීප සංකල්පයක් බවට පත්කර ගැනීම.

**ශ්‍රී ලාංකීය සන්දර්භය**

- අපේ රට, ඉතා දරුණු ජනවාර්ගික හා ආගමික ගැටුම්වලින් අත්දැකීම් ලබා තිබෙන අතර, ඒ මක්නිසාද යත් එක් එක් ප්‍රජාවන් හි සාමාජිකයන් ඔවුන්ගේ පුද්ගලික ගැටළු දෙස පමණක් බැලීමේ ප්‍රවණතාවයක් පවතින බැවිනි. ඔවුන්, අනෙකාගේ මතය ලබා නොගනී.

- සමාන අයිතීන්, සමාන පුරවැසිභාවය, සහ සමාන යුක්තිය ආදිය අප සමාජය තුළ ප්‍රතිමාන බවට පත්කර ගැනීමෙන්, අප සිතන ආකාරයේ වෙනසක් ඇති කරගැනීම අවශ්‍ය වේ.






- බහු ආගමිකත්වය සහ බහු-ජනවර්ගිකත්වය යන අදහස් ජාතික මට්ටමට පමණක් නොව පළාත් සහ ග්‍රාමීය මට්ටමට ද අවශ්‍ය වේ. නායකයන් අපගේ සමාජයෙන් ඉස්මතුවීම වැදගත් වන්නේ ජාතික, පළාත් සහ ප්‍රාදේශීය වශයෙන් පවතින අභියෝගයන්ට මුහුණදීමට එමගින් හැකියාව ලැබෙන බැවිනි.

**බහුත්වවාදය, ඉගෙනීමේ සහ ප්‍රයෝගික භාවිතයේ අරමුණ**

- ජාතික සංහිඳියා ක්‍රියාවලිය සඳහා සාමාන්‍ය ප්‍රජාව අතුරින් බහු-ආචාරධර්මයන් ඉදිරියට ගෙනයාම සඳහා සහයෝගය ලබාදිය හැකිය. තරුණ නායකයන් ශක්තිමත් කිරීමට අප එයින් අදහස් කරමු.

## බහුත්වවාදය යනු කුමක්ද?

සමාජය හෝ රාජ්‍යයේ ස්වරූපය තුළ, ජනවාර්ගික හෝ සංස්කෘතික කණ්ඩායම් ඔවුන්ගේ ස්වාධීනත්වය, සම්ප්‍රදායන්, භාවිතයන් සහ ආකල්පයන් නඩත්තු කිරීම යි - ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය




බහුත්වවාදය යනු සමාජ විවිධත්වය අර්ථ නිරූපණය කිරීම යි.

අදහස්, අගයන්, න්‍යායන් ආදී විවිධත්වයන් ඉවසීම හා පිළිගැනීම යි.

සමාජ යථාර්තයන් ලෙස භාෂාවන්, ආගම්, ජනවාර්ගික සාමාජිකත්වයන් සහ සංස්කෘතික සම්ප්‍රදායන්, එනම් කණ්ඩායම්හි සාමාජිකයන් විසින් පාලනය කරන බව හඟවන ආයතනයන් පිළිබඳව තේරුම් ගැනීම යි.

**මතක තබාගත යුතු ප්‍රධාන කරුණු**

බහුත්වවාදය, දේශපාලන දර්ශනයක් වන අතර එමගින්, විවිධ විශ්වාසයන්, වටපිටාවන් සහ ජීවන විලාසිතාවන් සහිත ජනතාව එකම සමාජය තුළ සහජීවනයෙන් යුක්තව සහ දේශපාලන ක්‍රියාවලිය තුළ සමානාත්මතාවයකින් යුතුව සහභාගිකරවීමට හැකි අයුරින් රඳවා තබාගැනීම සිදු වේ.

බහුත්වවාදය, එහි භාවිතය තුළින් සමස්ත සමාජයේ "පොදු යහපත" සඳහා දායකවීමට අදාළ විසඳුම් සාකච්ඡා කිරීමට තීරණ ගන්නන් සඳහා මඟ පෙන්වීමක් සිදුකිරීම සහතික කරයි.

බහුත්වවාදය මඟින් ඇතැම් සිද්ධීන් තුළ සුළුතර කණ්ඩායම් පිළිගැනීම හා අනුකලනය ළඟා කරගැනීම සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ නීති සම්පාදනය මඟින් ඔවුන්ව සුරැකීම ආදිය හඳුනාගනු ලබයි.

**බහුත්වවාදය පිළිබඳ වැදගත් කරුණු**




- අගය කිරීමට හේතුවන දේ සඳහා ජනතාව ගරු කළ යුතු යි.
- බහුත්වවාදය යනු විවිධත්වය ලෙස තනිව දැක්විය නොහැක්කකි. නමුත්, එය විවිධත්වය සමඟ ඇති කරගත් ඉතා ශක්තිමත් ගිවිසුමක් ලෙස දැක්වීය හැකි ය.
- බහුත්වවාදය යනු හුදෙක් ඉවසීම පමණක් නොවේ. නමුත්, එය විවිධත්ව රේඛා ඔස්සේ ක්‍රියාකාරී අවබෝධ කරගැනීමක් අපේක්ෂා කරන්නකි.
- බහුත්වවාදය යනු සාපේක්ෂ වූවක් නොවේ. නමුත්, එමඟින් කැපකිරීම් සිදු වේ.
- බහුත්වවාදය සංවාදයන් මත පදනම් වේ.

**බහුත්වවාදය වර්ගීකරණය**

- දේශපාලන බහුත්වවාදය

  බලය සාමකාමීව භ්‍රමණයවීම, සියළුම දේශපාලන පක්ෂ සඳහා ඕනෑම අවස්ථාවක පැවැත්මට සහ සංවිධානයවීමට ඇති අයිතිය මෙයින් අදහස් වේ.

- සංස්කෘතික බහුත්වවාදය

  සමාජය තුළ විවිධ ජනවාර්ගික හෝ සමාජ කණ්ඩායම් පැවතීම සහ ඔවුන්ගේම සංස්කෘතියක් ගොඩනැගීමට උත්සුකවීමේ තත්ත්වය යි.

- ආගමික බහුත්වවාදය

  ඇතැම් අවස්ථාවල ආගමික බහුත්වවාදය ලෙස නිර්වචනය කරනුයේ “අන්‍යයන්ගේ, අන්‍යයන් සඳහා ගරුකිරීම”, එකම සමාජය තුළ සමස්ත ආගමික විශ්වාස පද්ධතිය හෝ නිකායන් අනුගමනය කරන්නන් සහජීවනයෙන්, සමඟියෙන් කටයුතු කිරීම යි.

  සිවිල් නීති සහ ධර්මය යටතේ පැවතීමට සෑම ආගමකටම ඉඩ ලබාදීමට යොමුවීම මඟින් “ආගමේ නිදහස” සමඟ ආගමික බහුත්වවාදය ව්‍යාකූල නොවිය යුතු යි. ඒ වෙනුවට, ආගමික බහුත්වවාදය මඟින් සිදුවනුයේ විවිධ ආගමික කණ්ඩායම් අන්‍යෝන්‍ය වාසි ලබාග ැනීම සඳහා ස්වේච්ඡාවෙන් ඔවුන් එකිනෙකා සමඟ අන්තර් සබඳතා පැවැත්වීම යි.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය බහුත්වවාදය

  පුරුෂ සහ කාන්තා යන ද්විමය සංකල්පයන්ට අමතරව, සියළුම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවයන් සහ ප්‍රකාශනයන් හඳුනා ගැනීම සහ අවබෝධ කරගැනීම මෙම මෑත කාලීන සමාජ විද්‍යාත්මක න්‍යායක් වන ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය බහුත්වවාදය තුළින් අපේක්ෂා කරයි. (2005) දී ඉස්මතු වූ මෙම න්‍යාය මඟින්, විවිධ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීත්යන් සහ ලිංගික අනන්‍යතාවයන් පිළිබඳව හඳුනාගැනීමට උපකාර කරයි. මෙම න්‍යාය භාවිතයෙන් ඒකරාශී කරගන්නා වූ තොරතුරු මඟින්, ආන්තීකරණයට ලක් වී ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවයන්ගේ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීම සඳහා සමාජයට සහයෝගය දක්වයි.

## විවිධත්වය යනු කුමක් ද?

විවිධ, වෙනස්, විවිධාකාර, විවිධත්වය වැනි තත්ත්වයන් හෝ ගුණාංග වේ.

බොහෝ කණ්ඩායම්,
ජනවාර්ගික,
ආගමික,
උරුමයන්,
අගයන්,
භාෂාවන් ගෙන් විවිධත්වය සහ බහුත්වවාදය සමන්විත වේ.

## අභියෝගය

ශ්‍රී ලංකාවේ සහජීවනය, ඉවසීම මත පදනම්ව ඇති අතර එය, අවබෝධය සහ අන්තර් ප්‍රජා සම්බන්ධතා වර්ධනය ක්‍රියාකාරී කිරීමේ කටයුත්තක නොයෙදේ. ප්‍රජාවන් විවිධ ප්‍රදේශයන්හි ජීවත් වන අතරතුර, ඔවුන් එකිනෙකා අතර අර්ථාන්විතව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

## ගැටුම යනු කුමක් ද?

ගැටුම යනු නොවැළැක්විය හැකි සමාජ සංසිද්ධියක් වන අතර එය එසේ වනුයේ, මානවයාට පුළුල්ව විහිද යන විවිධ අවශ්‍යතාවයන්, ආශාවන් සහ දෘෂ්ටිකෝණයන් පැවතීම යි. ගැටුමට අදාළ එක් අගය කිරීමක් වනුයේ, අප විසින් අන්‍යයන්ගේ මතයන්ට ගරු කරන්නේ ද, නැද්ද, වැඩ කිරීම ඔස්සේ අපගේ වෙනස්කම් අන්අය සමඟ ගලපාගැනීමේ හැකියාව පවතී ද, නැද්ද යන්න පිළිබඳ අපගේ දැනුවත්භාවය තියුණු කිරීම යි. විටෙක, ඔබ සහ ඔබ සමඟ වැඩ කරන තරුණ ප්‍රජාව අතර නොවැළැක්විය හැකි ආකාරයේ ගැටුම් සහගත අවස්ථාවන් පැනනැගිය හැක.

## ගැටුම් ඇතිවීමේ විභවතාව



විවිධ ආශාවන්, හැකියාවන් සහ අත්දැකීම් සහිත ජනතාව සමඟ එකට වැඩ කිරීමේ දී, ගැටුම් ඇතිවීමේ විභවතාවක් පවතී. ගැටුම්වලට බියවන බොහෝදෙනා එය, අපහසුතාවයක් සහ අස්ථාවර වූ අංගයක් වශයෙන් සළකනු ලබයි. කෙසේවෙතත්, මුල් අවධියේ දී ගැටුම් පිළිබඳ හඳුන්වා, ඒ පිළිබඳ පැහැදිලි කර දක්වා ඇත්තේ සාධනීය ගැටුම් කළමනාකරණයට මෙන්ම නිරාකරණයට අවස්ථාවක් පවතින බව යි. නමුත්, ගැටුම යනු පැසවමින් පවතින්නක් බව (හෝ ඒ සමඟ කටයුතු කිරීමට කිසිවෙක් වගකීම් සහගත නොවන විට) දැනුවත් නොවීම තුළ, එය ඉතා විනාශකාරී සහ කණ්ඩායමක් කොටස්වලට කඩාදැමීමට හැකියාව පවතින්නක් වියහැක.

පාර්ශවයන් එකක් හෝ කිහිපයක් අතර දැනුවත්බව හෝ විශ්වාසයන් සඳහා දැඩි විපක්ෂවීමක්, හෝ අනෙක් පාර්ශවයන් සමඟ නොඑකඟතාවයක්, හෝ අසාධාරණ හෝ අයුක්තිසහගත තත්ත්වයක් හෝ සබඳතාවක් ඇති වී තිබීම මෙයින් විස්තර වේ.

## ආකල්පයන් සහ සංජානනයන්



- පක්ෂ එකක් හෝ කිහිපයක් අතර ඇති ආකල්පයන් සහ සංජානනයන්, ඔවුන්ගේ තත්ත්වය; ඔවුන්ගේ චරිතය හා අදාළ සාධාරණත්වය, සම්බන්ධිත අන්අය; සහ ඔවුන්ගේ සහ අන්අයගේ ඉලක්ක, ආශාවන්, පෙළඹවීම්, හෝ ක්‍රියාවන් ආදී කුසලතා හෝ ඒවායෙහි නිත්‍යානුකූල බව ඇතැම්විට නිවැරදි වීමට හෝ නොවීමට හැකි ය.
- පාර්ශවයන් එකක් හෝ කිහිපයක් අතර ඇති පෙළඹවීම් ඔස්සේ, ඔවුන්ගේ තත්ත්වය වෙනස්කිරීමට උත්සාහ කරයි. ශෝකය නිමාකිරීම; හිඟ ලෙස තේරුම්ගත් හෝ තත්‍ය සම්පත් නැවත වෙන්කිරීම; පුද්ගල හෝ කණ්ඩායම්වල අභ්‍යන්තර හෝ බාහිර අවශ්‍යතා ළඟා කරගැනීම; යුක්තිය, අයිතීන් හෝ සාධාරණ ගනුදෙනුවක් ළඟා කරගැනීම; සංස්කෘතික ප්‍රතිමානයන්, පොදු භාවිතාවන් හෝ හැසිරීම් පිළිගැනීම හෝ වෙනස් කිරීම; ශක්තිමත් හැඟීම්; පලිගැනීම් ආදිය ප්‍රකාශ කිරීම ආදී අවස්ථාවන්වන් නිදර්ශනවලට අඩංගු වේ.
- හැඟීම් සෘණාත්මක හෝ ධනාත්මක වියහැක්කේ, පාර්ශව එකක් හෝ කිහිපයක් යම් තත්ත්වයක් පිළිබඳව සහ/හෝ ඊට අයත් ජනතාව, ගැටළු, ආශාවන්, හෝ ක්‍රියාවන් පිළිබඳව දැනෙන හැඟීම් පදනම් කරගෙන යි. හැඟීම් සම්බන්ධයෙන් අභ්‍යන්තරයෙන් පමණක් අත්දැකීම් ගැනීම හෝ බාහිරව ක්‍රියාකාරී අයුරින් ප්‍රකාශ වීම යන කාරණා නිරන්තරයෙන් ගැටුමක් ගතික ස්වරූපයට පෙළඹවීමට සහ බලපෑම් කිරීමට හේතු වේ.
- එක් පාර්ශවයක් හෝ කිහිපයක් ඔවුන්ගේ තත්ත්වයන් හි වෙනසක් ළඟා කරගැනීමට සහ ඔවුන්ගේ ආශාවන් සහ අවශ්‍යතාවයන් ලබාගැනීමට සෘජුව හෝ වක්‍රව ඉහළ තරඟකාරීත්වය සහ ආක්‍රමණශීලිත්වයකින් යුතුව හැසිරීම් සහ ක්‍රියාවන් සිදුකළ හැකි ය.
- ඉලක්ක, ප්‍රතිඵල හෝ වෙනස්කම් යටතේ පාර්ශවයන් විසින් තම ආශාවන් මුදුන් පමුණුවා ගැනීමේ දී සවිඥානික හෝ සවිඥානික නොවන අන්දමින්, ඇතැම්විට අන්අය සමඟ අනුකූලව හෝ අනුකූල නොවන ලෙස ඔවුන්ගේ තත්ත්වය වෙනස්කිරීම සහ ඔවුන්ගේ ආශාවන් ළඟා කරගත හැකි බව ඔවුන්ගේ විශ්වාසය යි.

## ගැටුම්

- ගෘහීය මට්ටමේ ගැටුම්

  එකම ගෘහයේ සාමාජිකයන් අතර, එනම් සහෝදරයන්, ස්වාමියා සහ බිරිඳ අතර, වැඩිහිටියෙකු සහ නිවසේ තරුණ සාමාජිකයෙකු අතර ඇතිවන ගැටුම් මෙයට ඇතුළත් වේ.




- අභ්‍යන්තර ප්‍රජා මට්ටමේ ගැටුම්

  එකම ප්‍රජාවේ සාමාජිකයන් අතර ඇතිවන ගැටුම් මෙමඟින් ආවරණය කරයි.

- අන්තර් ප්‍රජා මට්ටමේ ගැටුම්

  ප්‍රජාවන් දෙකක් අතර හෝ වෙන් වූ ප්‍රජාවන් දෙකක් අතර ඇතිවන ගැටුම් මෙම මට්ටමේ ගැටුම්වලට ඇතුළත් වේ.

- ප්‍රාදේශීය මට්ටමේ ගැටුම්

  ප්‍රජාවන් අතර හා ප්‍රාදේශීය මට්ටමේ පාලනයන් හෝ අනෙකුත් ප්‍රාදේශීය ආයතනයන් අතර ඇතිවන ගැටුම් මෙයට අන්තර්ගත වේ.

- ජාතික මට්ටමේ ගැටුම්

  ජාතික සම්පත් භාවිතකිරීම සඳහා බලපෑම් කරන ජාතික ප්‍රතිපත්තිවල ප්‍රතිඵල ලෙස මෙම ගැටුම් ඇති වියහැක.

- ජාත්‍යන්තර මට්ටමේ ගැටුම්

  සංක්‍රමණ, වෙළඳාම් තහනම් කිරීම් සහ නීත්‍යානුකූලක්‍රියාවල ප්‍රතිඵල ලෙස මෙන්ම ඇතැම් සම්පත් පදනම් කරගනිමින් ජාත්‍යන්තර අවධානය යොමුවීමෙන් ඇතිවන ගැටුම් මෙම වර්ගයට ඇතුළත් වේ.

- කාලය මත පදනම් වූ ගැටුම් ප්‍රභේද

  දෘෂ්‍ය නොවන ගැටුම්: මතුපිටට යටින්; නිරන්තරයෙන් නොපෙනෙන මට්ටමේ; වෙනස්කම් පැවතුන නමුත්, පාර්ශවයන් ක්‍රියාකරන්නේ හෝ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්න පිළිබඳව මේ වන තෙක් තීරණය කර නොමැත.

  මතුවෙමින් පවතින ගැටුම්: හදිසියේ පැනනැගුණ දැඩි ගැටුම්කාරිත්වයන් ක්‍ෂණයෙන් ඇති වී විහිදී ගිය ද, පද්ධතිමය වශයෙන් හෝ ක්‍ෂණිකව පාර්ශවයන් අභිබවා කවුරුන් හෝ සම්බන්ධවීමක් මෙහි දී සිදු නොවේ.

  දෘශ්‍ය වන ගැටුම්: ක්‍රියාකාරී මට්ටමේ පවතින ආරවුල් වේ. ජනතාව, තම ආශාවන්ට තර්ජනයක් වූ තත්ත්වයන්ට එරෙහිව කටයුතු කරන්නේ කෙසේද යන්න සහ ක්‍රියා කළයුතු ක්‍රමය තෝරාගැනීම පිළිබඳ තීරණයක් ගැනීම මෙහෙදී සිදු වේ.

## ගැටුම්වලට හේතු සහ මුලාශ්‍ර



ආශා මූලික ගැටුම්: ජනතාව ඔවුන්ගේ අවශ්‍යතා ලබාගැනීම හෝ ආරක්ෂා කරගැනීම හා සම්බන්ධයෙන් ඇතිවන ක්‍රියාවන් හා හැඟීම්වලට අදාළ ගැටුම් මීට අදාළ වේ.

තොරතුරු හා සම්බන්ධ ගැටුම්: තොරතුරු අවමවීම හෝ එකම තොරතුර වෙනස්වීම හේතුවෙන් ඇතිවන ගැටුම්.

සබඳතාවලට අදාළ ගැටුම්: පෞරුෂයේ සහ හැඟීම්වල මෙන්ම වැරදි දෘෂ්ටිවාදයන්, මුල්බැසගත් අදහස් සහ පූර්ව විනිශ්චයන් හි පවතින වෙනස්කම් නිසා ඇතිවන ගැටුම්.

ව්‍යුහාත්මක ගැටුම්: ක්‍රියාවලි, නීති සහ බලය ආදිය කාලය සහ අවකාශය එනම්, ඉඩම් මායිම්, බඩු

බෙදීයාම හෝ සම්පත් භාවිතය පිළිබඳ ගැටළු ආදිය පාලනය කිරීමට යාමෙන් ඇතිවන අදහස්වල වෙනස්කම් හේතුවෙන් ඉස්මතු වන ගැටුම්.

අගයකිරීම් පිළිබඳ ගැටුම්: සංස්කෘතිය, සමාජීය හෝ පුද්ගලික විශ්වාසයන් හෝ විවිධ ලෝක දර්ශනයන් සහ සම්ප්‍රදායන් අතර ඇතිවන සම්මතයන්.

## මාතෘකා මූලික ගැටුම් ප්‍රභේද

**ප්‍රවේශයක් නොලැබීමෙන් ඇතිවන ගැටුම්:** ප්‍රවේශයන්ගේ වෙනසක් හෝ විෂම ප්‍රවේශයන්වල ප්‍රතිඵල වශයෙන් ඇතිවන ගැටුම් මෙයට ඇතුළත් වේ.

**සම්පත්වල ගුණාත්මක බව ලබාගැනීමේ හැකියාව වෙනස්වීම නිසා ඇතිවන ගැටුම්:** විවිධ පාර්ශවයන්වලට ලබාගත හැකි සම්පත් 'ප්‍රමාණය' හෝ එහි ගුණාත්මකභාවය වෙනස්වීම මෙවැනි ගැටුම් ඇතිවීමට හේතු වේ.

**සම්පත් සම්බන්ධයෙන් ඇතිවන අධිකාරිමය වශයෙන් ඇතිවන ගැටුම්:** සම්පත් සම්බන්ධයෙන් අධිකාරිමය තීරණගන්නා පාර්ශවයන් නිසා මූලික අවස්ථාවේ ඇතිවන ගැටුම්.

**භාවිතයට ගත් සහ නොගත් ආර්ථික වටිනාකම් අතර වෙනස්කම් ඇතිවීමේ ප්‍රතිඵල ලෙස ඇතිවන ගැටුම්:** සම්පත් සමඟ මෙන්ම සංස්කෘතික ජනවාර්ගික හෝ ආගමික වටිනාකම්වල වෙනස්කම් ආශ්‍රිත ගැටුම්.

**තොරතුරු සැකසීම හා ලබාගත හැකිවීම ආශ්‍රිත ගැටුම්:** විවිධ ආයතන තුළ ඇති විවිධ ආශාවන්වල ප්‍රතිඵල ලෙස මෙම ගැටුම් ඇතිවිය හැක.

## ගැටුම් දෛනික ජීවිතය තුළ ඇතිවිය හැක.



- ඔබගේ ඉඩම් අතර සීමාවන් පදනම් කරගෙන ඔබ සහ ඔබගේ අසල්වැසියා අතර ආරවුලක් මතුවිය හැක. ඔබ කරන්නේ කුමක්ද?
- පුද්ගලයෙක් ඔබ සමඟ ඇති කරගත් ව්‍යාපාර කොන්ත්‍රාත්තුව පිළිබඳ ගිවිසුම උල්ලංඝණය කළහොත්, ඔබට කළ හැක්කේ කුමක්ද?
- රාජ්‍ය නිලධාරියෙක්, ඔබගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කළහොත් ඔබට කළහැක්කේ කුමක්ද?
- පුද්ගලයෙකු, ඝාතනයක් කළ බවට චෝදනා ලබා, අත්අඩංගුවට ගතහොත් ඔහු/ඇයගේ නිවැරදි බව තීරණය කිරීමට රජය කළ යුත්තේ කුමක්ද?

## ගැටුම් හැසිරවීමේ ක්‍රමයන්ට අදාළ මානයන්





කෙනත් තෝමස් (Kenneth Thomas) ගේ, Conflict & Negotiation Processes in Organisations යන ග්‍රන්ථයෙ හි මානයන් දෙකක් භාවිතයෙන් ගැටුමක් හැසිරවීමේ ක්‍රම පහක් ඇතුළත් ආකෘතියක් සංවර්ධනය කර ඇත.


1. සහයෝගීතාවය (Cooperativeness) - එක් පාර්ශවයක් විසින් ගැටුමට සම්බන්ධ වී සිටින අනෙක් පාර්ශවයේ අවශ්‍යතා හෝ උවමනාවන් තෘප්ත කිරීමට කටයුතු කිරීම මෙහි දී සිදු වේ.
2. ස්ථිරසාර බව (Assertiveness) - එක් පාර්ශවයක් විසින් ඔහුගේ හෝ ඇයගේ පුද්ගලික අවශ්‍යතාවයන් හෝ උවමනාවන් තෘප්තිමත් කිරීමට උත්සාහ කිරීමේ ප්‍රමාණය මින් අදහස් වේ.

## ගැටුමක් විසඳීමට භාවිත කළ හැකි ගැටුම් හැසිරවීමේ ක්‍රමයන් පහ




- තරඟකාරිත්වය (Competing)
- සහයෝගයෙන් කටයුතු කිරීම (Collaborating)
- සම්මුතියකට එළඹීම - ගැටුම් පාර්ශවය විසින් කැපකිරීම් කිරීම (Compromising)
- මගහැරීම (Avoiding)
- අන්‍ය මතයන්ට ඉඩ ලබාදීම (Accommodating)

පහත දැක්වෙන රූප සටහන මඟින් සහයෝගීතාවය සහ ස්ථිරසාරබව යන මානයන් තුළ ගැටුම් හැසිරවීමේ ක්‍රම ස්ථානගතව ඇත්තේ කෙසේ ද යන්න පිළිබඳව විස්තර කරයි. එය ක්‍රමානුකූලව විශ්ලේෂණය කරන්න. නිදර්ශන ලෙස, සහයෝගීතාවයේ මානය තුළ අන්‍ය මතයන්ට ඉඩ ලබාදීමේ ගැටුම් හැසිරවීමේ ක්‍රමය නිසිලෙස ක්‍රියාත්මකවේ ද යන්න විමසා බැලීම.



## ගැටුම් නිරාකරණය

විරුද්ධ පාර්ශවයේ අනුකූල නොවන ආශාවන් හෝ ප්‍රාර්ථනාවන් සකස් කිරීමට හෝ සංසිඳවීමට සහ ඔවුන්ගේ කැමැත්ත සහ අවශ්‍යතාවයන් තෘප්තිමත් කිරීමේ පටිපාටියක් යොදාගැනීම මින් අදහස් වේ. එය ස්වභාවයෙන්ම සහයෝගීතාවයෙන් සිදුවිය හැකි අතර සමථකරණය හෝ මැදිහත්කරණය; තෙවන පාර්ශවීය තීරණ ගන්නෙක් සම්බන්ධවීම එනම් විනිශ්චයකරුවෙක් හෝ බලහත්කාරයෙන් සිදුකරන මානසික පීඩනයක් හෝ කායික පීඩනයක් උපයෝගී කරගැනීම ආදිය යි. ගැටුම් නිරාකරණය මඟින් සෘජුව අවධානය යොමු කරනුයේ, වෙන් වූ හෝ ආකෘතිකමය ගැටළු නිරාකරණය කිරීමට සහ/හෝ පවතින සබඳතා ප්‍රතිෂ්ඨාපනය, සංහිඳියාව හෝ නැවත නිර්වචනය කිරීමට; හෝ නව සබඳතා පිහිටුවීමට ය.

## ගැටුම් විසඳීමේ ක්‍රියාවලිය

### සමථකරණය (Negotiation)

සමථකරණය (Negotiation) යනු ගැටුම් විසඳීමේ ක්‍රියාවලියක් වන අතර, එමඟින් පුද්ගලයන් දෙදෙනෙක් හෝ වැඩි පිරිසක් සංජානනමය හෝ තත්‍ය තරඟකාරී මතයන් හෝ ආශාවන් සහ/හෝ ආරවුල් සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් ඔවුන්ගේ වෙනස්කම් පිළිබඳ සාකච්ඡාකොට, ඒ සම්බන්ධයෙන් එක්ව කටයුතු කර අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා තෘප්තිමත් වන ආකාරයේ ගිවිසුම් හෝ විසඳුම් සංවර්ධනය කිරීම සිදු වේ.



### මැදිහත්කරණය (Mediation)




මැදිහත්කරණය (Mediation) යනු ස්වේච්ඡා ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් වන අතර, ගැටුම්වලට මැදි වී සිටින පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ඒවා සමථයකට පත්කරගැනීමට සහ ඔවුන්ගේ වෙනස්කම් විසඳාගැනීමට හැකි පරිදි අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි ගිවිසුම් ඇති කරගැනීමට උපකාර කිරීම මෙහි දී සිදු වේ. එසේම, ආරවුල්කරුවන්ට (ගැටුමට අදාළ පාර්ශවයන්) ඔවුන්ගේ ආකල්ප ප්‍රතිෂ්ඨාපනයට, නැවත විමසාබැලීමට හෝ පරිණාමයට සහ අන්‍යයන් ඉදිරියේ අන්තර් ක්‍රියා පැවැත්වීම සහ වඩා සාමකාමී මෙන්ම සංහිඳියාමය අවස්ථාවකට පැමිණීමට ඔවුන්ට සහායවීම මෙහි දී සිදු වේ.

## තීරකීකරණය / බේරුම්කරණය (Arbitration)

තීරකීකරණය (Arbitration) යනු ස්වේච්ඡා ගැටුම් නිරාකරණ ක්‍රියාවලියක් වන අතර එමඟින් ගැටුම් ඇතිවීමට හේතු වූ ගැටළු අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත් තෙවැනි පාර්ශවයක් ඉදිරියට ගෙනඒම සිදුවන අතර අදාළ ගැටුම නිරාකරණය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඔහු හෝ ඇයගෙන් ඉල්ලීමක් සිදුකිරීම මෙහි දී සිදු වේ. තීරකීකරණය, පාර්ශවයන්ගේ ආශාවන් මත පදනම්ව විටෙක උපදේශනය සහ නොබැඳුන හෝ බැඳුන තත්ත්වයන් මත සිදුවිය හැක. කෙසේවෙතත්, මෙහි දී ප්‍රතිඵලවල අනුකූල බව පදනම් වනුයේ බේරුම්කරු විසින් ස්වේච්චාවෙන් සහ බලාත්මක නොකළ අයුරින් සිදුකළ විට ය. මෙය ක්‍රියාත්මක කිරීමේ දී, තීරණය සමඟ අනුකූලවීමට පාර්ශවයන් හි කැපකිරීම සහ සහයෝගිතාවය අවශ්‍ය වේග

## පරිපාලනයේ සාධාරණත්වය (Administrative Justice)



පරිපාලනයේ සාධාරණත්වය (Administrative Justice) යටතේ ගැටුම හා සම්බන්ධිත ජනතාව, ඔවුන්ගේ පැමිණිලි, හිමිකම් හෝ ආරවුල් ආදිය නිලධාරියෙක්ට, ඒජන්සියකට, ආයතනයකට හෝ ව්‍යවස්ථාදායකය විසින් පිහිට වූ ව්‍යවස්ථාපිත අධිකාරියකට ඉදිරිපත් කිරීම මෙහි දී සිදු වේ. අදාළ නිල ඒජන්සිය සඳහා එහි අධිකාරිමය හෝ අධිකරණ බලය තුළ සිට මෙම ගැටළු සම්බන්ධයෙන් තීරණ ගැනීමට අධිකරණ බලය පවරා තිබේ. පුද්ගලයා හෝ ඒජන්සිය, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලතලයන් යන ද්විත්වයටම අයත් වියහැක. හිටපු පුද්ගලයා පළමුව, රෙගුලාසි නිකුත්කිරීමට ඒජන්සියට අධිකාරිත්වය ලබාදෙන අතර, දෙවනුව සවන්දීමට සහ සිද්ධීන් විසඳීමට අවස්ථාව ලබා දේ. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම මෙවැනි අවස්ථාවන්ට නිදර්ශනයක් ලෙස දැක්වීය හැකිය.

## විනිශ්චයකිරීම (Adjudication)

විනිශ්චයකිරීම (Adjudication) යනු ගැටුම් නිරාකරණ ක්‍රියාවලියේ අංගයක් වන අතර එහිදී, විනිශ්චයකරු හෝ නීතිඥයා විරුද්ධ පාර්ශවයන්ගේ නීතිඥයන් විසින් සපයනු ලබන සාක්ෂි, තර්කනයන් සහ නීතිමය තර්කනයන් වෙත සවන්දීම සහ සමාලෝචනය කිරීම් සිදුකරන අතර (පැමිණිලිකරු/විත්තිකරු හෝ ආරක්ෂාව සහ නඩු පැවරීම) ගැටුමට සම්බන්ධිත පාර්ශවයන්ගේ අයිතීන් හා වගකීම් මත බැඳුනු තීරණයක් ගැනීම සිදුකරයි. මෙම ක්‍රියාවලිය විධිමත්, තීරණාත්මක බැඳීමක් සහ ප්‍රතිඵල අනිවාර්ය සහ බලාත්මක කළ හැකි වූවකි.

## බහුත්වවාදය, ගැටුම් නිරාකරණය සහ සාධනීය සාමය

සාමය ගොඩනැගීමේ කේන්ද්‍රීය කාර්ය්‍යය වනුයේ සාධනීය සාමයක් නිර්මාණය කිරීම වන අතර එහිදී සමාජ පරිසරයක් තුළ නව ආරවුල්, ප්‍රචණ්ඩත්වය සහ යුද්ධයක් වැනි තීව්‍ර මට්ටමකට පත්කිරීම සිදු නොවේ. සාමය ගොඩනැගීමේ මුලපිරීම් මඟින් උත්සාහ කරනුයේ, ගැටුමට හේතු වූ ප්‍රධාන ප්‍රශ්න නිවැරදි කිරීමට සහ ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ අන්තර්ක්‍රියා රටාවන් වෙනස් කිරීමට යි.

තිරසර සාමයක ලක්ෂණ වන්නේ, ස්වයං-තිරසාර බව, ශාරීරික සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය නොමැතිවීම සහ වෙනස්කම්කොට සැළකීම මුලිනුපුටා දැමීම යි.

බහුත්වවාදය, පිළිගැනීම සහ ඒ සමඟ ගනුදෙනු කිරීම සාධනීය සාමයක් ගොඩනැගීමේ දී අත්‍යාවශ්‍ය වේ. ඊට අමතරව, දෛනික ජීවිතය තුළ ගැටුම් නිරාකරණය භාවිත කිරීම, සමාජයක් වඩාත් සාමකාමී කිරීමට උපකාරී වේ.